සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2559ක් වූ බිනර මස (ව්‍යවහාරික වර්ෂ 2015 සැප්තැම්බර්)

48 වෙනි කලාපය




රු. 20/-

සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය

# දුක්පත්කමත්

## වලිගය නැති ගොනා වැනී...



දුක්පත් ලෙසට ලොව සම්මත කතා  බහේ
දැක්මකි මිල මුදල් සම්පත් තකා  නැහේ
මොක් සුව ගෙනෙන නැණ දම් නැති සතා  ඉහේ
දුක්පත් වෙමැයි තිබුණත් මොන ධනේ  කොහේ

වලිගය නැති ගොනා හට හව් හරණ  නැතී
නලියයි නොයෙක් උවදුරු එන විටදී  නිතී
එළියක් නැතොත් නැණ නුවණින් එලෙස  වෙතී
බිලි වෙයි මරුට එය දුක්පත් කමකි  ඇතී

එකම කරුණ දුක්පත් ලෙස මුදල  ගැනේ
දැකල නෙවෙයි පදරුත් ඉන් කියන  තැනේ
එකල හේතු එල අනුවම එහෙම  වුනේ
දුකට පත් සතට පිහිටකි දහමෙ  ගුණේ

හොඳම පොහොසතුන් ලොව ඇති විඳින  සුවේ
අඳම වෙමැයි දුක්පත් නම් දහම  ලොවේ
එදම ඇසෙන කලකදී මහ දුකම  ගෙවේ
අදම පොහොසතෙකි නිවනින් ලැබුව  හවේ

පොහොසත් වෙනම් දහමින් මුදලද  නැතුවත්
බොහොමත් හොඳයි සුගතියමය නොම  පැතුවත්
මොහොතක් ලැබෙන කල ලොව තතු ගැන  සිතුවත්
කොහොමත් ගොඩය ලද තැන නිවනම  මතුවත්

දුන්නද කොතෙක් මිල මුදලද ධනය  නෙක
ඉන් එන පොහොසතම ගෙවුනම ගෙනෙති  දුක
තුන් ලොව දෙව් බඹුන් හිටියත් කෙලෙස  රැක
සුන් වෙත දිනක නැත පොහොසත් දහම  දැක


ලොව අලවනා කිසිවක් නැති විටදී  එන
බව දුක්පත් නැතිය පොහොසත් මිසක  වන
සුව නම් මනසමය කය නොව හැඳින  ගෙන
නොවසන් පොහොසතෙකු ලෙස නැති විටදී  නැණ

දැන්වත් වටහ ගෙන දුක්පත් කමෙහි  තතු
බුන්වත් කමට බැට දෙනු දීගු සසර  එතු
පින්වත්කමින් වැඩ ගෙන ඇති ලෙසට  පැතු
මින් පසු නොකියවව් දුක්පත් විලස  ගතු



පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

# ගෙදර උදවියත් දහම් මගට ගන්න බැරිද...?



අද දහම් මගට යම් කිසි ආකාරයකින් යොමු වෙච්ච හුග දෙනෙකුට තියෙන ප්‍රශ්නයක් තමයි මේ. ලෝකයේ අති දුර්ලභව පහළ වෙන්නා වූ ශ්‍රී සද්ධර්මය මේ වෙන කොට යම් යම් විපරීතයන්ට ලක් වෙලා තිබුණත්, ඉඳල හිටල ඇහෙන බණ පදයක තියෙන දහම් රස තමන්ටත් යම් පමණකින් හරි වැටහිලා වටිනාකම අවබෝධ වෙච්ච කෙනෙක් ඉන්නව නම්, ඒ පුද්ගලයා ඊළඟට උත්සාහ කරන්නෙ තමන්ගෙ ගෙදර ළඟින්ම ඉන්න ඥාති හිතමිත්‍රාදීන්ටත් ඒ බණ පදයක් අහන්න සලස්වන්න, ඒ අයත් ඒ මාර්ගයට යොමු කරන්න. ඒක සාමාන්‍යයෙන් ස්වභාවයක්. හැබැයි ඉතින් ගෙදර උදවිය නෙවෙයි, මේ ලෝකෙ ඉන්න කවුරුවත් අපට ඕන විදිහට දහම් මගට ගන්න බෑ. ලෞකිකව වටින මොනව හරි දෙයක් තියෙයි කිව්ව නම්, බොහොම පහසුවෙන් කිව්ව සැණින් වැළ නොකැඩී ඒ පසු පස්සෙ දුවනවා. නමුත් බණක් අහන්න එහෙම යන්නෙ නෑ. මොකද මේ නිවන් දකින දහම කියන්නෙ, සසර විශේෂ හේතු වාසනා නැත්නම් එහෙම ආවට ගියාට, අපි කැමති වුනාට දෙන්න පුළුවන් දෙයක් නෙවෙයි. එතකොට එක් එක්කෙනාට ධර්මය ගන්න නම් නැණ නුවණින් යමක් හිතන්න මොළයක් තියෙන්න ඕන. ඒ නිසා බුදුන් වහන්සේ හැම කෙනෙකුටම ධර්ම දේශනා කරන්න ගියේ නෑ, හේතු වාසනා තියෙන අයට ඒ අවස්ථාව සලසල දුන්නා.

උදාහරණයකින් පැහැදිලි කරනව නම් පොදු ළිඳක වතුර පිරිල තියෙනවා. පිපාසයට බොන්න භාජනත් තියෙනවා. ඕන කෙනෙකුට ගිහින් වතුර බොන්න බාධාවක් නෑ. කවුරුවත් ළිඳ අල්ල ගෙනත් නෑ. භාජන අල්ල ගෙනත් නෑ. එපා කියලත් නෑ. තහනම් කරලත් නෑ. තමන්ට ඕන නම් ගිහින් වතුර බොන්න පුළුවන්. ඒත් අපි බිව්වට අනිත් අය බොන්නෙ නැත්නම් අපි මොනව කරන්නද ? කටේ ගැහුවත් තුහ් කියල අහක දානව නම් අපිට කරන්න දෙයක් නෑ.

ඒ වගේ සමහර අය ඉන්නවා, අපි කොච්චර උත්සාහ කළත් ධර්මයට නැඹුරු කරන්න ඕන කියල, ඒක තීරණය වෙන්නෙ සසරෙ ආපු ගමන අනුව, ඒ එද්දි වඩපු ගති ලක්ෂණ අනුව. අපි සසර ගමන ගෙනාපු විදිහ, වඩපු ගති ලක්ෂණ අපේ චර්යාවක්. නමුත් එක ගෙදර හිටිය කියල ගෙදර අනික් උදවියගෙ චර්යාවත් ඒකම වෙන්නෙ නෑ. අපි එකතු වෙලා ඉන්න නෑදෑයො පිරිස් ඒ එකම චර්යාවෙ අය නොවෙන්න පුළුවන්. මොකද සසර ගමනෙ එකතුව කියන්නෙ අවිද්‍යා තණ්හා ක්‍රියාවලියෙ ප්‍රතිඵලයක්. නමුත් අපි සසර ගමන එන කොට, ඒ ඒ ගති ලක්ෂණ වඩා ගෙන එන ගමන් අපේ මව්පියො නිසා, සහෝදර සහෝදරියො නිසා, ස්වාමි පුරුෂයා භාර්යාව නිසා, එහෙම නැත්නම් දූ දරුවො නිසා, ඒ අය මොන නරක වැඩේ කළත් අපිට ඒ අයව අත් හරින්න බැරි වෙන්න පුළුවන්. මොකද අර බැඳීම නිසා. ආර්ය මාර්ගයේ මුල ආරම්භ කළාට, ''ඒ වුනත් ඉතින් මගේ එකානෙ, අපේ එවුන්නෙ'' කියන හැඟීම නැති වෙන්නෙ නෑ.

ඉතින් කෙනෙකුට මීට පෙර අත්බැව්වල පටන් සෑහෙන කාලයක ඉඳල බෞද්ධත්වයට නැඹුරු වෙලා ආපු ගති ලක්ෂණයක් නිසා, අපි මේ බණ අහන්න ඕන, මේ දහම අවබෝධ කර ගන්න ඕන, මේ මග අනුගමනය කරන්න ඕන කියල හැඟීමක් එනවා. ඒ වගේ දෙවනුව, අනේ මේ අපේ පවුල්වල අයටත් මේ දහම දෙන්න ඕන කියල හැඟීමක් එනවා. නමුත් අපට එකතු වෙච්ච පවුල්වල ඉන්න නෑදෑ හිතවතුන්ට ඒ දහමට එකතු වෙන්න හේතු වාසනා නැති වෙන්න පුළුවන්. ඒත් මොනව කරන්නද ඉතින් වැරදි කළත්, හේතු වාසනා නැති වුනත් අපේ එවුන්නෙ කියල සම්බන්ධයක්, හැඟීමක් එනවා. ඒ සම්බන්ධය නිසා නැවත වතාවක් මතු අත්බැව්වලත් අම්ම, තාත්ත, සහෝදර සහෝදරියො, දුව පුතා හෝ ස්වාමි පුරුෂයා භාර්යාව වෙලා හරි ළඟට එනවා. එහෙම අය එකතු වෙලා තමයි මේ පවුලක් හැදෙන්නෙ. එහෙම නැතිව බුදු ගුණ නිසාවත්, සාසන ගුණයක් නිසාවත් නෙවෙයි. ලෝකයට ඇළුම් කරපු යම් කිසි බැඳීමක් නිසා තමයි පවුලක් හැදෙන්නෙ. එතනදි සහෝදර ප්‍රේමය, මවු පිය බැඳීම, නෑදෑ උරුමය .... ආදී වශයෙන් බැඳිල බලාපොරොත්තු ඇති වෙනවා. ඒ බැඳීම නිසා තමයි මේ විවිධ පිරිස් එක පවුලක් විදිහට එකතු වෙලා ඉන්නෙ.

හැබැයි ඔය අතර සසරෙ පුරුදු පුහුණු කරපු පිං කුසල් තියෙන අයත් ඉන්න පුළුවන්, එහෙම නැති අයත් ඉන්න පුළුවන්. එතකොට පවුලෙ එක්කෙනෙක් දෙන්නෙක් බෞද්ධත්වයට කැමති වෙලා, අනිත් අය අකමැති වෙන්න පුළුවන්. ඉතින් කැමති කෙනා ඒ දහමෙ වටිනාකම දැකල, කොහොම හරි පවුලෙ අනිත් අයටත් ඒ දහම දෙන්න උත්සාහ කරනවා. නමුත් ඒ අය ඒකට අකමැති වුනොත් ඊටත් ☞

වඩා භයානක වෙන්න පුළුවන්. මොකද බැනල අපවාද කර ගත්තොත් එහෙම ඒ අයට තව තවත් අපාගත වෙන්න සිද්ධ වෙන්න පුළුවන්. එහෙම නැත්නම් සුගතියක් ලැබුවත්, දහමට කරපු අපවාදය නිසා ඒකෙ කර්ම විපාකයක් වශයෙන් ලොවුතුරා බුදුන් වහන්සේ පහළ වෙලා බණ කිව්වත් තේරුම් ගන්න හේතු නැතිව යන්න පුළුවන්. සසර තවත් දික් වෙන්න පුළුවන්. ඒ නිසා ඒ අයට මග පාදා දෙන එක විතරයි කරන්න ඕන. හැම කෙනාටම ඒ අවස්ථාව දෙන්න යනවයි කියන්නෙ හරි අනාථ වැඩක්. හොඳ දෙයක් පෙන්වන්න පුළුවන්, ආදර්ශමත්ව ජීවත් වෙන්න පුළුවන්. නමුත් බලහත්කාරයෙන් දහම දෙන්න බෑ. එහෙම බලහත්කාරයෙන් දෙන්න යන කොට මේ කාරණයත් සිහි කරන්න ඕන.

බුදුන් වහන්සේ අල්ලපු වැටේ හිටපු චුන්දසූකරට බණ කියන්න ගියේ නෑ. මොකද උන් වහන්සේ බණ කියන්න ගියා නම් ඔහු ධර්මයටයි, උන් වහන්සේටයි අපවාද කරල අට මහ නිරයට යනවා. මොකද ඔහු ධර්මය පිළිගන්න කෙනෙක් නෙවෙයි. චුන්දසූකර ඌරෝ මර මරා ඉඳල ඒකෙ පාපයට අන්තිමට ඔසුපත් නරකයක ගිහින් ඉපදුණා. නමුත් බුදුන් වහන්සේ ඔහුට අවවාද කරන්න, ධර්ම දේශනා කරන්න ගියා නම්, උන් වහන්සේටයි ධර්මයටයි බැනල තවත් පහළින් තියෙන අට මහ නිරයට යනවා. ඉතින් අට මහ නිරයට වඩා ඔසුපත් නිරයේ පොඩ්ඩක් හරි සහනයක් තියෙනවා. ඒ නිසා චුන්දසූකර කෙරෙහි අනුකම්පාවෙන්මයි බුදුන් වහන්සේ ඔහුට බණ කියන්න ගියේ නැත්තෙ.

ඒ වගේ සමහර විට තමන්ගෙ ගෙවල්වල උදවිය අතරත් ධර්මයට දොස් කියල මහ අපාගත වෙන්න හේතු තියෙන අය ඉන්න පුළුවන්. ඒ කාරණය අදටත් ප්‍රායෝගිකව දකින්න තියෙන දෙයක්. සමහරු තමන් නෙවෙයි, අනෙක් කෙනා බණක් අහන්න යනවටත් කැමති නෑ. ඒකටත් විවිධ බාධා කිරීම් කරනවා, දොස් කියනවා. යම් කිසි විදිහකින් බලහත්කාරයෙන් හරි යමු බලන්න කියල ගියොත්, ඒ පන්සලේ හෝ ස්වාමීන් වහන්සේගේ හෝ මොනව හරි අඩු පාඩුවක් අල්ල ගෙන විවේචනය කරනවා, දොස් කියනවා. එහෙම නැත්නම් තමන්ට ගෝචර නොවන, තමන් පිළි නොගන්න ඒ දහම් දේශනාවෙ මොනව හරි කොටසක් අල්ල ගෙන විවේචනය කරනවා. මොකද ඒක තේරුම් ගන්න තරම් නැණ නුවණක්, හේතු වාසනාවක් නැති නිසා.

දැන් ඉතින් මොකද වෙන්නෙ, තමන්ගෙ කෙනා කියල හොඳක් කරන්න ගිහින් අන්තිමට යන්න තියෙන තැනත් වහ ගන්නවා. ඒ නිසා බණ කියන කොට, දහමට යොමු කරන කොට, ඒ වගේ අය ගැන සැලකිලිමත් වෙන්න ඕන. ඒ අයට ඇසුරු කරන්න විතරක් මග පාදල දෙන්න ඕන. ගැඹුරට දහමක් කියල දෙන්න බැරි කෙනාට, කිව්වට තේරුම් ගන්නෙ නැති කෙනාට ඒ සඳහා උත්සාහ කරන්න හොඳ නෑ. අපිට ඒ අය වෙනුවෙන් කරන්න තියෙන උදව්ව තමයි, මල් වට්ටියකට අත ගහන්න කැමතිද, පහනක් පත්තු කරන්න කැමතිද, දාන මානයකට සහභාගි වෙන්න කැමතිද කියල අහල, පුළුවන් නම් ඒ වගේ දෙයක්වත් කරන්න කියල, ඒකෙන්වත් සෑහීමට පත් වෙන එක. එහෙම දේකටවත් නැඹුරු වෙන්නෙ නැත්නම්, කවද හරි මේ මාර්ගයට යොමු වෙන්න හේතු වාසනා ලැබේවා කියල, ඔය තමන් කර ගෙන ඉන්න සමාජ සේවා වැඩක් හරි මොනව හරි ලෞකික යහපත් දෙයක් කර ගෙන පාඩුවෙ ඉන්න දෙන එකයි කරන්න තියෙන්නෙ. එහෙම නැතිව දහම දෙන්න බලෙන් ඇද ගෙන යන්න හොඳ නෑ. එතකොට අකමැත්තෙන් තමයි යන්නෙ.

දහම කියන්නෙ තමා විසින්ම කැමැත්තෙන් යා යුතු මාධ්‍යයක් මිසක් අනිත් කෙනා කියන නිසා බලහත්කාරයෙන් යන මාධ්‍යයක් නෙවෙයි. ඒ නිසා ඒ කාරණය විශේෂයෙන් තේරුම් ගන්න ඕන. මොකද අනික් අයගෙ තත්ත්වය දැන ගැනීමේ හැකියාවක් අපට නෑ. ඒ හැකියාව යම් තරමකට හරි තියෙන අය ලෝකයේ ඉන්නවා. හැබැයි බොහොම අඩුයි. ඒ කියන්නෙ අනාගාමී ඵලයෙන් එහාටවත් ගියා නම්, සිවුපිළිසිඹියාපත් ඥාන වැඩිල තියේ නම් තමයි සාමාන්‍ය කෙනෙක්ගෙ මානසිකත්වය පිළිබඳ යම් කිසි හැඟීමක් හරි එන්නෙ, මේ පුද්ගලයගෙ මානසිකත්වය තුළ මෙහෙම දෙයක් තියෙනවා කියල. ඒත් සම්පූර්ණයෙන් නෙවෙයි, එක්තරා හැඟීමක්.

උදාහරණයක් විදිහට ගෞතම බුදුන් වහන්සේගෙ පෙර මනුස්ස අත්බවය තමයි ජෝතිපාල මානවකයා කියන්නෙ. එදා උන් වහන්සේගෙ හොඳම යාළුවා තමයි ඝටීකාර කියන කුඹල්කරුවා. ඔහු එදා වැඩ හිටපු කාශ්‍යප බුදුන් වහන්සේගෙන් බණ අහල අනාගාමී ඵලයට පත් වෙලා හිටියෙ. ඒ වගේම බොහොම තීක්ෂණ නැණ නුවණක් තිබ්බ්ච කෙනෙක්. ඉතින් තමන්ගෙ හොඳම යාළුවා වන ජෝතිපාල මානවකයටත් කිව්වා, මෙහෙම ලොව්තුරා බුදු කෙනෙක් පහළ වෙලා ඉන්නවා, යමු බණ පදයක් අහන්න කියල. නමුත් එදා ඒ බෝසතාණන් වහන්සේ ඒකට දීපු උත්තරය මොකක්ද ? ඔය මුඩු මහණට මොන බුදු බවද ඇහුවා. දැන් මේ කාශ්‍යප බුදුන් වහන්සේගෙන් පස්සෙ ඊළඟට බුදු වෙන්න ඉන්න මහ බෝසතාණන් වහන්සේ තමයි මෙහෙම කිව්වෙ. ඔය විදිහට මේ ඝටීකාර, තමන්ගෙ යාළුවා කාශ්‍යප බුදුන් වහන්සේ ළඟට ගෙනියන්න හය වතාවක් උත්සාහ කළා. ඒත් හය වතාවෙම, ඔය මුඩු මහණට මොන බුදු බවද කියල ඇහුවා. අන්තිමට ඒ හය වෙනි වතාවෙදි ඝටීකාර ඔහුගෙ කෙස් වැටියෙන් අල්ල ගෙන බුදුන් වහන්සේ ළඟට ඇද ගෙන ගියාට පස්සෙ තමයි කාශ්‍යප බුදුන් වහන්සේ විවරණ දුන්නෙ, මේ මගෙන් පස්සෙ ගෞතම නමින් බුදු වෙන්න ඉන්න කෙනා කියල. ඉතින් හය වතාවක් ඔය මුඩු මහණට මොන බුදු බවද කියල කර ගත්ත අපවාදයට ඒ අවස්ථාවෙදි කමා කර ගෙන සාසනයේ පැවිදි වෙලත්, උන් වහන්සේට බුදු වන අත්බවයේ ඒක විපාකයක් විදිහට ආවා. ඒ තමයි හය වතාවක් කරපු අපවාදයට, බුදු වෙන්න හය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කරන්න සිද්ධ වීම. ඉතින් මහ බෝසතාණන් වහන්සේ නමකටත් එහෙම වුනා නම් අනෙක් අය ගැන කවර කතාද ?

එතකොට ඒ වගේ විශේෂ නැණ නුවණක් තියෙන අයට පුළුවන් යම් කිසි මෙහෙයවීමක් කරන්න. නමුත් ඒක අනික් අයට කරන්න බෑ. ඒ නිසා තමන් සාමාන්‍ය මට්ටමක ඉඳගෙන තමන්ගෙ ඥාතීන් වුනත් මෙහෙය වන්න යන්න හොඳ නෑ. පුළුවන් තරම් ආදර්ශමත්ව තමන්ගෙ වැඩේ කර ගන්න බලන්න ඕන. අනික් අයත් එනව නම් විතරක් ඒ සඳහා මග පාදා දෙන්න ඕන. එහෙම නැතිව වැඩිපුර කියන්න ගියොත් දොස් කියන්න පුළුවන්, මහ අපවාදයක් කර ගන්න පුළුවන්.

ඒ නිසා තමන්ගෙ දරුවො වුන පළියට, දෙමව්පියො වුන පළියට, භාර්යාව හෝ ස්වාමි පුරුෂයා වුන පළියට, සහෝදරය සහෝදරිය වුන පළියට, යාළු මිත්‍රයන් වුන පළියට කරන්න දෙයක් නෑ. එහෙම කියල අනික් කෙනෙක් මුදවන්න බෑ. මොකද ඒ අය තවත් විනාසයක් කර ගන්න පුළුවන් නිසා. තමන්ගෙ අය කියල එහෙම ගොඩ දාන්න පුළුවන් කමක් තිබුණ නම්, එදා බුදුන් වහන්සේ තමන්ට ගිහි කල ඥාතිත්වයෙන් මස්සිනා වෙච්ච දෙව්දත් තෙරත්, මාමණ්ඩිය වෙච්ච සුප්පබුද්ධ රජතුමාත් අපායෙ යන එක නවත්වනවා. නමුත් උන් වහන්සේටත් ඒක කරන්න බැරි වුණා. ඉතින් එතකොට අනිත් අය

# සියලු බඩේ අජීර්ණවලට ප්‍රත්‍යක්ෂ සමාධිමය ඔසුවක්...

ආහාර මාර්ග පද්ධතියේ ආබාධ නිසා හට ගන්නා තවත් අතුරු ආබාධ රාශියක් තියෙනවා. ඒ නිසා විවිධ පීඩාවන්ගෙන් පෙළෙන උදවිය අද වෙන කොට සමාජයේ බහුලයි. බඩ පුරවා දැමීම, අම්ල පිත්ත ප්‍රදාහය (ගැස්ට්‍රයිටීස්), බඩ පපුව දැවිල්ල, ආහාර නොදිරවීමේ ගැටළු ඇතුළු සියලු අජීර්ණවලට, වහරක අභයරතනාලංකාර හිමියන් විසින් බේත් සමාධියට හසු කර ගත් අත්හදා බලන ලද, බාල මහළු වයස් භේදයකින් තොරව හැමෝටම පාවිච්චි කරන්න පුළුවන් තවත් ප්‍රත්‍යක්ෂ ඔසුවක් තමයි මේ හෙළිදරවු කරන්නෙ.



මේ සඳහා අවශ්‍ය වෙන්නෙ අරළු, සූදුරු, අසමෝදගම්, ඉඟුරු, ගම්මිරිස් සහ තිප්පිලි කියන අමුද්‍රව්‍ය 6. (මේ අමුද්‍රව්‍යවල අඩංගු ගුණයන් ගැන මීට පෙර ''ද්‍රව්‍ය පදාර්ථ ඥානයට හසු වන විවිධ ශාකවල සැඟවුණු ඖෂධ ශක්තීන්'' කියන ලිපි පෙළින් හෙළිදරවු කරල තියෙනවා.) මේ අමුද්‍රව්‍ය ගන්න කොට බරෙන් සමාන වෙන විදිහට ගන්න ඕන. එතනදි වේලපු අමුද්‍රව්‍ය සමාන බරක් එන විදිහට අරගෙන කුඩු කර ගන්නත් පුළුවන්. එහෙම නැත්නම් වේලපු අමුද්‍රව්‍ය කුඩු කර ගෙන සමාන බරක් එන විදිහට ගන්නත් පුළුවන්. විස්වාසවන්ත බෙහෙත් බඩු වෙළඳ සැල්වල කුඩු කරපු පිරිසිදු අමුද්‍රව්‍ය තියේ නම් ඒවා ගත්තත් ගැටළුවක් නෑ.

දැන් මේ සියල්ලම වෙන වෙනම කුඩු කර ගෙන එකට මිශ්‍ර කර ගන්න ඕන. ඒ මිශ්‍රණය ටින් එකක් හෝ පොලිතින් උරයක් වගේ වියළි භාජනයක අසුරල තියා ගෙන, එක වේලකට තේ හැඳි 1/2 බැගින් උණු වතුර කෝප්පයකට දමල තැම්බෙන්න තියල, පෙරන්නෙ නැතිව පේයාවක් විදිහට පාවිච්චි කරන්න පුළුවන්. කුඩා ළමයින්ට නම් තේ හැඳි 1/4 ක් දුන්නත් ප්‍රමාණවත්. ඒ විදිහට උදේ හවස දිනකට දෙවරක් හෝ තුන් වරක් බැගින් හෝ අවශ්‍ය ප්‍රමාණයක් දින කිහිපයක් තිස්සේ පානය කිරීමෙන් සියලු බඩේ අජීර්ණ දුරු වෙන්න හේතු වෙනවා.

සටහන

**නීතිඥ චන්දන සිරිවර්ධන**

---

මොනව කරන්නද ? කරන්න දෙයක් නෑ. නමුත් භක්තිය, කරුණාව තියෙන්න පුළුවන්. ''අනේ අපි විතරක් මිදිල මදි ! අනේ මේ අපේ අනිත් අයත් මුදවන්න එපැයි ! මට කන්න අඳින්න දුන්න අම්ම තාත්තනේ ! මාත් එක්ක එක බඩ වැල කඩාගෙන ඇවිත් එක පතේ කාපු සහෝදරය සහෝදරියනේ ! මට දාව ඉපදිච්ච මගේ දරුවොනේ ! ඒ අයට මොකද කරන්නෙ ? ඒ අය එහෙම අපාගත වෙන්න දීල බෑනෙ ! කොහොම හරි මේකෙන් බේර ගන්න එපැයි !'' ඔය වගේ හැඟීම් එන්න පුළුවන්. ඒක වෙනම අංශයක්. ඔය විදිහට මේ අනන්ත සසර ගමනෙදි තමන්ට නෑදෑයො වෙච්ච අය පෙරත් කොච්චර නම් ඉන්න ඇත්ද ? ඒත් ඒ අය අපිට ගොඩ දාන්න පුළුවන් වුනාද ? ඒ අය දැනුත් මේ තිස් එක් තලයේ කොහේ හරි ඇති. නමුත් ඒ කාරණය අපි දන්නෙ නෑ.

ඒ නිසා එහෙම හැඟීමක් ආපු පළියට ඒක කරන්න බෑ. ධර්මය කියන්නෙ ඊට වඩා ගැඹුරු දෙයක්. ඒකට ඉඩ ප්‍රස්ථාව තියෙන මට්ටමට විතරක් ඒ අයට ඉඩ දෙන්න ඕන. ඒ මට්ටම ඉක්මවා යන්න හොඳ නෑ, බලහත්කාරයෙන් ගන්න හොඳ නෑ. එහෙම කරන්න ගියොත් තමනුත් බෑණුම් අහ ගෙන, ඒ අය යන්න තියෙන තැනත් වහ ගන්න පුළුවන්. සමහර විට තමන්ගෙ ගෙදර ගෘහ මූලිකයා කියන නිසා, ඒ පුද්ගලයගෙ බලය වැඩි නිසා දෙකට නැමිල බයට යන්න පුළුවන්. ''නොදකින් විතරක් මේ යකා නිසා මට මේ ගමන එන්න වුනානෙ, අද මම චිත්‍රපටියක් බලන්න හිටියෙ, අද රූපවාහිනියෙ අහවල් නාට්‍යය තියෙනවා. මේ මගුල නිසා ඒකත් මග හැරුණා ...'' මේ ආදී වශයෙන් හිතින් පුපුර පුපුර පෙරත්ත නිසා බණ අහන්න යන්න පුළුවන්. නමුත් ඒ වගේ දේවල් මහ භයානකයි. කැමැත්තෙන් එනව නම් එන්න ඉඩ දීල ඒකට සහයෝගය දක්වීම වෙනයි. නමුත් ඒක ඉතින් ඇසුරු කරලම, සෝදිසියෙන් ඉඳලම හොයා ගන්න ඕන දෙයක්. ඒ පුද්ගලයා කොයි තරම් දුරට දහමට කැමතිද, අකමැතිද, මධ්‍යස්ථද කියන කාරණය දැන ගෙනම තමයි කටයුතු කරන්න ඕන.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ධම්ම පදය තුලින් නිවන් මග

**15 වන කොටස**

**යස්ස ජිතං නාවජීයති**
**ජිතමස්ස නෝ යාති කෝචි ලෝකේ**
**තංබුද්ධමනන්ත ගෝචරං**
**අපදං කේන පදේන නෙස්සථ?**

සරළ සිංහල තේරුම,

යම් බුදු කෙනෙක් ඒ ඒ මාර්ගයෙන් ලත් ජය නැවත කිසි විටෙක කවරකු විසින්වත් පරාජය කළ නොහැක. පරදවන ලද කෙළෙස්වලින් එකක්වත් නැවත උන් වහන්සේ පසු පස ලුහු බැඳ නොයන හෙයිනි. අනන්ත දේ අරමුණු වන හෙවත් සියල්ල දත් නුවණට අරමුණු වන ධර්මයන් වශයෙන් අනන්ත දෑ අරමුණු කරන, තුන් භවයෙහි පරිභ්‍රමණයට කාරණා වූ රාගාදී කෙළෙස් පද නැති ඒ බුදුන් කවර පදයකින් (පිළිවෙලකින්) මාරයා කරා ගෙන ගිය හැකිද ?

**යස්ස ජාලිනී විසත්තිකා - තණ්හා නත්ථි කුහිඤ්චි නෙතවේ**
**තංබුද්ධමනන්ත ගෝචරං - අපදං කේන පදේන නෙස්සථ ?**

සරළ සිංහල තේරුම,

යම් බුදු කෙනෙකුට ජාලිනී නම් වූද, විසත්තිකා නම් වූද, අරමුණුවල ඇලෙන තණ්හාව නැත්ද, අනන්ත දේ අරමුණු කොට ඇති හෙවත් සියල්ල දත් නුවණට අරමුණු වන ධර්මයන් වශයෙන් අනන්ත ගෝචර ඇති ඒ බුදුන් කවර පදයකින් මාරයා කරා ගෙන ගිය හැකිද ?

ලොව්තුරා බුදු පියාණන් වහන්සේ මේ ගාථා දෙක දේශනා කළේ, කුරු රට හිටපු මාගන්දියා නම් බමුණා මුල් කර ගෙන. මේ බමුණාටයි බැමිණියටයි එකම දියණියක් හිටියා. ඒ දියණිය හිටියෙ රූපයෙන් ඉතාම ඉහළ තැනක. ඕන තරම් තරුණයන් ඇයගෙ අත පතාගෙන ආවත්, මේ බමුණු දෙමව්පියන් ඒ අයට කැමති වුනේ නෑ. මේ දෙමව්පියන්ට කෙනෙක්ගෙ දේහ ලක්ෂණ, පා සටහන් බලල ඒ අයගෙ ගති ගුණ ආදිය කියන්න හැකියාවක් තිබුණා. ඒ නිසා තමන්ගෙ දියණියගෙ අත පතාගෙන කොච්චර අය ආවත්, සුදුසු කෙනෙක් ලැබෙන කල් බලාගෙන හිටියා. ඉතින් ලොව්තුරා බුදු පියාණන් වහන්සේ මහා කරුණා ඥානයෙන් හිමිදිරියේ ලෝකය දිහා බලන කොට දැක්කා, මේ බමුණාටයි බැමිණියටයි මාර්ග ඵලවලට පත්වෙන්න හැකියාව තියෙන බව. ඒ නිසා උන්වහන්සේ ඒ බමුණා එන මග වැඩ සිටියා. මැනවින් දේහ ලක්ෂණ කීමේ හැකියාව තිබුන මේ බමුණා, බුදුන් වහන්සේ දැක්ක ගමන් තීරණය කළා, තමන්ගෙ දියණිය ගැන උන් වහන්සේගෙ කැමැත්ත දැන ගන්න. ඉතින් ළඟට ගිහින් උන් වහන්සේගෙන් කැමැත්ත ඇහුවා. බුදුන් වහන්සේ ඒ අවස්ථාවෙ නිශ්ශබ්දව වැඩ සිටියා. කැමැත්තක් පෙන්නුවෙත් නෑ, අකමැත්තක් පෙන්නුවෙත් නෑ. මෙතනදි බැමිණියවත් එතැනට ගෙන්ව ගන්න උන්වහන්සේ යම් කිසි සම්‍යක් ප්‍රයෝගයක් යොදන්න ඇති. සියල්ලෙන් සියල්ල දකින උන්වහන්සේ දන්නවා, ඒ බමුණා දුවල ගිහින් බැමිණියත් එක්ක ගෙන එන බව. ඉතින් මේ බමුණා බුදුන් වහන්සේට ඉන්න තැනම ඉන්න කියල, හනිකට දුවල ගියා බැමිණියයි දියණියයි එක්ක ගෙන එන්න.

දැන් මේ බමුණා එතනින් පිට වුනාට පස්සෙ, බුදුන් වහන්සේ තමන් වහන්සේගෙ පා සලකුණු පොලවෙ රැඳෙන විදිහට අධිෂ්ඨාන කරල එතැනින් පිටත් වුණා. දහම් පොත් පත්වල සඳහන් වෙන විදිහට, බුදුන් වහන්සේගෙ පා සලකුණු පොලවෙ සටහන් වෙන්නෙ, උන් වහන්සේ අධිෂ්ඨාන කළොත් විතරයි. ඒකත් ඒ සලකුණු පේන්න අධිෂ්ඨාන කරපු පුද්ගලයන් උදෙසා විතරයි. මෙතනදි ඒ සටහන් පෙනුනෙ මාගන්දිය බමුණාටත් බැමිණියටත් විතරයි. ඒ පා සලකුණු දැක්ක පමණින් බැමිණිය තීරණය කළා, මේ කටයුත්තට මේ පා සලකුණු අයිති කෙනා නම් කීයටවත් කැමති වෙන්නෙ නෑ, ඒ සලකුණු අයිති කෙනා වීතරාගී උතුමෙක් කියල. ඒත් මේ දෙපල බුදුන් වහන්සේ හමුවෙලා, තමන්ගෙ දියණිය පෙන්වල උන් වහන්සේගෙ කැමැත්ත ඇහුවා. උන් වහන්සේ මුලින්ම ගිහි ජීවිතය තුල ලැබුන සැපය ගැනත්, ඒ සැපය අත් හැරල සම්මා සම්බෝධියට පත්වීම පිණිස අභිනික්මන් කරපු හැටිත්, ඒ අවස්ථාවේ සිදු වූ විශේෂ සිද්ධියකුත් පවසා සිටියා.

බොහෝ අය අහල තියෙන විදිහට උන් වහන්සේ කෙලින්ම ඒ යෝජනාව ප්‍රතික්ෂේප කළේ නෑ. මේ දෙපළට මාර්ග ඵලයකට පත්වීමට ඇති හැකියාවත් උන්වහන්සේ දැකලයි එතැනට වැඩියෙ. ඒ නිසා ඒ ප්‍රතික්ෂේප කිරීම ධර්ම දේශනාවක් හැටියටයි උන් වහන්සේ කළේ. ඒක මුල, මැද, අග සම්පූර්ණ ධර්ම දේශනාවක්. ආස්වාදය මුලින්මත්, ඒ ආස්වාදයේ ඇති ආදීනව දෙවනුවත්, ඒ අනුව ඉන් නික්මීම හෙවත් නිස්සරණය අවසානයෙත් පැහැදිලි කෙරෙන අංග සම්පූර්ණ දේශනාවක්. ඒ නිසා තමයි උන් වහන්සේ ගිහි කල තමන් වහන්සේ අත් හැරිය සම්පත් ගැන මුලින්ම කිව්වෙ. ඒ අවස්ථාවෙ කලින් කිව්ව විශේෂ සිද්ධිය තමයි, මාර දිව්‍ය පුත්‍රයා හමුවීම. එතැනදි මාර දිව්‍ය පුත්‍රයා, අභිනික්මන් කරන සිදුහත් කුමාරයා ඉදිරියේ පෙනී හිටල, තව දින හතකින් ඔබට ලැබෙන සක්විති රාජ්‍යය කරන්නෙ නැතුව මේ කොහෙද යන්නෙ කියල අහනවා. එතකොට සිදුහත් කුමාරයා, මට ඒ සක්විති රජකමින් පලක් නෑ, මම දුකින් මිදෙන මාර්ගයක් හොයාගෙන යනව කියල එතැනින් පිටත් වෙනවා.

මේක ඇත්තටම විශේෂ අවස්ථාවක්. බුද්ධ දේශනාවට අනුව **සෝවාන් උතුමෙක්ගෙ මානසිකත්වය / ඒ ලබපු ඵලය, සක්විති රජ කමෙන් කලාවෙන් කලාවකටවත් සමාන කරන්න බෑ.** නමුත් සිදුහත් කුමාරයා ඒ වෙනකොටත් දැන ගෙන හිටියා, සක්විති රජකමේ වටිනාකමක් නෑ කියල. ඉතින් සිදුහත් බෝසතාණන් වහන්සේට, සෝවාන් ඵල ලාභියෙක් සතු ලෝකයේ යථා ස්වභාවය පිළිබඳ ඇති නුවණ ඒ වෙන කොටත් තිබුණා. ඒකයි ඒ වෙලාවෙම මාර දිව්‍ය පුත්‍රයගෙ ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ. ඉතින් උන්වහන්සේට උවමනාව තිබුනෙ, තමන් සක්විති රජකම පවා අත හැරපු කෙනෙක්, නැවතත් ලෝකය තුලට වැටෙන්න උවමනාවක් නෑ කියල මාගන්දිය බමුණාටයි බැමිණියටයි පෙන්වන්න.

එදා මහා අභිනික්මන වුන වෙලාවෙ පටන් මාර දිව්‍ය පුත්‍රයා තමන්ගෙ උත්සාහය අත් හැරියෙ නෑ. හිතෙන් හිතාගත්තා, පුංචි හෝ අඩුපාඩුවක් නිසා මොහු කම් සැප එපා කියලනෙ යන්නෙ, මම එක අඩුපාඩුවක් හරි අල්ලගෙන අහනවා දැන් මොකද කියන්නෙ කියල. පුංචි හෝ අඩුපාඩුවක් හොයාගන්න අවුරුදු හතක් තිස්සේ මාර දිව්‍ය පුත්‍රයා බෝසතාණන් වහන්සේ පසු පස අවධානයෙන් හිටියා. ඒත් ඒක කරගන්න බැරි වුණා. අන්තිමේදි උන් වහන්සේ ලොව්තුරා බුද්ධත්වයට පත්වුණ මොහොතේ, තමන් පරාජය වුන බව හැඟිල එතැනින් පිටව ගියා. ඊට පස්සෙ තමයි මාර දූතිකාවන් තුන් දෙනෙක් බුදුන් වහන්සේ ඉදිරියට ඇවිත් ☞

විවිධාකාර රැඟුම් රැඟුවෙ. උන්වහන්සේව කොහොම හරි පොළඹව ගන්නයි උවමනාව තිබුණෙ. දහම් පොත් පත්වල සඳහන් වෙන විදිහට සියක් ආකාරයක වෙස් අර ගෙන උන්වහන්සේ ඉදිරියේ රඟ දැක්වුවා. පිරිමියෙක් කාන්තාවකට වශීවෙන ආකාරයේ, එක එක ක්‍රමවලට උත්සාහ කළා. තරුණ ගැහැණු ළමයි විදිහට, කාන්තාවන් විදිහට, එක දරුවෙක් ඉන්න ගැහැනු විදියට, දරුවන් දෙන්නෙක් ඉන්න ගැහැනුන්ගෙ ස්වභාවයෙන්, මැදිවියේ ගැහැනු ... මේ ආදී වශයෙන් සියක් ආකාරයක වෙස් මවාගෙන උන්වහන්සේ ඉදිරියේ රඟ දක්වල, බැරිම තැන පරාජය පිලි අරගෙන පසු බැස්සා.

ඉතින් මේ කතාව බුදුන් වහන්සේ මාගන්දියට කිව්වෙ මේ විදිහට. වා පිත් සෙම් දොස නැති, කිසිම ස්ත්‍රියකට සමාන කරන්න බැරි මාර දූතිකාවන්ටත් මාව වසඟයට ගන්න බැරි වුනා. ඒත් මේ වා පිත් සෙම් දෝසවලින් පිරුණ, අසූචි කලයක් වන් මේ තැනැත්තිය රූප සෝබාවෙන් අග තැන්පත් කියල කියනවා. හරියට අසූචි ගෑවුන පාපිස්සක කකුල් දෙක පිහින්න කියල නුඹ මට කියනවා වගේ. කෙනෙක් එහෙම අසූචි ගෑවුන පාපිස්සක කකුල් දෙක පිසදායිද? මේ විදිහට අහල බුදුන් වහන්සේ මේ ගාථා දෙක දේශනා කළා.

උන්වහන්සේ පළමු ගාථාවෙන් පැහැදිලි කළේ, තමන් වහන්සේ සම්පූර්ණයෙන්ම රාගය නැසූ උතුමෙක් බවත්, නැවත රාගයට ඇද දමන්න බැරි බවත්. ඉතින් මොකක්ද මේ රාගය කියන්නෙ ? ඒ ගාථාවෙන්ම පැහැදිලි කරනවා, තුන් භවයෙහි පරිභ්‍රමණයට කාරණා වූ රාගාදී කෙළෙස් නැති කියල. එතකොට තුන් භවය ගැන කියල තියෙනවා, ඒ වගේම පරිභ්‍රමණයක් ගැනත් කියල තියෙනවා. භ්‍රමණය, පරිභ්‍රමණය කියල වචන දෙකක් තියෙනවා. භ්‍රමණය වෙනව කියන්නෙ තමන් වටා කරකැවෙනවා කියන එක. පරිභ්‍රමණය කියන්නෙ තමන් වටා කැරකි කැරකි ගමන් කරනවා කියන එක. මොනවද තමන් වටා කරකැවෙන්නෙ. යමක් ලැබුනම සතුටු වෙනවා. නැවතත් ඒක කැඩිල බිඳිල ගියාම දුක් වෙනවා. නැවතත් ගොඩ නගනවා, ලැබුන ගමන් නැවතත් සතුටු වෙනවා. නැවතත් ඒ ගොඩ නගපු දේ තියෙන ස්වභාවය නිසා කැඩෙනවා, බිඳෙනවා, එක්කො කවුරු හරි කඩනවා, බිඳිනවා, නැවතත් දුක් වෙනවා.

ඉතින් ඔය දුකයි සතුටයි මාරු වෙවී තමන් ළඟට එනව යනවා. දුකින් ගොඩ නගනවා, පොඩි සතුටක් එනවා. නැවතත් දුක එනවා. නැවත නැවතත් තාවකාලික පොඩි සතුටක් එනවා. ඒක ලබා ගන්න, තියා ගන්න නැවත දුක් විඳිනවා. මේ තමයි තමන් ළඟ නිතරම කැරකෙන දේ. මේ කැරකෙන දේ නිසා යන ගමනක් තියෙනවා. ඒකට කියනවා සසර ගමන කියල. මේ ගමන යන කොටත් දුගතියට වැටෙන්න පුළුවන්, සුගතියට වැටෙන්න පුළුවන්. ඒ කිව්වෙ දුගති භවක් ඇති වෙන්න පුළුවන්, සුගති භවක් ඇති වෙන්න පුළුවන්. මේ දුගති භව ඇති වෙන්නෙ, අර කලින් කියපු සතුට ලබාගන්න කරපු උත්සාහය, පාප වැඩ පිළිවෙළක් වූ, අවැඩ අසාධාරණ එකක් වුනොත්. ඒ වගේම සුගති භවක් ඇති වෙන්නෙ, ඒ සතුටම ලබාගන්න පින් දහම් කළොත්. මේ සුගති භවයි, දුගති භවයි කියන එක කොටස් තුනක් හැටියට



අරගෙන තමයි තුන් භවය කිව්වෙ. එකක් කාම භවය, අනෙක රූප භවය, ඊළඟ එක අරූප භවය. ඔය තුනේම සැරි සරන හේතුව තමයි රාගය කියන්නෙ.

එතකොට රාගය නිසා තමයි අපි මේ තිස් එක් තලයෙම සැරි සරන්නෙ. එහෙනම් සුගතිය, දුගතිය තීරණය වෙන්න කොහෙන්ද කියල ප්‍රශ්නයක් එනවා. සරලව කියනව නම්, කුසල් කළොත් සුගතියක් ලැබෙනවා, අකුසල් කළොත් දුගතියක් ලැබෙනවා. එතකොට රාගය කියන්නෙ එකක්, කුසල් අකුසල් කියන්නෙ තව එකක්. කලින් කිව්ව වගේ රාගය නිසා තමයි අපි මේ තුන් භවයෙම සැරි සරන්නෙ, එහෙම නැත්නම් භ්‍රමණය වෙන්නෙ, එහෙමත් නැත්නම් රවුම් ගහන්නෙ. අදටත් කියන වචනයක් තමයි රෝන්දෙ ගියා, එහෙම නැත්නම් රවුම් ගහන්න ගියා කියල. ඔය රෝන්දෙ යන්නෙ, රවුම් ගහන්න යන්නෙ, අපි යම් කැමැත්තකට මුල් තැන දුන්නම. ඒ කිව්වෙ අපි අග්‍ර කරපු තැනක් තියෙනවා. ඒ තැනට තමයි වැඩිපුරම යන්නෙ. කෙනෙක් බේබදුකම අග්‍ර කරගෙන ඉන්නව නම් වැඩිපුරම රවුම් ගහන්නෙ ඒ ආශ්‍රිත තැන්වල. තව අය සෙල්ලම් පිට්ටනිවල. සෙල්ලම් කරන්න කැමති නම් ඒ ආශ්‍රිත තැන්වල තමයි රවුම් ගහන්නෙ. ඉතින් තමන් වැඩිපුරම අග්‍ර කරපු තැන රවුම් ගහන නිසා තමයි ඒ හැඟීමට රාගය කියන්නෙ. උපාදාන කරගත්තු කුසල් අකුසල් අනුව ඒ තැන සුගතියක්ද දුගතියක්ද කියල තීරණය වෙනවා. ලෝභය අකුසල මූලයක්, අලෝභය කුසල මූලයක්. ඉතින් ලෝභය නිසා රවුම් ගහන අය දුගතියට යනවා. අලෝභය නිසා රවුම් ගහන අය සුගතියට යනවා. ඔය ක්‍රමයට තමයි ලෝක සත්වයා සසර සැරිසරන්නෙ.

දෙවනි ගාථාවෙන් පෙන්නුවෙ ඒ කාරණයේ තියෙන භයානකකම, මනුස්සයො ලෝකයේ පැටෙලෙන හැටි. හරියට දැලක් වගේ. දැලකට පැටලුන මාළුවෙකුට හෝ මාළු රංචුවකට ඒකෙන් ගැලවීමක් නෑ. කොච්චර දැඟලුවත් නැවත නැවතත් ඒකෙම පැටලෙනවා. වතුරෙ ඉන්න කල් ඒ දැල ඇතුලෙ එහාට මෙහාට පීන පීන තාවකාලිකව ඉන්නවා. දැන් ඒ දැල, වතුරෙන් උඩට ගත්තොත් මොකද වෙන්නෙ ? දැලට පැටලිලා උඩට එනවා. වතුර නැතුව හුස්ම ගන්න බැරුව මැරිල යනවා. ඒ මාළු දන්නව නම්, තමන් තාවකාලිකව හෝ පීන පීන හිටියෙ මෙහෙම දැලක් ඇතුලෙ කියල, කීයටවත් ඒ දැල ඇතුලට යයිද ? ඉතින් බුදුන් වහන්සේ මාගන්දියට දුන්න පිලිතුර කොච්චර පැහැදිලිද ? උන්වහන්සේ සියලු රාගයන් නසල හිටියෙ. කොටින්ම කියනව නම්, ඒ දැල ගැන පූර්ණ දැනුමෙන්, අත්දැකීමෙන් හිටියෙ. නැවත නැවතත් මොනම හේතුවක් නිසාවත් ඒ දැල ඇතුලට යන්නෙ නෑ.

ඉතින් කෙනෙකුට හිතෙන්න පුළුවන්, කොහොමද මේ දැලෙන් අපි මිදෙන්නෙ, එහෙම නැත්නම් මේ රාගයෙන් මිදෙන්නෙ කියල. උපමාවක් අරගෙන බේබදු කෙනෙක් වැඩිපුරම රවුම් ගහන තැනක් ගැන හිතුවොත්, දැන් ඒ පුද්ගලයා එතැන අග්‍ර කරගෙන ඉන්න නිසා එතැනටමයි හිත යන්නෙ. මොන බොරුවක් කියල හරි, මොන උප්පරවැට්ටියක් දාල හරි ☞

යන්නෙම එතැනට. එතැනට ගියාම තියෙන ආස්වාදයත් දන්නවා. මොන දහ දුක් විඳල හරි එතැනට යන්නමයි උත්සාහය. දැන් යන්න කලින් විස්වාසවන්ත කෙනෙක් ඇවිත් කියනවා, අපෝ යන්න එපා අන්න එතැනට පොලීසියෙන් පැනල සේරම අල්ලගෙන යනව කියල. මේ බේබදු කෙනා කොච්චර ආස්වාදයක් වින්දත්, කොච්චර අග්‍ර කරගෙන හිටියත්, දැන් එතැනට යයිද ? අපෝ අද නම් ගියොත් මං ඉවරයි කියල ගෙදර නවතියිද ? පුද්ගලය දන්නවා පොලීසියට ගෙනිච්චොත් විඳින්න සිද්ධ වෙන අවමානය, නින්දාව. කොච්චර කැමැත්තක් තිබුනත්, අර විඳින්න තියෙන දුක් කඳ නිසා එතැනට යන එක නතර කරනවා.

ඉතින් සසර ගමනත් ඒ වගේ. අපි මොන දේ අග්‍ර කරගෙන හිටියත්, කොච්චර රවුම් ගැහුවත්, ඒකෙන් නැගෙන දුක, අපට විස්වාසවන්ත කෙනෙක් පෙන්වනවා. එතකොට දෙවියෙක් වුනත්, බ්‍රහ්මයෙක් වුනත් ඒ තැනත් ගෙවිල වැනසෙන තැනක් කියල නුවණින් වටහ ගත්තොත් එතැනට ගියත් වැඩක් නෑ, මොකට යනවද කියල හිතෙනවා. ඒ වගේද පොඩි අතපසු වීමකින් හරි අපාගත වුනොත් ? කාටද එහෙම වෙන්නෙ නෑ කියල සහතිකයක් දෙන්න පුළුවන්. ඉතින් ඔය වගේ විස්වාසවන්ත ක්‍රමයකින්, ඥාන ගෝචර ක්‍රමයකින් ලෝකයේ ඇත්ත තතු පෙන්වල දුන්නොත්, තමන් අග්‍ර කරගෙන හිටපු දේවල්වල වටිනාකමක් / හරයක් නෑ කියල තමන්ටම අවංකව වැටහෙනවා.

මෙහෙම සත් දහම පෙන්වල දෙන උතුමන්ට තමයි සත්පුරුෂයො කියල කියන්නෙ. ඒ අයට ආර්යන් වහන්සේලා කියලත් කියනවා. උන් වහන්සේලාගේ ඇසුර මුලින්ම ලබා ගන්න ඕන. කෙනෙකුට එහෙම සත්පුරුෂයෙක් මුලින්ම හඳුන ගන්න ලැබෙන්නෙ බාහිර ස්වරූපයෙන්. ලොව්තුරා බුදුන් වහන්සේ හැර අනෙක් සියලු දෙනාම, ඒ වගේ උත්තමයෙක් හඳුන ගන්නෙ බාහිර ස්වරූපයෙන්. කරන හොඳ වැඩ පිටින් පේනවා. බුදුන් වඳින හැටි, පින් දහම් කරන හැටි, කතා බහ කරන හැටි... මේ බාහිර ලක්ෂණවලින් තමයි එහෙම සත්පුරුෂයෙක් මුලින්ම හඳුන ගන්නෙ. හරියට ලස්සන ස්ත්‍රියකගෙ බාහිර පෙනුම නිසා පුරුෂයෙක් වසඟ වෙනව වගේම, කඩවසම් පුරුෂයෙක්ගෙ බාහිර පෙනුම නිසා ස්ත්‍රියක් වසඟ වෙනව වගේ. ඊට පස්සෙ දැන හඳුනගෙන කතා බහ කළාම තමයි ඇත්ත තත්වය තේරුම් ගන්න පුළුවන් වෙන්නෙ.

ඉතින් සත්පුරුෂයොත් ඒ වගේ. අර බාහිර පෙනුමට, තමන් තුල තියෙන සසර පුරුදු නිසා, ශ්‍රද්ධාව වැඩිල තියෙන ආකාරය අනුව ඒ සත්පුරුෂයන් කෙරෙහි නිකම්ම හිත ඇදෙනවා. කෙනෙක් ඊළඟට කරන්නෙ ඒ සත්පුරුෂයන්ව අනුගමනය කරන එක. ඊළඟට ඒ අනුව ක්‍රියා කරනවා. අපිත් ඒ වගෙ හැසිරෙන්න ඕන, එතුමා වගේ ඉන්න ඕන කියන හැඟීම තමයි මුලින්ම එන්නෙ. එහෙම ඉන්න කොට ඒ හැසිරෙන කෙනාගෙ සිතුම් පැතුම් වෙනස් වෙනවා. හොඳ ගති ලක්ෂණ මතු වෙනවා. ඒ ගතිය නිසා අර සත්පුරුෂයා කෙරෙහි තව තවත් හිත ඇදෙනවා, කතා කරන්න හිතෙනවා, මොනවද මේ කියන්නෙ කියල අහන්න හිතෙනවා. වෙලාවක් ලැබුනම ඒ සත්පුරුෂයා කරන ධර්ම දේශනාවක් අහන්න යනවා.

ඉතින් මුලින්ම සත්පුරුෂයා ඇසුරු කළා, දැන් ඒ සත්පුරුෂයා ඇසුරු කරපු නිසා එතුමා කියන වචන අහන්න ලැබෙනවා. ඒ වචනවලට කියනවා සත් දහම කියල. මේවා චතුරාර්ය සත්‍යය කැටි වෙච්ච වචන මිසක් නිකම්ම වචන නෙවෙයි. ලෝකය, ලෝකයට හේතුව, ඒ හේතුව නිරෝධ කිරීම, නිරෝධ කරන මාර්ගය අනුගමනය කරමින් ලෝකයෙන් මිදෙන හැටි තමයි ඒ සත්පුරුෂයන්ගෙ දේශනාවල තියෙන්නෙ. ඒ දේශනා අහගෙන ඉන්න කෙනා තමන් තුලින් කල්පනා කරනවා. අපිත් ලෝකය තුල ගමන් කරන්නෙ ඒ පෙන්වපු හේතුව නිසා. ඒ අනුව අපි එක එක තැන්වල උප්පත්තිවලට යනවා. නොවිඳිනා දුක් විඳිනවා. තාවකාලික ආස්වාදය විඳිනවා. ඒ ආස්වාදය ලබාගන්නත් දුක් විඳිනවා. ඒ ආස්වාදය කියන කොටස රැක ගන්නත් දුක් විඳිනවා. කොහේ උපන්නත් ඔය ටිකම තමයි. මේ උපන් තැන් තමන් තුලින්ම මෙනෙහි කරමින් ආදීනව දැක දැක ඒකෙන් මිදෙන්න උත්සාහ කරන සිතිවිලිවලටත් තමයි යෝනිසෝමනසිකාරය කියන්නෙ. දැන් සත්පුරුෂ ඇසුර තියෙනවා, සත් ධර්ම ශ්‍රවණය තියෙනවා, ඒ වගේම යෝනිසෝමනසිකාරයත් තියෙනවා.

ඉතින් මේ තුනම වෙන්නෙ එකම වෙලාවෙ බණ අහන මොහොතක. ඒ වෙලාවෙ ඒ බණ අහන කෙනාගෙ, එහෙම නැත්නම් සත් ධර්මය ශ්‍රවණය කරන කෙනාගෙ හිත දස අකුසලයෙන් වෙන් වෙලා තියෙන්නෙ. එහෙම දස අකුසලයෙන් වෙන් වීමට කියනවා, ධර්ම ප්‍රතිපදාව කියල. ඒ වගේම තවත් අනු කොටස් තුනකින් එක එක අකුසලයෙන් වෙන්වෙලා ඉන්නවා. මූලික කොටස කිරීමෙන් වෙන් වෙලා ඉන්නවා. උදාහරණ විදිහට ඒ මොහොතෙ ප්‍රාණ ඝාත කිරීමෙන් වෙන් වෙලා ඉන්නවා. එතකොට අනු කොටස් තුන තමයි කරවීම, අනුබල දීම, වර්ණනා කිරීම. මෙන්න මේ අනු කොටස්වලිනුත් ඒ මොහොතෙ වෙන් වෙලා ඉන්නවා. මේකට කියනවා අනුධම්ම කියල. මේ කොටස් හතරින් සම්පූර්ණයෙන් වෙන් වෙලා ඉන්න ප්‍රතිපදාවට කියනව ධම්මානුධම්ම ප්‍රතිපදාව කියල.

දැන් කාරණා හතරම සම්පූර්ණයි. සත්පුරුෂ ඇසුර, සත් ධර්ම ශ්‍රවණය, යෝනිසෝමනසිකාරය සහ ධම්මානුධම්ම ප්‍රතිපදාව. හේතු වාසනා තියෙන කෙනෙක් ඒ මොහොතෙ ලෝකයේ යථා ස්වභාවය නුවණින් වටහ ගන්නවා, සෝවාන් ඵලයට පත් වෙනවා. එහෙම කෙනෙක් නැවතත් සතර අපාගත නොවෙන මට්ටමට රාගය ක්ෂය කරනවා. ඒ මට්ටමෙන් නිවන් දකිනවා. නැවතත් එතැනට අග්‍රවෙන තැන්වල රවුම් ගහන මානසිකත්වය නැති වෙනවා. ඉතින් ඒ මට්ටමේ මොන වචන කිව්වත්, එතැනට නැවතත් ඇදල දාන්න බෑ. ඊට පස්සෙ මාර්ගය දිගටම වඩාගෙන යන උතුමන් පිළිවෙලින් මාර්ග ඵලවලට පත්වෙලා අවසානයේ, අග්‍ර කරගත්ත සියලු තැන් වටිනාකමක් නැති තැනට පත්වෙන අරිහත්වයට පත්වෙනවා. එහෙම වටිනාකමක් නැති තැනක දැන් කීයටවත් රවුම් ගහනවද ? රහතන් වහන්සේට මේ තිස් එක් තලයම එහෙමයි, කිසිම වටිනාකමක් නෑ. ඒ වටිනාකම බින්දුවට බැහැල. මොන තරම් ලස්සනයි කිව්වත්, මොන තරම් වටිනවයි කිව්වත්, ඒ කිසිම වචනයකට නම්ම ගන්න බෑ. ඒ නිසා තමයි ලොව්තුරා බුදුන් වහන්සේ මාගන්දිය බමුණාගෙ වචන ප්‍රතික්ෂේප කළේ. මෙන්න මේ ටික කිව්වෙ ''අනන්ත දෑ අරමුණු කරන, තුන් භවයෙහි පරිභ්‍රමණයට කාරණා වූ රාගාදී කෙලෙස් පද නැති ඒ බුදුන් කවර පදයකින් මාරයා කරා ගෙන ගිය හැකිද ?'' කියල.

ඉතින් උන් වහන්සේ මේ ගාථාවලින් කියපු අරුත අපට වැටහෙනවා. ඇයි ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ කියල වැටහෙනවා. මේ දේශනාව අවසානයේ මාගන්දියා බමුණත්, බැමිණියත් අනාගාමී ඵලයට පත්වුණා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණු දහම් කරුණු සමග ධම්ම පද පාළිය - බුද්ධ වග්ගය ඇසුරින් සකස් කළේ :*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# අදින්නාදානා වේරමණී සික්ෂාවෙන් නිවන් දකින හැටි...

(පසුගිය කලාපයෙන් - පාණාතිපාතා වේරමණී සික්ෂාවෙන් නිවන් දකින හැටි...)

ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේ නොදුන් දේ ගැන්මෙන් වෙන්ව, නොදුන් දේ ගැන්ම අතහැර, දෙන දෙයක්ම ගන්නේ, දුන් දෙයම බලාපොරොත්තු ඇතුව, පිරිසිදු වූ ආත්ම පරිහරණයෙන් යුක්තව වාසය කරන්නේය.

ප්‍රාණ ඝාතය, සත්ව හිංසාව නොකිරීම කියන්නෙත් නොදුන් දේ ගැන්මෙන් වෙන් වීමක්, නොදුන් දේ ගැන්ම අතහැරීමක්. හැම සත්වයෙක්ම කියන්නෙ, "අනේ මට හිංසා කරන්න එපා, අනේ මාව මරන්න එපා..." කියල. එපා කියන දේ කළොත්, ඒක නුදුන් දේ ගැනීමක් වෙනවා. වැරදි කාම සේවනයෙන් ආස්වාද විඳීමත් නුදුන් දේ ගැනීමක්. යම් කෙනෙක් තමන් කැමති වස්තුවක්, ආස්වාදයක් හොඳින් ලබා ගන්න බැරි වුනාම තමයි අන්‍යයන් බොරුවෙන් මුලා කරල, කේළමෙන් බිඳවල, පරුෂ වචනයෙන් සැඩ බවට පත් කරල, හිස් වචනයෙන් හිත සතුටු කරල ඒ දේ ලබා ගන්න උත්සාහ කරන්නෙ. නුදුන් දේ ගැන්මෙන් වෙන් වෙලා ඉන්නව නම්, වචනයෙන් සිද්ධ කරන මේ අකුසල් හතරම කරන්නෙ නෑ, අනුන්ගෙ වස්තුවට ලෝභ කරන දැඩි ලෝභයත් නෑ.

ලෞකික සම්මා දිට්ඨිය හෝ තියෙනව නම්, මේ අකුසල්වලින් වෙන් වෙලා වාසය කරන්නෙ කර්ම ඵල විස්වාස කරන නිසා. ඒ නිසා මිසදිටු වෙන්නෙත් නෑ. නුදුන් දේ ගැන්මෙන් වෙන්ව, නුදුන් දේ ගැන්ම අත හැරියම දස අකුසලයෙන්ම වෙන් වෙනවා, සබ්බ පාපස්ස අකරණං... කියන බුදු ඔවදන අනුගමනය කරන කෙනෙක් වෙනවා. නුදුන් දේ ගැන්මෙන් වෙන් වෙලා, නුදුන් දේ ගැන්ම අතහැරල ජීවත් වෙන්න ලොකු උත්සාහයක් වීර්යක් ඕන. ඒ නිසා මේ සිල් පදය ආරක්ෂා කිරීමෙන් නිවන් දකින්නෙ වීර්යාධික පුද්ගලයින්. තමන්ට අයිති දේ වුනත්, යම් කෙනෙක් අසාධාරණ විදියට පැහැර ගත්තොත්, ඒ පුද්ගලයාට තලල පෙලල හිංසා කරල, ඒ දේ ආපසු ගන්න යන්නෙ නෑ. මට ලැබෙන දෙයක් ලැබුනාවෙ, ඒ ලැබෙන තරමින් මම ජීවත් වෙනවා කියන නොගැටෙන ගුණය මතු වෙනවා. තමන් කැමතිම දෙයක් වුනත්, අනිත් අය වගේ තරඟ කරල පොරකාල අයිති කර ගන්න උත්සාහ කරන්නෙ නෑ.

දෙන දෙයක්ම ගන්නත්, දුන් දෙයම බලාපොරොත්තු ඇතුව ජීවත් වෙන්නත් ලොකු උත්සාහයක් වීර්යක් ඕන වෙනවා. දවස පුරාම වෙහෙස මහන්සි වෙලා වැඩ කළත්, ලැබෙන වැටුප දවසේ වියදමට ප්‍රමාණවත් නොවෙන්න පුළුවන්. ඒ වෙලාවට, මුලින්ම තව කීයක් හරි වැඩිපුර ඉල්ලනවා. ලැබුනෙ නැත්නම් කරන වැඩ ප්‍රමාණය අඩු කරනවා. එහෙම නැත්නම් මොනව හරි මුදල් බවට පත් කරන්න පුළුවන් භාණ්ඩ හොරකම් කරනවා. හොරකම අහු වුනාම වැරදිකරු වෙලා දඬුවම් විඳින්න වෙනවා. ඊළඟට ඒ පුද්ගලයාට වෛර කරනවා. මේ විදියට



සාමාන්‍ය ලෝකයාගෙ පිළිවෙල, නුදුන් දේ ගන්න වෙනත් උපක්‍රම යොදමින් පවටම බැහැ ගැනීම. නමුත් නුදුන් දේ ගැන්ම අතහැරිය පුද්ගලයා, ලැබෙන දෙයින් ජීවත් වෙන්න උත්සාහයෙන් වීර්යෙන් හැඩ ගැහෙනවා. ප්‍රාණ ඝාතය අකුසලයක්. ප්‍රාණ ඝාතයෙන් වෙන්වීම කුසලයක්. හොරකම අකුසලයක්. හොරකමින් වෙන්වීම කුසලයක්. මේ විදියට දස අකුසලයෙන් වෙන්වීම කුසල් සම්පාදනය කිරීමක් වෙනවා. ඒ නිසා දෙන දෙයක්ම අරගෙන, දුන් දෙයම බලාපොරොත්තු ඇතුව ජීවත් වෙන කොට කුසලස්ස උපසම්පදා වෙනවා.

ඊළඟට පිරිසිදු වූ ආත්ම පරිහරණයත් දැනගන්න ඕන. පිරිසිදු කියන්නෙ, ප්‍රිය බව සිඳ ලූ කියන අර්ථයෙන්. ලෝකයා ප්‍රිය කරන්නෙ මොනවද ? ඇස පිනවන රූප, කන පිනවන මිහිරි ශබ්ද, නාසය පිනවන මිහිරි සුවඳ, දිව පිනවන රස, කය පිනවන ස්පර්ශ (පොට්ඨබ්බ), මන පිනවන ධර්ම කියන මේවාට ලෝකයා කැමතියි, පිරියයි. ඇස පිනවන රූප අනිච්චයි, දුක්ඛයි, අනත්තයි කියල යම් කෙනෙක් ප්‍රඥාවෙන් දකිනව නම්, ඒ අයට රූප කෙරෙහි ඇති ප්‍රිය භාවය සිඳිල යනවා, පිරි සිඳ දකිනවා. රූපයේ යථා ස්වභාවය දැක්කම, ප්‍රිය මනාප රූප පසුපස රාගයෙන් බැඳෙන්න යන්නෙ නෑ. අප්‍රිය අමනාප රූප සමග ද්වේශයෙන් ගැටෙන්න යන්නෙත් නෑ. නොදන්නා රූප ස්පර්ශයෙන් අරමුණු ගන්නෙත් නෑ. රූප කෙරෙහි මධ්‍යස්ථ වෙනවා. මේ විදියට ශබ්ද රූප, ගන්ධ රූප, රස රූප , ස්පර්ශ රූප, ධර්ම රූප කෙරෙහිත් අනිච්ච, දුක්ඛ, අනත්ත ස්වභාවය ප්‍රඥාවෙන් වටහ ගෙන පිරිසිඳ දකිනවා, මධ්‍යස්ථ වෙනවා.

මේ විදියට රූපාදී අරමුණු අනිච්ච, දුක්ඛ, අනත්ත වශයෙන් ප්‍රඥාවෙන් නොදකින, පංච අභිඥා, අෂ්ඨ සමාපත්ති උපදවා ගත් යෝගාවචරයිනුත් ඉන්නවා. නමුත් ඒ අය නගරයකටවත් එන්නෙ නෑ. කාම අරමුණු ආවොත් කාමයන් නැඟී එන නිසා, වන වාසීවම ජීවත් වෙනවා. ඒ කියන්නෙ, ඒ අයට පිරිසිදු වූ ආත්ම පරිහරණයක් නෑ. පිරිසිදු වූ ආත්ම පරිහරණය තියෙන්නෙ බුද්ධ සාසනයේ විතරයි. රූපාදී අරමුණු අනිච්ච, දුක්ඛ, අනත්ත කියල ප්‍රඥාවෙන් දැකීම නිසා ඇස, කන ... ආදී ඉඳුරන් සංවර කර ගන්නවා. ඉඳුරන් සංවර වෙන කොට, සචිත්ත පරියෝ දපනං... කියන බුද්ධ අනුසාසනාව ඉටු කළ කෙනෙක් වෙනවා. මේ විදිහට අදින්නාදානා වේරමණී සික්ෂාවෙන් නිවන් දකින්නෙ වීර්යාධික පුද්ගලයින්.

මේ සිල් පදය රැකීමෙන් නිවන් අවබෝධ කරපු උදාර චරිතයක් ගැන ධර්මයේ සඳහන් වෙනවා. සටීකාර කියන තරුණයගෙ දෙමව්පියන් පෝෂණය කරන්න වෙන කව්රුවත් හිටියෙ නෑ. ඔහු බුදුන් වහන්සේගෙන් බණ ☞

අහල අනාගාමී වෙලා හිටියෙ. සත්තු මැරෙන නිසා ඔහු පොළොව කෙටුවෙ නෑ. ඌරු මීයන් ගොඩ දාන පස් අරගෙන පදම් කරල වළං හැදුවා. ඒ වළං, පාර අද්දර මැස්සක තියල "අවශ්‍ය කෙනෙක් මේ වළං අරගෙන කැමති මුදලක් හෝ කැමති දෙයක්, මගේ මව් පියන් පෝෂණය කිරීම සඳහා මෙහි තබා යන්න..." කියල දැන්වීමක් ලියල වළං අසලින් තිව්වා. ඒ විදියට දෙන දෙයම අරගෙන ජීවත් වුනා.

(අබ්‍රහ්ම චරියා වේරමණී සික්ෂාවෙන් නිවන් දකින හැටි, හෙළ බොදු පියුම 45 වෙනි කලාපයෙන් විස්තර කළා.)

## මුසාවාදා වේරමණී සික්ෂාවෙන් නිවන් දකින හැටි

ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේ මුසාවාදයෙන් වෙන්ව, මුසාවාදය අත හැර, සත්‍යවාදී වූයේ, සත්‍යයෙන් සත්‍යය ගලපා කථා කරන කථා ඇතිව, සත්‍යවාදීව වාසය කරන්නේය.

බුදු පියාණන් වහන්සේ ලෝකයට පහළ වෙන කොට, 62 ක් අවිද්‍යා වාද පැතිරිලා තිබුණා. ඒ අතර දසවස්තුක මිථ්‍යා දෘෂ්ටියෙන් කරපු මුසාවාදත් තිබුණා. ඒවා වාද මිසක් සත්‍යය නෙවෙයි. ඒවායින් මොකක් හෝ වාදයක් නිවැරදියි කියල හිතා ගෙන, ඒ ඒ වාද අනුව මිනිස්සු කටයුතු කළා. ඒ කවුරුවත් නිවන් දැක්කෙ නෑ. මේ වාදවලින් නිවීමක්, සැනසීමක් නැති බව අවබෝධ වෙලා සත්‍යය සොයා ගිය පිරිසක් හිටියා. ඒ වාද තුළ සත්‍යය නැති නිසා ඒවා මුසා වාද. ඒ පිරිස මුසා වාදයෙන් වෙන් වුනා. ඒ පිරිස, වාද කරන අය අතරෙ වාද කරන්න ගියෙත් නෑ. මුසා වාදය අත හැරියා. නැති දෙයක් හෝ නොසිදු වූ දෙයක්, ඇති දෙයක් හෝ සිදු වූ දෙයක් හැටියට කියා පෑම බොරුවක්, භූතයක්. භූත කථා නොකිය ඉන්න ... ආදී වශයෙන් ව්‍යවහාරයේ කියන්නෙත්, බොරු නොකිය ඉන්න කියන එක. හැබැයි ඒවා සම්ඵප්පලාප මිසක් මුසා වාද නෙවෙයි. මොකද ඒවා දස වස්තුක මිථ්‍යා දෘෂ්ටියට බැහැල කරන වාද නෙවෙයි.

ආ.. ගියේ කොහෙද කියල ඇහුවම, මම මේ ගාලු ගියා.. කියනවා. නමුත් ඇත්තටම ගියේ ගාලු නෙවෙයි, කොළඹ. මේ වගේ කථාවලට ලෝක සම්මතයේ කියන්නෙ බොරු කියල. එහෙම නැත්නම් සම්ඵප්පලාප කියල. අනාගාමී වුනත් කියන්න සිද්ධ වෙන අවස්ථා යෙදුනම මේ වගේ කථා කියනවා.

ඒත් සත්‍යය කියල ලෝකයේ පවතින්න පුළුවන් එකයි. උදාහරණයක් විදිහට කවුරු හෝ පිරිසක් ලෝකය ගෝලාකාරයි කියනවා. තව පිරිසක් සමතලයක් කියනවා. තව පිරිසක් ඕවලාකාරයි කියනවා. මේ ඔක්කොම ඇත්ත වෙන්න බෑ. සත්‍ය වූ නිවැරදි හැඩයක් තියෙනවා. ඒක සත්‍යයි. 62 ක් අවිද්‍යා වාද ගොඩ නැගෙන්නෙ, දස වස්තුක මිත්‍යා දෘෂ්ටිය හෙවත් උච්ඡේද දෘෂ්ටිය සහ සාස්වත හෙවත් ආත්ම දෘෂ්ටිය නිසා. බුදු කෙනෙක් ලෝකයට පහළ වෙලා, සිවු අරිසස් දහම දේශනා කරන කල් ලෝකෝත්තර සම්මා දිට්ඨියක් ලෝකයේ නෑ. වෙනස් නොවෙන සත්‍ය හතරක් බුදුන් වහන්සේ දේශනා කළා. දුක්ඛ ආර්ය සත්‍යය, දුක්ඛ සමුදය ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය කියන මේ හතර, බුදුවරු ලෝකයේ පහළ වුනත් නැතත් සත්‍යයි. නමුත් ලොව්තුරා බුදු කෙනෙක්ම පහළ වෙලා ලෝකයට දේශනා කරන කල්, වෙනත් සාමාන්‍ය කෙනෙකුට තනියෙන් වටහ ගන්න බෑ.



මේ දුක්ඛ ආර්ය සත්‍යය, සද්ධර්මය ශ්‍රවණය කිරීමෙන් යම් කෙනෙකුට අවබෝධ වුනොත්, ඒත් එක්කම අනෙක් ආර්ය සත්‍ය තුනත් සත්‍ය බව වැටහෙනවා. නිවන් දකින්න පුළුවන් එකම මාර්ගය, මේ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා මාර්ගය බව වැටහෙනවා. එතැන් පටන් ඒ තැනැත්තා සත්‍යවාදී වෙනවා. සම්මා ආජීවයට පත් වෙනවා. මේ දහම පිළිබඳවයි එතැන් පටන් කථා කරන්නෙ. සත්‍යයෙන් සත්‍යය ගලපා කථා කරන කථා තියෙන්නෙ, මේ සම්මා වාචා මාර්ගයේ. සිවු අරිසස් දැකපු තැනැත්තා අරිහත්වයට පත් වෙන කල්ම, අරි අටඟි මග පූර්ණ කර ගන්නා ජීවිතයක් ගත කරන නිසා, සත්‍යවාදීව වාසය කරන කෙනෙක් වෙනවා. සමාධි ඉන්ද්‍රිය බලවත් පුද්ගලයාට මේ සිල් පදය රැකීමෙන් නිවන අවබෝධ කරගන්න පහසුයි.

## සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ෂාවෙන් නිවන් දකින හැටි

ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේ මදයට හේතු වන, ප්‍රමාදයට හේතු වන, ලොව අල්ලා ගැනීමට හේතු වන, යම් සුරාවක්, යම් මේරයක් ඇත්ද, ඒ සියලු සුරාවන්ගෙන් සියලු මේරයන්ගෙන් වෙන්ව, නිවනට හිත පිහිටුවා වාසය කරන්නේය.

අපි දැනුවත් වෙලා තියෙන්නෙ, සුරා (මත්පැන්) බිව්වම මත් වෙනව කියන කාරණය විතරයි. නමුත් මදයට හේතු වන, ප්‍රමාදයට හේතු වන, ලොව අල්ලා ගැනීමට හේතු වන සුරාවක් ගැනයි මේ සිල් පදයෙන් විස්තර කරන්නෙ. ලෝකය කියන්නෙ මොකක්ද ? ඇසට ගෝචර වන රූප ලෝකය, කනට ගෝචර වන ශබ්ද ලෝකය, නාසයට ගෝචර වන ගන්ධ ලෝකය, දිවට ගෝචර වන රස ලෝකය, කයට ගෝචර වන පොට්ඨබ්බ ලෝකය, මනසට ගෝචර වන ධර්ම ලෝකය. ලෝකය සංක්ෂිප්තව ගත්තම එච්චරයි. ඇසෙන් රූප අල්ලා ගැනීමෙන් මදයට පත් වෙනවා. කනෙන් ශබ්ද, නාසයෙන් ගන්ධ ... ආදී වශයෙන් අල්ලා ගෙන මදයට පත් වෙනවා. මේ විදිහට මේ හයෙන්ම මදයට පත් වෙනවා. සුරා බඳුනට මධු විත කියලත් කියනවා. විතෙන් කරන්නෙ උරා බොන එක. මධු විතෙන් කරන්නෙ මද උරා බොන එක, මදයට පත් වෙන එක. රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධර්ම කියන මේ සියල්ලම හේතු කරගෙන, යම් රස උරා බීමක් සිද්ධ කරනවද, ඒ සඳහා සුරාව උපකාරකයක් වෙනවා. ලෝක සම්මත සුරාවෙන් (මත් පැන්වලින්) මත් වීමට වඩා, මේ පංච සුරාවට සිතින්, කයින්, වචනයෙන් ඇලීම බලවත්. ඒක ලොව අල්ලා ගැනීමක් වෙනවා.

රූප, ශබ්ද, ගන්ධ ... ආදී අරමුණු කියන්නෙ ජීවිතය පවත්වා ගෙන යන කොට ස්පර්ශ කරන ප්‍රත්‍යයන්. මදය සහ ප්‍රමාදය ගැන පැහැදිලි කරද්දි, ප්‍රත්‍යයන්ගෙන් මදයට පත්වීම ප්‍රමාදය කියල මීට පෙර පෙන්වා දුන්නා. රහතන් වහන්සේ සුරාවෙන් පමණක් නෙවෙයි, සියලු මේරයන්ගෙනුත් වෙන් වෙනවා. මේර කිව්වෙ මිහිරියාව. මිහිරට යා වුනාම මේරය කියනවා. රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ කියන මේවා ලෝකයාට හරි මිහිරියි, මධුරයි, මනාපයි. ඒවා අසාරයි කියල දකින්නෙ නැති නිසා මිහිරියාවට යා වෙනවා, ප්‍රමාද වෙනවා. මිහිරියි කියල හිතුවට, රූපාදී අරමුණු කිසිවක් අපි කැමති විදිහට පවත්වන්න බෑ. ඒවායින් ගන්නා ආස්වාදය අපේ කැමැත්ත ඉෂ්ට කරන්නෙ නෑ. ඒවාට උරුම ධර්මතාවය අනුව කැඩිල බිඳිල දිරාපත් වෙලා, වැනසිලා

යනවා. මිහිරියි කියල යාවෙලා හිටිය දේ වැනසිලා යන කොට, දුක් දොම්නස් වේදනා උරුම වෙනවා, නිවීම සැනසීම නැති වෙනවා. කැඩෙන, බිඳෙන, වැනසෙන දේවල් ලං කරගෙන, මිහිරියාවෙන් මත් වෙලා ඉඳීම හරයක් නෑ කියල, යම් කෙනෙක් මේ සත්‍යය ප්‍රඥාවෙන් අවබෝධ කර ගත්ත නම්, නිවනට හිත පිහිටුවා ගන්නවා, නිවන් දකිනවා. ප්‍රඥා ඉන්ද්‍රිය බලවත් අයට මේ සික්‍ෂා පදයෙන් නිවන් අවබෝධ කරගන්න පහසුයි.

බුදු පියාණන් වහන්සේ සද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා කියන ඉන්ද්‍රිය පහේ ප්‍රබලත්වය අනුව, ඒ ඒ පුද්ගලයාට නිවන් දකින්න පහසුවන මේ සික්‍ෂා පද පහ දේශනා කරල තියෙනවා.

## විකාල භෝජනා වේරමණී සිල් පදය නිවනට උපනිශ්‍රය වන හැටි

ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේ විකාල භෝජනයෙන් වෙන්ව, විකාල භෝජනය අතහැර, කාලයට ගැලපෙන භෝජන පරිභෝගයෙන් යුක්ත වූයේ, පස්වරු භෝජනයන්ගෙන්, රාත්‍රී භෝජනයන්ගෙන් වෙන්ව වාසය කරන්නේය.

අද සමාජය විකාල භෝජනය කියන්නෙ මද්‍යාහ්න 12 න් පස්සෙ ගන්න ආහාරවලටය. නමුත් **බුදු සසුනේ මුල් කාලයේ පස්වරුවෙත් භික්ෂූන් වහන්සේලා පිණ්ඩපාත චාරිකාවේ යෙදිල තියෙන බව ධර්මයේ සඳහන් වෙනවා.** දවසක් හවස් වෙලා පිණ්ඩපාතයේ වැඩිය භික්ෂූන් වහන්සේ නමක් නිවසක පිටුපස පාත්‍රයත් අතේ තියාගෙන නිසොල්මනේ වැඩ සිටියා. ඒ නිවසේ මුළුතැන් ගෙයි වැඩ පල කරපු කාන්තාව ඉඳුල් වතුර බඳුනක් විසි කරන්න නිවසින් එළියට ආවා. අඳුරේ වැඩ හිටපු භික්ෂුව එකවරම කවුද කියල හඳුන ගන්න බැරිවෙච්ච කාන්තාව, හොල්මනක් දක්කා ... කියල ඉඳුල් වතුර එකත් විසි කරල, මහ හඬින් කෑ ගැහුවා. එතකොට, නැගණිය බිය නොවන්න, මම පිඬු පිණිස පැමිණි භික්ෂුවක් .. කියල ඒ භික්ෂුව පැවසුවත්, බියපත් වෙලා හිටපු කාන්තාව, ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයින් ලජ්ජා නැතිව ගේ පිළිකනුවල හිටගෙන ඉන්නවා... කියල පරුෂ වචනයෙන් බැන වැදුණා.

ඉඳුල් වතුරෙන් තෙමීගිය සිවුරින් පිණ්ඩපාතයත් නැතිව, ආපසු විහාරයට වැඩිය ඒ භික්ෂූන් වහන්සේ මේ පුවත බුදුන් වහන්සේට දන්වා සිටියා. තවත් අවස්ථාවක හවස් වෙලා පිඬු සිඟා වැඩිය භික්ෂුවකට සර්පයෙක් දෂ්ට කළා. මේ ආදී බාහිර කරුණු මේ සිල් පදය පනවන්න හේතු කාරක වෙලා තියෙනවා.

ඒ වගේම පරමාර්ථ වශයෙන්, බුදුන් වහන්සේ දේශනා කරපු විකාල භෝජනය තේරුම් ගන්න පුළුවන් තවත් ධර්ම කථාවක් තියෙනවා. සැරියුත් හාමුදුරුවො සත් හැවිරිදි සාමණේර නමක් සමග දවසක් පිණ්ඩපාතෙ වැඩියා. ඉතින් සාමාන්‍යයෙන් පොඩි ළමයි, දකින දකින දේ ගැන ප්‍රශ්න කරනවා. මේ පුංචි හාමුදුරුවොත් ගොවියො කුඹුරෙ වතුර හරවනව දැකල, ඒ අය කරන්නෙ මොකක්ද කියල සැරියුත් හාමුදුරුවන්ගෙන් ඇහුවා. ඒ අය ඇලේ වතුර කුඹුරට හරවනව ... කියල සැරියුත් හාමුදුරුවො පැහැදිළි කරල දුන්නා. තව ටිකක් දුර යන කොට යකඩ තලන කම්හලක් දැක්කා. පොඩි හාමුදුරුවො ඒ අය මොකද කරන්නෙ... කියල නැවතත් විමසුවා. ඒ අය යකඩ රත් කරල, තලළ ඒ දඬු, යකඩ උපකරණ ආදිය හදනවා... කියල සැරියුත් හාමුදුරුවො



උත්තර දුන්නා. තවත් ටිකක් ඉදිරියට යත්දි වඩු මඩුවක් දැක්කා. ඒ අය මොකද කරන්නෙ කියල ඇහුවම, ඒ වඩුවො ලී දඬු නවල විවිධ උපකරණ හදනවා... කියල බොහොම කරුණාවෙන් සැරියුත් හාමුදුරුවො උත්තර දුන්නා. හාමුදුරුවො පුංචි වුනාට කල්පනාව බොහොම ගැඹුරුයි. මට ආපසු පන්සලට යන්න ඕන... කියල සැරියුත් හාමුදුරුවන්ගෙන් අවසර අරගෙන ආපසු වැඩියා. කුටියට ගිහින් මගදි දැක්ක දේවල් සිහි කළා. මිනිස්සු තම තමන් කැමති හැටියට වතුර හරවනවා, යකඩ නවනවා, ලී දඬු නවනවා. ඒ වගේ මම මගේ හිත දමනය කරනවා කියල අධිෂ්ඨාන කරගෙන විදර්ශනා කරන්න පටන් ගත්තා. එහෙම විදර්ශනා කර ගෙන යන කොට දවල් දාන වෙලාවත් ආවා. ඒත් පුංචි හාමුදුරුවො තවම භාවනාවෙ. සැරියුත් හාමුදුරුවො පුංචි හාමුදුරුවන්ට කථා කරන්න හැදුවා. ඒ අවස්ථාවෙදි බුදුන් වහන්සේ කුටියේ දොර ළඟ වැඩ ඉඳ ගෙන සැරියුත් හාමුදුරුවන්ට අතින් සංඥා කළා, කථා කරන්න එපා කියල. ඒ නිසා සැරියුත් හාමුදුරුවො ආපසු වැඩියා.

ඉර හැරිල පැය දෙකකට පස්සෙ, පොඩි හාමුදුරුවො සටනින් ජය ගත්තා. උතුම් අරිහතුන් වහන්සේ නමක් බවට පත් වුණා. එතකොටම, දැන් දානෙ දෙන්න කියල බුදුන් වහන්සේ අනුමැතිය දුන්නා. වෙලාව ඉර හැරිල වුනාට, ඒ වෙලාව දානයට සුදුසු වෙලාවක්. දානයට නුසුදුසු වෙලාව වුනේ කර්මස්ථානය වැඩීගෙන එන අවස්ථාව. ධම්ම පද වග්ගයේ එන "දියාලුවෝ කැමති පරිදි දිය ගෙන යති..." ආදී වශයෙන් සඳහන් උදාන වාක්‍යය මේ තෙරුන් වහන්සේ විසින් දේශනා කරපු එකක්.

එතකොට යම් කිසි යහපත් කටයුත්තක් සඳහා සුදුසු කාලය, වෙනත් නොවැදගත් දේකට යොදවනව නම් ඒක විකාලයක්. ඒ වගේ යම් කිසි යහපත් කටයුත්තක් කරන කොට, ඒකට බාධා අවහිර වන භෝජනයක් ඇත්නම් ඒක විකාල භෝජනයක්. පෙරවරුවෙ ගත්තත්, පස්වරුවෙ ගත්තත් ඒක විකාල භෝජනයක්. පරමාර්ථ වශයෙන් විකාලය වෙන්නෙ එහෙමයි. සිහිය විකල් වෙන දේවල්. එතකොට සම්මුති වශයෙන් පසුව හදා ගත්ත විකාලය තමයි මධ්‍යාහ්න 12ට පසු කාලය.

නිවන අරමුණු කරගෙන කටයුතු කරන යෝගාවචරයාට භාවනාදී කටයුතුවලට බාධා වන, බත් මත වගේ දේවල් එන්නෙ රස පිණිස අසීමිතව භෝජන ගැනීමෙන්. ඒ නිසා පහසු විහරණය සහ නිරෝගීකම සඳහා ඉර අවරට යන්න පෙර වළඳන්න කියල පැනවීමක් කරල තියෙනවා. ඒ වගේම ඒ කටයුතු පහසු වෙන පිළිවෙල බුදුන් වහන්සේ දේශනා කරල තියෙනවා. ඒ තමයි ආහාර ප්‍රත්‍යවේක්ෂා කරල ගැනීම. කාන්තාරයේ අතරමං වෙච්ච මව් පිය දෙන්නා පුත්‍ර මාංශය පරිභෝග කළේ යම් සේද, සසර කතරින් එතෙර වීමට මේ කය පවත්වා ගැනීම උදෙසා මේ ආහාරයද පරිභෝග කරමියි කියල හිතන්න ඕන. පස්වරුවේ වුනත්, ඒ විදිහට ගන්න භෝජනය විකාල භෝජනයක් නෙවෙයි. කාලයට ගැලපෙන භෝජනයක් වෙන්නෙ, මේ විදිහට ප්‍රත්‍යවේක්ෂා කරල සම්මතයටත් ගැලපෙන ආකාරයෙන් ගන්නා භෝජනය. (නමුත් සම්මතයට ගරු කළ යුතු නිසා, භික්ෂූන් වහන්සේලා සහ සිල් වත් සමාදන් වෙච්ච පිංවතුන් ඉර අවරට යන්න පෙර භෝජන ගැනීමත් වැදගත්)

ඊළඟට පස්වරු භෝජනයයි, රාත්‍රී භෝජනයයි දැන ගන්නත් ඕන.

☞

ප්‍රඥාව උපමා කරන්නෙ ආලෝකයට. රාත්‍රිය අන්ධකාරයි. රාත්‍රී භෝජනයෙන් කරන්නෙ ප්‍රඥාව වැඩීමට බාධා කරන එක. සම්මත වශයෙන් රාත්‍රී භෝජනය කියන්නෙ පස්වරු 6 න් පස්සෙ ගන්න භෝජනයට. නමුත් පරමාර්ථ වශයෙන් රාත්‍රී භෝජනය කියන්නෙ, භාවනාදී කටයුතුවලට බාධා වන ආකාරයේ රස පිණිස, අසීමිතව බඩ පුරවනු පිණිස, කාම සම්භෝගයන් සඳහා කය සකස් කර ගන්න, හැඩ වැඩ වෙන්න, ලස්සන වෙන්න, අඩු තැන් පිරවීම්, කාය සැරසිලි, කාය අලංකාර පිණිස, මද වඩනු පිණිස, ක්‍රීඩා කෙළි සෙල්ලම් පිණිස ගන්නා සියලු භෝජනවලට. මේ විදිහට ආහාරයේ මාත්‍රාව දැනගෙන ප්‍රත්‍යවේක්ෂා කරල භෝජන ගැනීම, ප්‍රත්‍යවේක්ෂාවෙන් පහ කළ යුතු කෙළෙස් පහ කිරීමට උපකාර වෙනවා. ආහාර පිළිබඳ රස තණ්හාව දුරු වෙනවා. විදර්ශනාව වැඩෙනවා. ඒක නිවන් අවබෝධයට හේතු වෙනවා. ඒ නිසා පැවිදි වේවා ගිහි වේවා **ආහාරයක් ප්‍රත්‍යවේක්ෂා කරල ගන්න කොට, රස පිණිස නෙවෙයි, අසීමිතව බඩ පුරව ගන්න නෙවෙයි, කාම සම්භෝගය පිණිස නෙවෙයි, කය හැඩ වැඩ කර ගන්න නෙවෙයි, බඩ ගිනි කාන්සිය කැරකිලි ආදිය දුරු කර ගෙන, ආර්ය මාර්ගය පූර්ණ කර ගන්න මේ ආහාරය ගන්නවා කියන අදහසින් ගන්න ඕන.**

## නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛා පදය නිවනට උපනිශ්‍රය වන හැටි.

ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේ නැටුම්, ගැයුම්, වැයුම්, විසුළු දැකුම්, මල් ගඳ විලවුන් දැරීම්, සැරසීම්, අඩු තැන් පිරවීම් ආදී කාය සැරසිලි, කාය අලංකාරයන්ගෙන් වෙන්ව, ඉන්ද්‍රිය සංවර භාවයෙන් යුතුව වාසය කරන්නේය.

නැටුම්, ගැයුම්... ආදියෙන් ඇස, කන, නාසය ... ආදී ඉඳුරන්ට ආහාර සැපයීම තමයි කරන්නෙ. කබලිංකාර ආහාර (කය බලි කරන ආහාර), ස්පර්ශ ආහාර, විඤ්ඤාණ ආහාර, මනෝ සංචේතනා ආහාර කියන ආහාර හතර, සත්වයාගේ ලෝක පැවැත්මට හේතු වෙනවා. විකාල භෝජනා වේරමණී සිල් පදය, කබලිංකාර ආහාර නිරෝධයටත්, නච්ඡ ගීත වාදිත .. සිල් පදය, ස්පර්ශ ආහාර නිරෝධයටත් උපකාර වෙනවා. නැටුම්, ගැයුම්...ආදිය ස්පර්ශ කිරීමෙන් වෙන් වීමෙන් ඉන්ද්‍රිය සංවර කරනවා. ඒකත් නිවන් දැකීමට උපනිශ්‍රයක්.

## උච්චාසයන මහාසයනා වේරමණී සික්ෂාව නිවනට උපනිශ්‍රය වන හැටි.

ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේ, උච්චා සයනයෙන් මහා සයනයෙන් වෙන්ව, උච්චා සයන මහා සයන අතහැර, නිහතමානී වූයේ, මැස්සක්, තණ ඇතිරියක්, පත් කඩක් වැනි දේ ඇසුරු කරමින්, නිහතමානී ගුණයෙන් යුතුව වාසය කරන්නේය.

අද මේ සික්ෂා පදයේ තේරුම හැටියට දැන ගන්න ලැබෙන්නෙ උස් අසුන්, මහ අසුන් පරිභෝගයෙන් වැළකිලා ඉන්නවයි කියල. උස් අසුන් කියන්නෙ, සිංහ පාද තියෙන, ගරු ගාම්භීර පෙනුම තියෙන, සැප පහසු ආසන කියල සමහර අය විස්තර කරනවා. හැබැයි මේ සිල් පදයෙන් කියවෙන්නෙ උච්චාසන කියල නෙවෙයි, උච්චාසයන කියල. සයන කියන්නෙ නිදියන කියන අදහස. මෙතනදි



සයන කියන්නෙ ජීවිතයට බද්ධ කරගෙන ඇසුරු කරනවා කියන අර්ථයෙන්. අපි දන්න ප්‍රස්ථා පිරුළකුත් තියෙනවා, බල්ලොත් එක්ක නිදා ගත්තම මැක්කොත් එක්ක නැගිටින්න වෙනව කියල. ඒ කියන්නෙ පහත් ගති ඇති අය ඇසුරු කළොත්, ඒ පහත් ගති තමන්ගෙ ජීවිතයටත් එකතු වෙනව කියන කාරණය. සයනය කිරීමෙන් වෙන් වෙනව කියන්නෙ උච්ච ගති, මාන්නක්කාර ගති ජීවිතයට බද්ධ කරගෙන, ඇසුරු කිරීමෙන් වෙන් වෙනව කියන එක.

මේ සිල් පදය පනවන්න හේතු වුනා කියල හිතන්න පුළුවන් නිදාන කථාවක් තියෙනවා. දවසක් බුදුන් වහන්සේ දැක්කා, ආරාමයේ කැණිමඬල ළඟටම උස තියෙන නිදන මැස්සක්. ඒක වටේට ඊට වඩා උස අඩු තවත් මැහි ගොඩක් තියෙනවා. තව තව වටේට අඩු උස ඇති මැහි තියෙනවා. මේ ගැන විමසුවම උන්වහන්සේට දැනගන්න ලැබුනා, ශාක්‍ය වංශයෙන් පැවිදි වෙච්ච අය අනෙක් වංශවලින් පැවිදි වෙච්ච අයට වඩා තමන් උසස් හැටියට සලක ගෙන ඒ උස් මැහි තනා ගත් බව. මාන්නය අධිකකම නිසා උස් අසුන් තරඟයක් දෙපිරිස අතර ඇති වුණා.

මේ වෙලාවෙදි බුදුන් වහන්සේ ඒ භික්ෂූන් වහන්සේලාට, මානය අකුසලයක්, අත්තුක්කංසන පරවම්භන කියන, තමන් උසස් කොට සළකල අනුන් පහත් කොට සැළකීම, නින්දා කටයුතු පහ කළ යුතු ක්ලේශ ධර්මයක් කියල ධර්ම දේශනා කළා. බුද්ධක නිකායේ 1 වෙනි කාණ්ඩයේ එන මාන පරිඤ්ඤා සූත්‍රයෙනුත් මේ බව පෙන්වා දීල තියෙනවා.

මම උසස්, මම ගරුත්වය ලැබිය යුතු කෙනෙක් ... ආදී වශයෙන් මමත්වය ඉහළින් තියාගෙන ජීවත් වීමෙන් සසර දුකෙන් මිදෙන්න බෑ, මම කියල සත්වයෙක්, පුද්ගලයෙක් ඉන්නවා කියන මිත්‍යාව දුරු කරන්න බෑ. සම්මා දිට්ඨියට පත් වුනොත්, මමත්වය පිළිබඳ යථාර්ථය ඉබේම අවබෝධ වෙනවා. මේක හේතු ඵලයක් කියල වැටහෙනවා. මේ කරුණුවලින් පැහැදිලි වෙනවා, උච්චාසයන මහාසයනවලින් වෙන් වුනාම ඒවා අත හරින එක ඉබේම සිද්ධ වෙන බව. මම කියල සත්වයෙක් / පුද්ගලයෙක් නැති තැන, උසස් හෝ පහත් කියල අල්ලගන්න කිසිවක් නෑ. නිහතමානීව, ලැබුන මැස්සක් හෝ පත්කඩක් හෝ තණ ඇතිරියක් පරිභෝග කරනවා. මේ සිල් පදය ආරක්ෂා කිරීමෙන් මානය කියන ක්ලේශය දුරු වෙනවා, සම්මා දිට්ඨියට පත්වෙනවා, නිවනට උපනිශ්‍රය වෙනවා.

## මෙත්තේන චිත්තේන විහාරාමි.

ධම්ම පදයේ එන "නහී වේරේන වේරාණී.." ආදී ගාථා ධර්මයෙන් කියවෙන්නෙ, අවෛරයෙන් වෛරය සංසිඳෙනව කියන එක. අවෛරය කියන්නෙ, මෙත්තා සහගත කාය, වචී, මනෝ කර්මවලට. අපි අතින් සිදු වෙච්ච වැරදි අසාධාරණවලට මේ ආකාරයෙන් මෙත් වැඩීමෙන් වන්දි ගෙවීමේ හැකියාවක් තියෙනවා. ණය නැති බව, වරදක් නැති බව කියන ගුණ පූර්ණ කර ගැනීම කියන කාරණා, මෙත් වැඩීමෙන් පින් අනුමෝදන් කරල සිද්ධ කර ගන්න පුළුවන්.

*වෑහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ:*

**ඩබ්. ඒ. තිළිණවතී**
**විශ්‍රාමික මහජන බැංකු නිලධාරිනී**
**කඩවත**

# ආවාස පූජාවේ අනුසස්

මපාදු මානුසික අවශ්‍යතා අතර ඇඳුම් පැළඳුම්, කෑම බීම, ගෙවල් දොරවල් සහ සෞඛ්‍ය පහසුකම් මූලික වෙනවා. රටක් පාලනය කරන රජයකින් ජනතාවට ඉටු විය යුතු මූලික යුතුකම් වශයෙන් සැලකෙන මේ අවශ්‍යතා හතර, සසර දුක අවබෝධ කරගෙන නිවන් දකින්න පැවිදි දිවියට ඇතුල් වෙච්ච භික්ෂූන් වහන්සේටත් පොදුයි. ප්‍රත්‍යවේක්ෂා කරල පරිභෝග කරන චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන ප්‍රත්‍ය කියන මේ සිව්පසය ගත්තම, ගිහි පරිභෝගයට වඩා පැවිදි පරිභෝගයේ ලොකු වෙනසක් තියෙනවා. භික්ෂූන් වහන්සේ ආරාම පරිභෝග කරන්නෙ, රැස් කරන ධනයක් ආරක්ෂා කිරීමට හෝ සොර සතුරු උවදුරකින් වැලකීමට හෝ නෙවෙයි. සීත පීඩා, උෂ්ණ පීඩා වළක්වා ගන්නත්, ලේ බොන මැස්සන් මදුරුවන්ගෙන් ආරක්ෂා වෙන්නත්, සුළඟ, අව්ව, වැස්ස, සර්පාදීන්ගෙන් එන පීඩාවන් දුරු කර ගන්නත්, විවිධ සෘතු උපද්‍රවවලින් ආරක්ෂා වෙන්නත්, සිත එකඟ කර ගැනීමේ පහසුව පිණිසත් කියන මේ කාරණාවලට.

ඉහත සඳහන් පරමාර්ථයන්ටත් වඩා පුළුල් වූ පරමාර්ථයන් මත විහාර ආරාම ගොඩ නැගුණු බව ඒ සඳහා වැය කරන ලද විශාල ධන පරිත්‍යාගයන්ගෙන් පැහැදිලි වෙනවා. පනස් හතර කෝටියක් ධනය ජේතවනාරාමය සඳහාත්, විසිහත් කෝටියක් ධනය පූර්වාරාමය සඳහාත් වැය කරල තියෙන බව පොත පතේ සඳහන් වෙනවා. ලංකා සාසන ඉතිහාසය අනුව අතීත රජ දරුවන් මහා විහාරය, අභයගිරිය, ජේතවනය වගේ සුවිසල් ආරාමත්, සත්මහල් ලෝවාමහා ප්‍රාසාදය වගේ ස්ථානත් භික්ෂූන් වහන්සේලාගේම ප්‍රයෝජනය උදෙසා ගොඩ නගල තියෙනවා.

සක්විති රජ සැප අතහැරල, තුන් සෘතුවට ගැලපෙන රම්‍ය, සුරම්‍ය, සුභ වගේ දැකුම්කළු මහා ප්‍රාසාද අතහැරල මහණ වෙච්ච මහ බෝසතාණන් වහන්සේට ශාක්‍යයන් විසින් නිග්‍රෝධාරාමයත්, බිම්බිසාර රජතුමා විසින් වේළුවනාරාමයත්, අනේපිඬු සිටුතුමා විසින් ජේතවනාරාමයත්, විශාකා උපාසිකාව විසින් පූර්වාරාමයත් මහා ධන පරිත්‍යාගයන් සිදු කරමින් සකස් කරල පූජා කළා. පාවාරික සිටුවරයා කරපු පාවාරිකාරාමය, කොසඹෑ නුවර ඝෝෂිතාරාමය තවත් ඒ වගේ විහාර අතර වෙනවා. සුනාපරන්ත ජනපදයේ රත් හඳුන්වලින් විහාරයක් බුදුරදුන් සඳහා ගොඩ නැගූ බව පුණ්ණෝවාද සූත්‍ර වර්ණනාවේ සඳහන් වෙනවා. මුලදී ගහක් යට, ලෙනක් තුළ වැඩ වාසය කරමින් බුදුන් වහන්සේගෙ දහම් පණිවිඩය බෙදා හැරීමේ නිරත වෙලා හිටපු ශ්‍රාවක සංඝයා සඳහාත් බුදුන් දවස ආරාම ගොඩ නැගූ බව අට්ඨක නාගර සූත්‍ර වර්ණනාවේ සඳහන් වෙනවා. අට්ඨක නගර වැසි දසම කියන ගෘහපතියා ආනන්ද හිමියන් සඳහා පංචසතික විහාරයක් කළ බවත්, චිත්ත ගෘහපති විසින් මහානාම හිමියන් සඳහා ආරාමයක් කළ බවත් සඳහන් වෙනවා.



බුදු රජාණන් වහන්සේ කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයේ වැඩ වාසය කරද්දී ශාක්‍යයන් විසින් රැස්වීම් ශාලාවක් ඉදි කළා. ඒ ශාලාව පළමු කොට බුදුන් වහන්සේගෙ පරිභෝගයට සලස්වල, පසුව රජ දරුවන්ගෙ රැස්වීම් පවත්වන්න තීරණය කරපු ශාක්‍යයෝ, භාග්‍යවතුන් වහන්සේට භික්ෂු සංඝයා සමග මේ ශාලාව පරිභෝග කරන්න කියල ආරාධනා කළා. ඒ ආරාධනාව නිහඬව පිළිගත් බුදුන් වහන්සේ, භික්ෂූන් සමග ඒ ස්ථානයට වැඩම කරල නෑයන්ට අනුකම්පාවෙන් වැඩ හිඳල ආවාස දානයේ අනුසස් වදාළ ආකාරය මජ්ඣිම නිකාය අටුවාවේ සේඛ සූත්‍ර වර්ණනාවේ මේ විදිහට සඳහන් වෙනවා. ''මහ රජ ඔබ පිදූ ආවාසය ම විසින් පරිභෝග කරන ලදී. ශ්‍රාවක වූ භික්ෂු සංඝයා විසින් ද පරිභෝග කරන ලදී. මාත් භික්ෂු සංඝයාත් පරිභෝග කළ විට ධර්මය විසින්ද පරිභෝගිකයි. මෙසේ ඔබලාගේ පූජාව ත්‍රිවිධ රත්නයටම කළ මහා පූජාවකි. අතු සෙවිලි කළ පැලක් හෝ සෙවණ ඇති ලතා මණ්ඩපයක් හෝ පිදීමේ ආනිසංස මෙපමණයි කියා කිව නොහැකියි''

මේ විදිහට විවිධ විසිතුරු උපමා කථා දක්වමින්, යාම එකහමාරකටත් වැඩි කාලයක් උන් වහන්සේ මේ ගැන අනුසස් දක්වල වදාරළ තියෙනවා. තවදුරටත් ආවාස දානාදී පිංකම්වල අනුසස් ශාක්‍යයන්ට විස්තර කරල දේශනා කරන්න කියල ආනන්ද හිමියන්ට පැවරූ බවත් සඳහන් වෙනවා. ''ආවාස දානස්ස පනානිසංසා කෝනාම වත්තුං පුරිසෝ සමත්ථෝ'' කියන දේශනාව අනුව, ආවාස දානයාගේ අනුසස් කියන්න තථාගතයන් වහන්සේ නමක් හැර අන් කවර නම් කෙනෙක් එයට සමර්ථ වේද කියල තථාගතයන් වහන්සේම දේශනා කරනවා.

බුදු රජාණන් වහන්සේ පහළ වෙලා සංඝ රත්නය පහළ වෙච්ච මුල් කාලයේ භික්ෂු සංඝයා ගල් ගුහා, වනාන්තර, ගස් යට ආදී තැන්වල වැඩ වාසය කළා. සාසනය ආරම්භක අවධියේ භික්ෂූන්ට ආවාස ආදිය සකසා දීමක් සිද්ධ වෙලා නෑ. ඊට හේතුව තමයි, බුදුන් වහන්සේ ලෝකයට පහළ වෙච්ච අලුත, සාසනයේ වටිනාකම තේරුම් ගෙන ඒ වගේ කටයුතු කරල දෙන්න දැනුවත් වෙච්ච පිරිසක් නොසිටීම. මනුස්සයින්ට බුද්ධ සාසනයේ වටිනාකම වැටහුනේ, සද්ධර්මය අහල දැනුවත් භාවය ඇති වුනාට පස්සෙ. ඒ සඳහා සෑහෙන කාලයක් ගත වුනා. ඊට පස්සෙ බුදුන් වහන්සේ මුල් කර ගෙන සංඝ රත්නය උදෙසා ගරු සැලකිලි, සිව්පස පූජාවන් ලැබෙන්න පටන් ගත්තා.

එක අවස්ථාවක දායක පිංවතෙක් භික්ෂූන් වහන්සේ නමකට කුටියක් හදා දෙන්න ඇහුවම, බුදු රජාණන් වහන්සේ ආවාස පිළිගන්න අනුදන වදාරළ නැති නිසා බාර ගන්න බැරි බවත්, බුදුන් වහන්සේගෙන් ඒ සඳහා අවසර අරගෙන දැනුම් දෙන්න පුළුවන් බවත් පැහැදිලි කළා. මේ කාරණය තථාගතයන් වහන්සේට දැනුම් දුන්නම ආවාස පිළිගැනීමට අනුදන වදාළා. එතැන් පටන් ආවාස සකස් කරල බුදුපාමොක් මහ සඟරුවනට පූජා කරන්න සැදැහැවතුන් උනන්දු වුණා.

ආවාස පූජා වගේ දේවල් පෞද්ගලිකව බාර ගැනීම සාසනයට උචිත වෙන්නෙ නෑ. බුදු රජාණන් වහන්සේට නමුත් පෞද්ගලිකව දෙන දානයකට වඩා, බුදු පාමොක් සංඝයා උදෙසා දන් දීම ☞

ආනිසංස වැඩියි. බුදුන් වහන්සේගෙ සුළු මව වූ ප්‍රජාපතී ගෝතමිය, තමන්ගෙ දැතින්ම සිවුරක් සකස් කරල තථාගතයන් වහන්සේට පූජා කරන්න ගෙනාවම, ඒක සංඝයාට පූජා කරන්න කියල තුන් වතාවක්ම උන් වහන්සේ ප්‍රකාශ කළා. සංඝයාට පූජා කරන කොට ඒ පූජාව තුන් කල් සියලු බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලාටම කරන පූජාවක් බවත් දේශනා කළා. (සංඝේ ගෝතමී දේහි, සංඝේ ගෝතමී දේහි, සංඝේ දින්නේ අහං චේව පූජිතෝ භවිස්සාම)

වළගම්බා රජතුමා දමිළයන් එක්ක සටන් කරල පැරදිලා කැළෑවෙ ඉන්න කොට, මහා විහාරවාසී තිස්ස නම් භික්ෂුවක් පිඬු සිඟා ආහාර අරගෙන ගිහින් රජ පවුලට සංග්‍රහ කළා. කැලේ හිටපු රජතුමා ඇතුළු පිරිසට ඒ අවස්ථාවෙදි ඒ ආහාරය මහා උපකාරයක් වුණා. ඒ නිසා පසුව වළගම්බා රජතුමා රජ වුනාට පස්සෙ, තමන්ට කරපු උපකාරයට කළ ගුණ සැලකීමක් වශයෙන් අභයගිරි විහාරය හදල තිස්ස හාමුදුරුවන්ට පෞද්ගලිකව පූජා කළා. පුද්ගලික ආරාමයක් බාර ගැනීමේ වරදට, මහා විහාරික භික්ෂූන් ''උක්ඛේපනීය'' කියන විනය කර්මයකින් තිස්ස හාමුදුරුවො මහා විහාරයෙන් නෙරපා හැරියා. ඊට පස්සෙ අභයගිරි නමින් නිකායක් ඇති වුණා. අභයගිරියෙන් කැඩිල ගිය තවත් භික්ෂු පිරිසක් ජේතවන නමිනුත්, එයින් කැඩිල ගිය තවත් පිරිසක් සාගලිය නමිනුත් නිකායන් විදිහට බිහි වුනා. පෞද්ගලිකව ආරාමයක් බාර ගැනීමේ ප්‍රතිඵල වශයෙන් නිකාය භේදයන් ඇති වෙලා නොයෙක් සාසනික අර්බුදත් පහළ වුනා. ඒ නිසා, සිවු දිගින් වඩින සංඝයා උදෙසා සඟ සතු කරල පූජා කිරීම තමයි ශාසනානුලෝමික වෙන්නෙ.

ආවාසයක් හදල පූජා කිරීමේ ප්‍රයෝජනය එදා ජේතවනාරාම පූජාවෙදි මේ විදිහට පැහැදිලි කරල තියෙනවා.

සීතං උණ්හං පටිහන්ති - තතෝ
වාග මිගාපිච
සිරිං සපේච මකසේ - සිසිරේ
චාපි වුට්ඨියෝ

වාසස්ථානය නිසා සීත උෂ්ණයෙන් ආරක්ෂා විය හැක. වග වළසුන් ආදී නපුරු සතුන්ගෙන් මිදිය හැක. වර්ෂාවෙන්, සෘතු වෙනස්වීම් ආදියෙන් මිදිය හැක.

තතෝ වාතාතපේ සෝරේ -
සඤ්ඤාතේ පටිහඤ්ඤති
ලේණත්ථඤ්ච සුඛත්ථංච -
ඣායිතුංච විපස්සිතුං

සැඩ සුළඟින්, නියඟයෙන් මුහුණ පෑමට සිදු වන උවදුරුවලින් බේරීමට, ආරක්ෂා සහිතව සුවසේ වාසය කිරීමට, ධ්‍යාන විදර්ශනා භාවනාදිය වැඩීමට ආරාමය ඉතා සුදුසු ස්ථානයක් වන්නේය.

විහාර දානං සංඝස්ස - අග්ගං
බුද්ධේන වණ්ණිතං
තස්මාහි පණ්ඩිතෝ පෝසෝ -
සංපස්සං අත්ථමත්තනෝ
විහාරේ කාරයේ රම්මේ -
වාසයෙත්ථ බහුස්සුතේ

සංඝයාට විහාර හදා දන් දීම බුදු හිමි විසින් වර්ණනා කර ඇත. ඒ නිසා නුවණැති සැදැහැතියන් විසින් රමණීය ලෙස විහාර කරවා භික්ෂූන් වහන්සේලා වාසය කරවිය යුතුය.

එදා බුද්ධ කාලයේ වගේම ඊට පසු කාලවලදිත් රජ, සිටු, ඇමතිවරු ඉතා රමණීය විදිහට, කලාත්මක විදිහට ආරාම කරවන්න සැලකිලිමත් වෙලා තියෙනවා. අද පුරා විද්‍යාත්මක වටිනාකමක් තියෙන



පැරණි ගොඩනැගිලි නෂ්ටාවශේෂ අතර වැඩි වශයෙන් දකින්න තියෙන්නෙ පෞරාණික විහාර ආරාමවල නටඹුන්. රජ මාළිගා හැරුණම සෙසු බෞද්ධයන් වාසය කරපු මන්දිරවල නටඹුන් අද දකින්න නෑ. එයින් පැහැදිලි වෙන්නෙ, සාමාන්‍ය ජනතාව ඉතා සරල චාම් ජීවිත ගත කළ බවත්, විහාර ආරාමවලට අයිති ගොඩනැගිලි කලාත්මක ලෙසත් දර්ශනීය ලෙසත් දිගු කල් පවතින ආකාරයෙන් කරවූ බවත්.

සංයුක්ත නිකායේ එන කිංදද සූත්‍රයේ, කුමක් දීමෙන් සියල්ල දෙන්නේ වේද කියල (යෝච සබ්බ දදෝ හෝතු තං මේ අක්ඛාහි පුජිතෝ) දේවතාවෙක් බුදුන් වහන්සේගෙන් අහපු ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් වදාළේ, යමෙක් ආවාස හදා පූජා කරයි නම් හෙතෙම සියල්ල දෙන්නේ වෙයි කියල (යෝච සබ්බ දදෝ හෝති යෝ දදාති උපස්සයං). මොකද ස්වකීය අධ්‍යාත්මික බාහිර සියලු වස්තූන්ගේ සහ පුද්ගලයන්ගේ ජීවිතාරක්ෂාවට ආධාරය ලැබෙන්නෙ වාසස්ථාන නිසා. සියල්ල දුන්නා වෙන්නෙ ඒ නිසා.

සංයුක්ත නිකායේ වනරෝප සූත්‍රයෙත් ආවාස දානයේ අනුසස් මේ විදිහට විස්තර කරල තියෙනවා.

ආරාම රෝපා වන රෝපා -
යේජනා සේතු කාරකා
පපංච උදපානංච - යේ දදන්ති
උපස්සයං

තේසං දිවාච රත්තෝච - සදා
පුඤ්ඤං පවඩ්ඪති
ධම්මට්ඨා සීල සම්පන්නා -
තේජනා සග්ග ගාමිනෝ

මල්, එල, උයන් වවන අයට, ඒ දඬු, පාලම්, පැන්හල්, පැන් පොකුණු, ආවාස කරන අයට, දිවා රෑ දෙකෙහි පිං වැඩේ. ධර්මකාමී ඔවුන් ස්වර්ගයෙහි උපදී.

එදා අනාථපිණ්ඩික මහ සිටුතුමා පනස් හතර කෝටියක් ධනය වියදම් කරල ජේතවනාරාමය හදල බුදුන් වහන්සේ ප්‍රධාන මහ සඟ රුවනට පූජා කළා. මේ සිටුතුමාට ජේතවනාරාමය පූජා කරන කොටම, ජීවත්ව ඉඳෙද්දි ඒ හා සමානව රිදී විමානයක් දෙව් ලොව පහළ වුණා. ආරාම පූජාවට කිසිම මිල මුදලක් වැය නොකර, ශ්‍රම දායකත්වයක් ලබා නොදී, ආරාම පූජාවෙදි චිත්ත ප්‍රසාද සිතින් පිං අනුමෝදන් වෙච්ච සැදැහැවතෙකුට අනේපිඬු සිටුතුමාගෙ දෙව් විමනට උඩින් රන් විමානයක් පහළ වුණා. තව කෙනෙක් කරපු පිනක් අනුමෝදන් වීමෙන් පමණක් සිටුතුමාටත් වඩා මහ පිනක් ඔහු ලබා ගත්තා. අනුන් කරන පිනක් දැක බලාගෙන ප්‍රසාද සිත් පහළ කර ගෙන පිං අනුමෝදන් වීම කොච්චර වටිනවද කියන කාරණය මෙයින් පැහැදිලි වෙනවා.

අනේපිඬු සිටුතුමා මරණින් පසු දේවත්වයට පත් වෙලා, බුදු රජාණන් වහන්සේ ළඟට ඇවිත් තමන්ගෙ සතුට මේ විදිහට ප්‍රකාශ කරනවා.

ඉදං හිතං ජේතවනං - ඉසි සංඝං
නිසේවිතං
අවුත්ථං ධම්ම රාජේන - පීති
සඤ්ජනනං මම
(සංයුක්ත නිකාය - ජේතවන සූත්‍රය)

නිතර භික්ෂු සංඝයා ගැවසී ගත් ධර්ම රාජයාණන් වහන්සේ වැඩ වසන මේ ජේතවනාරාමය දකින මට මහත් ප්‍රීතියක් උපදී.

තමන් කර ගත් යහපත් දේ දකින කොට, සිහි වෙන කොට, ඒ කෙරෙහි චිත්ත ප්‍රබෝධය, ප්‍රසාදය ඇති වන වාරයක් පාසා වැඩෙන්නෙ පිං සිතිවිලි. යහපත කරන්නා මෙලොවත් පරලොවත් සතුටු වන බවත්, සුගතියේ ඉපිද වඩාත් ප්‍රමෝද වන බවත් ධම්ම පදයේ මේ විදිහට සඳහන් වෙනවා.

ඉධ මෝදති පෙච්ච මෝදති - කත පුඤ්ඤෝ උභයත්‍ථ මෝදති
සෝ මෝදති සෝ පමෝදති - දිස්වා කම්ම විසුද්ධිමත්තනෝ

බුදු රජාණන් වහන්සේගේ සුළු මව වන මහා ප්‍රජාපතී ගෝතමී දේවිය සහ ඇයගේ පුත්‍රයා වන නන්ද කුමාරයා පෙර අත්බැවක සිදු කරපු ආවාස දාන පිංකමක් පිළිබඳ විස්තරයක් අංගුත්තර නිකායේ අටුවාවක මේ විදිහට සඳහන් වෙනවා.

නන්ද කුමාරයා ඒ කාලයේ කම්කරු පිරිසක නායකයෙක්. ප්‍රජාපතී දේවිය ඒ කම්කරු පිරිසගේ කාන්තාවන් අතර නායිකාව වුණා. ඒ කාලයේ පසේ බුදු රජාණන් වහන්සේලා පස් නමක් වස් කාලය නිසා සෙනසුන් සොයා ගන්න බරණැස් සිටුතුමාගෙ සිටු මැදුරට වැඩම කරල සිටුතුමා හිටියෙ නැති නිසා සිටු දේවියට ඒ බව දැනුම් දුන්නා. කාර්ය බහුල නිසා, අපිට ඒ ගැන ඉඩක් නෑ කියල වෙනත් කෙනෙක් හමු වෙලා ඊට පිළිවෙලක් යොදා ගන්න කියල සිටු දේවිය කිව්වා. ඒ නිසා පසේ බුදු රජාණන් වහන්සේලා ආපසු වැඩියා. මේ කාරණය දැකපු කම්කරු නායිකාව ආපසු වඩින්නෙ ඇයි කියල උන් වහන්සේලාගෙන් ඇහුවා. වස් වාසය කරන්න සුදුසු සේනාසන පහසුකම් සලස්වා ගැනීම සඳහා සිටු මැදුරට ගිය නමුත් ඊට ඉඩක් නැති බව සිටු දේවිය කියපු නිසා ආපසු වඩින බව පසේ බුදුවරු පැවසුවා.

''කිං පන භන්තේ සා කුටී ඉස්සරහේව කාතබ්බා දුග්ගතේහිපි සක්කා කාතුං'' කියල ඒ සෙනසුන් පොහොසතුන් විසින්ම කළ යුතුද, ඒවා දුක්පතුන්ට කරන්න බැරිද කියල ඇය විමසුවම, එබඳු නියමයක් නෑ, පිං කැමති සැදැහැවත් කාට වුනත් කරන්න පුළුවන් බව පසේ බුදුවරු දැනුම් දුන්නා. එහෙනම් ඔබ වහන්සේලා ආපසු වැඩම නොකර මෙහිම වැඩ වාසය කරන්න, අපි සේනාසන පහසුකම් සපයා දෙන්නම්, අද පටන් අපේ දානයත් පිළිගන්න කියල ආරාධනා කළා.

තමන්ගෙ කම්කරුවන්ට මේ බව දන්වල, පහුවදා දානයත් පිළියෙල කරල පිරිනමල, වනයට ගිහින් අවශ්‍ය ලී දඬු ආදිය සපයල ආවාස කුටි පහක් හදල ඒ ඒ ආවාසයට අවශ්‍ය ළිං, පොකුණු, සක්මන් මළු, ඇඳ, පුටු, භාජන ආදී සියල්ල සූදානම් කරල ඒ ආරාම පසේ බුදුවරුන්ට පූජා කළා. මේ විදිහට උන් වහන්සේලාට ඒ ස්ථානයේ වස් වසන්න පහසුකම් සලස්වල සිව් පසයෙන් ඇප උපස්ථාන කරමින් පිං රැස් කර ගත්තා. ඒ අය ඒ පිං බලෙන් දෙව් ලොව ඉපදිලා ලෞකික සැප සම්පත් භුක්ති විඳල ගෞතම බුදුන් වහන්සේගෙ කාලයේ ශාක්‍ය රටේ මහා ප්‍රජාපතී සහ නන්ද කුමාරයා විදිහට ඉපදුණා.

ආරාම පූජාවේ ආනිසංස දක්වෙන කථා බොහොමයක් විමාන වස්තුවෙත් දක්වෙනවා. ආවාස පූජාවේ ආනිසංස පිළිබඳ දැනගත් එක් කාන්තාවක්, තථාගතයන් වහන්සේගේ අනුමැතිය ඇතිව භික්ෂූන් වහන්සේලා ලවා ස්ථානයක් නියම කර ගෙන, ආරාමයක් ගොඩ නගල ආරාම භූමියේ අඹ පැල රෝපණය කරල නොයෙක් ආකාරයෙන් ආරාමය සරසල පූජා කළ බව අම්බ විමාන වස්තුවේ දක්වෙනවා. ඒ සිදු කර ගත්ත පුණ්‍ය ශක්තියෙන් දෙව් ලොව ඉපදිලා අලංකාර දිව්‍ය ප්‍රසාදයකුත්, අඹ උයනකුත් ලැබුණු බව ඉහත කථාවෙන් කියවෙනවා.

උපස්සයදායක විමාන වස්තුවේ



එක් දිනකට භික්ෂුවකට සේනාසන පහසුකම් ලබා දීමෙන් ලැබුණු පුණ්‍ය විපාකයේ ස්වභාවය විස්තර වෙනවා. බුදු රජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයේ වැඩ වාසය කරද්දී, එක්තරා භික්ෂූන් වහන්සේ නමක් ගමක වස් වසල වස් පවාරණය කරල බුදුන් වහන්සේ හමුවෙන්න රජගහ නුවරට වඩින අතර මගදී, හවස් වෙච්ච නිසා එක්තරා ගමකට ඇවිත් රාත්‍රී භාගයේ වාසයට තැනක් සොයමින් එක උපාසකයෙක් දැකල, පිංවත මේ ගමේ පැවිද්දන්ට වාසය කරන්න සුදුසු තැනක් තියෙනවද කියල ඇහුවා.

ඒක අහපු උපාසක මහත්තය ස්වාමීනි, මඳක් නවතින්න කියල ප්‍රසන්න සිතින් තමන්ගෙ ගෙදරට ගිහින් භාර්යාව සමග මේ කතාව කියල, උන් වහන්සේට වාසය කරන්න සුදුසු තැනක් පරීක්ෂා කරල ආසනයක් පනවල, පා සෝදන්න පැන් ආදිය තියල තෙරුන් වහන්සේ වෙතට ඇවිත් වැඳල ආරාධනා කරල වැඩමවල පා සෝදල පහන් දල්වල, ඇඳට ඇතිරිලි අතුරල උන් වහන්සේට පිළිගැන්නුවා. ඊට පස්සෙ දෙවෙනි දවසටත් දානයට ආරාධනා කරල දානය පිළිගන්වල, ගිලන් පස සඳහා උක් සකුරු පිඬකුත් පිළිගන්වල, උන් වහන්සේ වඩින කොට පසුපසින් ගමන් කරල නැවතුණා.

මේ උපාසකතුමා පසු කාලෙක තමන්ගෙ භාර්යාව සමගම කාලක්‍රියා කරල තව්තිසා දෙව් ලොව මහා සම්පත්තියක් සහ සිය දහස් ගණන් දිව්‍ය පිරිස සමග පිරිවරා ගෙන දොළොස් යොදුන් රන් විමානයක ඉපදුණා. මුගලන් මහ රහතන් වහන්සේ දේව චාරිකාවේ වඩින කොට ඒ දිව්‍ය විමානයට වැඩල, මේ වගේ දිව ඉසුරු ලබන්න, පෙර කරපු පින මොකක්ද කියල ඇහුවම, තමන් විසින් මිනිස්ව ඉඳෙද්දී කරපු ආවාස දාන පිංකම මුගලන් හිමියන්ට පැහැදිලි කළා.

විසාකා උපාසිකාව විසිහත් කෝටියක් ධනය වි යදම් කරල පූර්වාරාමය හදල බුදුන් ප්‍රධාන මහා සංඝයාට පූජා කළා. මේ ආරාමයේ භූමිය මිලදී ගන්න කෝටි 9 කුත්, විහාර කර්මාන්තයට කෝටි 9 කුත්, විහාර පූජා කරන දාන පිංකමට කෝටි 9 කුත් වශයෙන් කෝටි 27 ක් වියදම් කළ බව සඳහන් වෙනවා. විසාකාවගේ යෙහෙළියක්, මමත් මේ ආරාම පූජාවට සම්මාදන් වෙන්න ඕන කියල, දහසක් අගනා පලසක් සකස් කර ගෙන ඇවිත්, තමන් හදපු පලස බුමුතුරුණක් විදිහට මේ ආරාමෙ අතුරන්න කැමති බව විසාකාවට කියා සිටියා. විසාකාව මේ පලස බලල, ඒක වටින්නෙ නෑ කියල කිව්වොත් ඇය කලකිරෙයි කියල හිතල, ඒ ස්ථානයේ තියෙන අනෙක් පලස්වලට වඩා නොවටිනා බව ඇයටම තේරුම් ගන්න මේ විදිහට කිව්වා.

මේ ආරාමෙ දහසක් ගබඩාවන් බලල මේ පලසට වඩා අඩු වටිනාකමක් ඇති පලසක් දැක්කොත්, ඒ පලස ඉවත් කරල ඔබගේ පලස අතුරල පිං සිද්ධ කර ගන්න.

මේ තැනැත්තිය දහසක් ගබඩාවල ඇවිදල වටිනා බුමුතුරුණු බලල, තමන්ගෙ පලස වටිනාකමින් අඩු බව දැන ගෙන නැවත ඇවිත්, මේ වටිනා පින්කමට මට දායක වෙන්න හැකියාවක් නෑ කියල අඬ අඬා මළුවේ හිටියා.

ඇගේ ඇඬීම දැකපු ආනන්ද හාමුදුරුවො, මේ මහා පූජාවක් කරන අවස්ථාවෙ මොකට අඬනවද කියල අහල, ඔබේ පලස අතුරන්න තැනක් මම දන්නව කියල, විසාකාවත් නොසලකපු තැනක් දකල, ආරාමයට ඇතුල් වෙන දොරටුවේ සඳකඩ පහන ළඟ පාපිස්සක් විදිහට අතුරන්න කියල දැනුම් දුන්නා. මේ විදිහට පූර්වාරාම පූජාව හාර මාසයක් තිස්සේ සිදු කළ බව සඳහන් වෙනවා.

අනේපිඬු සිටුතුමා අමතල බුදුන් වහන්සේ මේ විදිහට දේශනා කරනවා. ගෘහපතිය, පෙර සිදු වූ දෙයක් කියමි. පෙර වේලාම නම් බ්‍රාහ්මණයෙක් විය. ඔහු මෙබඳු දානයක් දුන්නේය. රිදී පිරවූ රත්රන් පාත්‍ර අසූ හාර දහසක්, රත්රන් පිරවූ රිදී පාත්‍ර අසූහාරදහසක්, අමු රන් පිරවූ රන් පත්‍ර අසූ හාරදහසක්, රනින් සැරසූ රන් දද, රන් රසු දැලින් ගැවසුනු ඇත්තු අසූ හාරදහසක්, සිංහ, ව්‍යාඝ්‍ර, දිවි සම් පඬුවන් කම්බිලිවලින් අතුරන ලද රන් දද, රන්රසු දැල් ඇති රථ අසූහාර දහසක්, මාණික්‍යමය කුණ්ඩලාභරණ පැළඳගත් කන්‍යාවෝ දන් දුන්නේය.

කොඳු පලස් සුදු ඇතිරිලි, සණ පුප් එළු ලොම් ඇතිරිලි, අතුරන ලද කෙසෙල් මුවන්ගේ සමින් කළ උතුම් පසතුරුණු ඇති, උඩු වියන් සහිත දෙපස තබන ලද රතු කොට්ට ඇති, සූඅසූ දහසක් සිඳිනා ආසන දන් දෙන ලදී. සියුම් කොමු පිළි, සියුම් කෝසෙය්‍ය පිළි, කපු පිළි, සූඅසූ දහසක් දන් දුන්නේය. ආහාර පාන, කැවිලි පෙවිලි ගැන කවර කතාද ? ඒවා මහා ගංගා මෙන් ගලා ගියේය.

ගෘහපතිය, එසමයෙහි වේලාම බමුණා අනෙකෙක්මය, මහා දානය දෙන ලද්දේ ඔහු විසින්ය යනුවෙන් ඔබට සිතෙන්නට පුළුවන. එසේ නොසිතිය යුතුය. එකල වේලාම බ්‍රාහ්මණ මමයි, ඒ මහා දානය දෙන ලද්දේ මා විසින්මය.

ගෘහපතිය ඒ මහා දානයෙහි දක්ෂිණාර්හ කිසිවෙක් නොවීය. කිසිවෙක් ඒ දානය පිරිසිදු නොකළේය. ගෘහපතිය, වේලාම බමුණා සත් අවුරුදු සත් මසක් යම් මහා දානයක් දුන්නේද, යමෙක් එක සෝවාන් පුද්ගලයෙකු වළඳවන්නේද, එය ඒ මහා දානයට වඩා මහත්ඵල වන්නේය.

සෝවාන් පුද්ගලයන් 100 දෙනෙකුට දෙන දානයට වඩා එක සකදාගාමී පුද්ගලයෙකුට දෙන දානය, සකදාගාමී 100 දෙනෙකුට දෙන දානයට වඩා එක අනාගාමී කෙනෙකුට දෙන දානය, අනාගාමී 100 දෙනෙකුට දෙන දානයට වඩා එක අරිහතුන් වහන්සේ නමකට දෙන දානය, අරිහතුන් වහන්සේලා 100 දෙනෙකුට දෙන දානයට වඩා පසේ බුදු රජාණන් වහන්සේ නමකට දෙන දානය, පසේ බුදුවරු 100 නමකට දෙන දානයට වඩා ලොව්තුරා බුදුවරයෙකුට දෙන දානය, ලොව්තුරා බුදුවරයෙකුට දෙන දානයට වඩා බුද්ධ ප්‍රමුඛ සඟ සතු කොට දෙන දානය මහත් අනුසස්ය.

මේ සියළු දානයන්ට වඩා සතර දිගින් වඩින සංඝයාට ආවාසයක් කර පූජා කිරීම මහත් ආනිසංස දායකය. ආවාස දානානිසංසයටත් වඩා යමෙක් ධර්මය ශ්‍රවණය කර, චතුරාර්ය සත්‍යය අවබෝධයෙන් තෙරුවන් සරණ යයිද එය ඊටත් වඩා ආනිසංසදායකය. යමෙක් තිසරණ සහිත පංච සික්ෂා ආරක්ෂා කරනවා නම් එය ඊටත් වඩා අනුසස්ය.

යෝච අන්තමසෝ ගන්ධූහන මත්තම්පි මෙත්තං චිත්තං භාවේති තතෝ මහප්ඵලතරං - යමෙක් සුවඳ දෙයක් සිඹින තරම් වෙලාවක් ආයෑ මෙත් සිතක් වඩයිද එය ඊටත් වඩා උත්තමය. යෝච අච්ඡරාසංඝාත මත්තම්පි අනිච්ච සඤ්ඤං භාවෙය්‍ය ඉදං තතෝ මහප්ඵලතරං



(අංගුත්තර නිකාය වේලාම සූත්‍රය) ගෘහපතිය, මෙත් සිතක් වැඩීමට වඩා අසුරු සැණක් ගහන තරම් වෙලාවක් ලෝකයේ නිස්සාරත්වය වටහා ගෙන අනිච්ච සඤ්ඤාව වඩයිද මෙතෙක් කියූ සියළු පිංකම්වලට වඩා මහත්ඵලතරය.

මීට වඩා අනුසස් සහිත තවත් දෙයක් කරන්න, මේ බුද්ධ සාසනයේ පෙන්වා වදාළ තැනක් නෑ. මේ පිංකම් වට්ටෝරුව අතර සියළු ආහාර දානයන් පරදවල ආවාස දානය ඉදිරියෙන් තියෙනවා.

පසු කාලීන ආචාර්යවරු විසින් පෙන්වා තියෙන මහා පිංකම් අට අතරටත් ආවාස පූජාව සඳහන් කරල තියෙනවා. ''රුක්ඛ මූල සේනාසනං නිස්සාය පබ්බජ්ජා තත්‍ථ තේ යාවජීවං උස්සාහෝ කරණීයෝ'' භික්ෂුවගේ පැවිද්ද යනු රුක්ඛ මූල සේනාසනයයි. අනිකුත් ලැබෙන පහසුකම්, සෙනසුන් අතිරේක ලාභයක් පමණි. ඒ නිසා දිවි ඇති තෙක් රුක් මුල් සේනාසනය පැවිද්දේ ප්‍රධාන නිශ්‍රය හතරට අයිති අංගයක් විදිහට සලකා කටයුතු කිරීම ප්‍රසංසනීයයි.

භික්ෂූන්ගේ සේනාසන විදිහට ඈත අතීතයේ පටන්ම ගල් ලෙන් භාවිතා කරල තියෙනවා. සිතුල් පව්ව, අරන් කැලේ වගේ වන සෙනසුන්වල දොලොස් දහස බැගින් භික්ෂූන් වහන්සේලා, මහරහත් උතුමන් වැඩ වාසය කරල තියෙනවා. අතීත රජ දරුවන්, ඇති ඇමතිවරුන් විසින් කටාරම් කොටල සෙල් ලිපි පිහිටුවල සංඝයාට පූජා කරපු ලෙන් ලක්දිව පුරා දකින්න තියෙනවා. අදටත් ලංකාවේ බොහෝ ආරණ්‍ය සේනාසනවල කටාරම් සෙල් ලිපි සහිත ගල් ලෙන් දකින්න තියෙනවා. ඒ අතර වාසය කරන්න සුදුසු ආකාරයෙන් සකස් කරපු සමහර ඒවායේ අදටත් භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කරනවා. ගෞතම බුදු රජාණන් වහන්සේට, කෝණාගම, කාශ්‍යප බුදු පියාණන් වහන්සේලාට, පසේ බුදු රජාණන් වහන්සේලාට වගේම භික්ෂු, භික්ෂුණී ශ්‍රාවක සංඝයාට පූජා කරපු ලෙන් පවා දකින්න තියෙනවා.

බුදු රජාණන් වහන්සේලා වගේම සංඝ රත්නයේ නම් සඳහන් මේ වගේ සෙල් ලිපි සහිත ලෙන් පූජාවන් ලෝකයේ කිසිම රටකින් මෙතෙක් හමු වෙලා තියෙන බවක් සඳහන් වෙන්නෙ නෑ. ලංකාව තුළ බුද්ධාදී උතුමන්ට, සංඝ රත්නයට පූජා කරල තියෙන ඒ වගේ ලෙන් සහ සෙල් ලිපි රාශියක් මේ වෙන කොටත් සොයා ගෙන තියෙනවා. එයින් කීපයක් මේ විදිහට දක්වන්න පුළුවන්.

1. භගවත ගොතම ශමණෙ මොගලි පුත තෙරහ, ශරිපුත තෙරහ, පුශ තෙරහ, පුන තෙරහ, ශදි විහරිය අගත අනගත චතුදිශ ශගශ දිනෙ පරුමක අබය පුත පරුමක එරක (ගෝනගල සෙල් ලිපිය)

ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ, මුගලන් තෙරුන්, සැරියුත් තෙරුන්, පුශ තෙරුන්, පුණ්ණ තෙරුන් වැඩ සිටි තැන් ආවා වූ, නොආවාවූ සතර දිසාවේ සංඝයාට අබයගේ පුත් එරක විසින් පූජා කරන ලදී.

2. ගොතම ශමණෙ බඩගරික අනද තෙරශව, පුන තෙරශ පුශ තෙරශ අගමගශ ලෙණෙ මනපදශන නම අගත අනගත චතුදිශ ශගශ (දඹුල්ල සෙල් ලිපිය)

ගෞතම ශ්‍රමණයන් වහන්සේ, ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන්, පුණ්ණ තෙරුන්, පුශ තෙරුන් වැඩ සිටි මනාපදර්ශන ලෙන සතර දිගින් වඩින සංඝයාට පූජා කරන ලදී.

3. පරුමක අභය පුත තිශහ නවිකහ ලෙණෙ ගොතම ශමණෙ කරපිතෙ. (හඳපාන්විල්ලුව සෙල් ලිපිය)

ගෞරවනීය අභයගේ පුත් තිස්ස නම් නාවිකයාගේ ලෙන ගෞතම බුදු හිමි උදෙසා කරවන ලදී.

4. බත තිශ ගුතහ ලෙණෙ ගොතම ශමණෙ කරපිතෙ

(ගලගෙදර භගවා ලෙන)

ගෝල තිස්සගේ ලෙන් පූජාව ගෞතම ශ්‍රමණයන් වහන්සේටය.

5. චොරකිය මහ රඣහ මහ ලෙණේ ගොතම ශමණෙ පතිටපිතෙ. (මුල්ලුකොඩුලුමලෙයි සෙල් ලිපිය) චොරකිය මහ රජු ගෞතම ශ්‍රමණයන් වහන්සේට පූජා කළ ලෙන

6. උපශක පුඩශහ ලෙණෙ ගොතම ශමණෙ දිනි පරුමක වෙලහ ච වණ ගමික වණ තිශහ ච ගමික වලුහ ච උපලය පතිටපිතෙ (වඩිනාගල සෙල් ලිපිය)

උපාසක පුඩශගේ ලෙන ගෞතම බුදු හිමිට පූජා කරන ලදී

7. ගපති තිශ පුත පරුමක උතරශ ලෙණෙ ගොතම නම ශමණෙ පතිටපිතෙ (වඩිනාගල සෙල් ලිපිය)

ගෘහපති තිස්සගේ පුත් උතුරාශ විසින් ගෞතම බුදු හිමිට පූජා කළ ලෙන

8. ගහපති පුත තිශ පුතන දො බතිකන ලෙණෙ ගොතම නම ශමණෙ කරපිතේ (දීඝවාපි කලිඞ්ඩන් සෙල් ලිපිය)

ගෘහපති පුත් තිස්සගේ පුත දෙසොහොයුරන්ගේ ලෙන ගෞතම බුදුරදුන්ට පූජා කරන ලදී.

9. බමණ මිශ කුට ගොතම ශමණෙ අගත අනගත චතුදිශ ශගශ (දෙකුන්දරා වැව සෙල් ලිපිය)

මිස්ස බමුණාගේ කූටය ගෞතම ශ්‍රමණයන් ප්‍රධාන සතර දිගින් වඩින සංඝයාට පූජා කරන ලදී.

10. පරුමක බත කරික නගකුලහ ගොතමත බව ලෙණෙ

(සිතුල් පව්ව සෙල් ලිපිය) ශ්‍රමණ ගෞතමයන්ට පූජා කළ ලෙනකි.

11. පිත මහරඣහ බඩගරික පරුමක සුමන පුත පරුමක වෙමශලෙණෙ රජතිශහ රඣයශි නියතෙ අගත අනගත භගවත ශගශ

(සිතුල් පව්ව සෙල් ලිපිය)

භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන සතර දිගින් වඩින සංඝයාට පූජා කළ ලෙනක්

12. බගවත ගොතමශ ලෙණෙ තිශ පුතහ කරපිත (තියුගුණකන්‍ද සෙල් ලිපිය)

තිස්සගේ පුත්‍රයා විසින් භාග්‍යවතුන් වහන්සේට කරවූ ලෙන

13. රඣ, නග, ඣිත, රජ, උති, ඣය, අබි, අනුරදිච, රඣ උතිච

''කරපිත ශෙ ඉම ලෙණ චතුදිශ ශගශ අගත අනගතන පශු විහරතයේ අපරිමිතෙ ලොක දතුය ශතන ශිත ශුකයෙ''

නාග රජුගේ දියණිය වූ උති රජතුමාගේ බිරිය වූ අනුරාදි කුමරිය හෙවත් රැජින සහ රජතුමා වූ උති සමග එකට එකතු වී කරවන ලද ගල් ලෙන් විහාරය අපරිමිත ලෝකය දන්නා වූ බුදුරජුන් ප්‍රධාන සිව් දිගින් වඩින සංඝයාට පුදන ලදී.

14. පරුමක ශුමන කුට ගොතම ශමණෙ අගත අනගත චතුදිශ ශගශ (බෑන සමනල සෙල් ලිපිය)

ගෞරවනීය සුමන විසින් කූටය (සමනල කන්ද) ගෞතම බුදු හිමි ප්‍රධාන සිව් දිගින් වඩින සංඝයාට පූජා කරන ලදී.

15. ගපති තොපශ ලෙණෙ ගොතම ශමණෙ පතිටපිතෙ

ගෘහපති තොපශගේ ලෙන ගෞතම බුදු හිමි උදෙසා කරවන ලදී.

16. පරුමක ශමුදහ ලෙනෙ කෝණගම නම කරපිතෙ (ගල්ගමුව කදුරු වැව සෙල් ලිපිය)

කෝණාගම බුදු හිමිට කරවූ ලෙනක්

17. කශබ බුදහ මඩමතයෙ (මාදුරු ඔය අල්වා කුඹුර සෙල් ලිපිය)

කාශ්‍යප බුදුරදුන්ගේ නම සඳහන් සෙල් ලිපියක්

18. කශබ බුදහ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ (වෙස්සගිරිය සෙල් ලිපිය)

කාශ්‍යප බුදු හිමි ප්‍රධාන සංඝයාට පූජා කළ ලෙන

19. පචෙක බුදහ කණහ ලෙණෙ - කණ්හ නම් පසේ බුදු හිමි වැඩ සිටි ලෙන.

කණ්හ පසේ බුදු හිමි ගැන ඉසිගිලි සූත්‍රයේ මේ විදිහට සඳහන් වෙනවා. කණ්හෝච බුද්ධෝ සුවිමුත්ත චිත්තෝ

20. දශවන පචෙක බුදහ ථුපෙ - දසවැනි පසේ බුදුන්ගේ ධාතු චෛතිය ඉසිගිලි සූත්‍රයේ දසවැනි පසේ බුදු හිමි ලෙස දක්වා ඇත්තේ ''නීත'' නම් පසේ බුදුරජුන්ය.

21. බඩගරික අනද තෙරශ ලෙණෙ ශගශ (බ්‍රාහ්මණයාගම සෙල් ලිපිය)

ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන් වැඩ සිටි ලෙන සංඝයාට පූජා කරන ලදී.

22. පුන තෙරහ ශදිවිහරිය බත සගරකිතහ ලෙණෙ ශගශ (සිතුල් පව්ව සෙල් ලිපිය)

මන්තානි පුත්ත පුණ්ණ හිමිගේ සද්ධි විහාරික සංඝරක්ඛිත තෙරුන් වැඩ සිටි ලෙන සංඝයාට පූජා කරන ලදී.

23. අනුරුද තෙරහච ශරිපුත තෙරහ ශදිවිහරිය ගොතම ශමණෙ ඩගලදරපු

දිවැස්ලාභී අනුරුද්ධ තෙරුන්, සාරිපුත්ත තෙරුන්, ගෞතම බුදුහිමිගේ නම් සඳහන් සෙල් ලිපියක්

24. අනද තෙරශ ශදිවිහරියන ලෙණෙ (දඹුල්ල සෙල් ලිපිය)

ආනන්ද තෙරුන් වැඩ සිටි ලෙන

25. උතපල ශමණිය ලෙණෙ ශගශ

උත්පලා තෙරණිය වැඩ සිටි ලෙන සංඝයාට පුදන ලදී.

26. ශොණ ශමණිය ලෙණෙ ශගශ

ශෝණ තෙරණිය වැඩ සිටි ලෙන සංඝයාට පුදන ලදී.


27. නගදතහ

නාගදත්ත තෙරුන් වැඩ සිටි ලෙන - දඹුල්ල

**කිවුල්දෙණියේ විජිතනන්ද හිමි**
**නිග්‍රෝධාරාම සේනාසනය, පොල්පිටිය,**
**මැටිකුඹුර, පොල්ගහවෙල**

අභයරතනාලංකාරය - 48

# පෙර ඇත් බැවක සිවුරු හැර වෙසඟනක් සමග ගිය විපාකය...



(පසුගිය කලාපයෙන් - සත්ව හිංසනය ගැන ඇති වූ දයානුකම්පාව නිසා පාදයේ තුවාලය සුව වූ හැටි...)

**- වහරක අභයරතනාලංකාර හිමි**

අපි මේ දීර්ඝ සංසාර ගමනේ යන කොට හොඳ නරක දෙකම සිද්ධ කරනවා. වැඩිපුරම යොමුවෙන්නෙ හොඳ පැත්තට වඩා නරක පැත්තට. පාරමිතා පුරන බුදු, පසේ බුදු, ශ්‍රාවක වගේ බෝධිසත්වයින් හැර අනිත් අය බහුතරයක් යොමු වෙන්නෙ නරක පැත්තට. ඒ හේතුව නිසාම මැරෙන බහුතරය සතර අපායෙ උප්පත්තිය ලබනවා. පාරමිතා පුරන බෝසත්වරුත් මේ දීර්ඝ සංසාර ගමන අතර මග නොයෙක් පාපකාරී කටයුතුවලට යොමු වෙලා සතර අපාගත වෙච්ච අවස්ථා වගේම, නැවත මනුස්ස අත්බැව් ලබලත් ඒවායේ විපාකයන්ට ගොදුරු වෙච්ච අවස්ථා ඕනෑ තරම් දහමේ සඳහන් වෙනවා. ශ්‍රාවක පාරමිතා පුරන අයට විතරක් නෙවෙයි, ලොව්තුරා බුදු වෙන්න පාරමිතා පුරන අයටත් ඒ වගේ අවස්ථාවන්ට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ තමයි මේ සංසාරයේ හැටි.

මේ වෙන කොටත් සැඟව ගිය මහා ධර්මස්කන්ධයක් මතු කරමින් සිටින වහරක අභයරතනාලංකාර හිමියන් පෙර අත්බැව්වල කරපු අකුසල කර්ම නිසා සතර අපාගත වෙච්ච අවස්ථා වගේම, මේ අත්බවයෙත් ඒ සමහර කර්මවල විපාකයන්ට ගොදුරු වෙච්ච අවස්ථා ගැන මීට පෙර මේ ලිපි පෙළින් හෙළිදරවු කිරීමක් කළා. හොඳ පැත්ත විතරක් කියන්නෙ නැතිව ඒ විදිහට නරක පැත්තත් හෙළිදරවු කළේ, මේ සංසාරයේ තියෙන භයානකත්වය අත්දැකීම් සහිතව පෙන්වා දීල, අනිත් අයටත් යම් කිසි උපදේශයක් දෙන්න. එතැනදි ඒ සමහර කාරණා හෙළිදරවු කිරීම තමන්ට මදි පුංචිකමක් කියල හිතන්නෙ නැතිව, තමන්ගෙ අත්දැකීම සැඟවීමකින් තොරව ඒ විදිහටම පෙන්වා දෙන්න උන් වහන්සේ පසුබට වුනේ නෑ. දැන් මේ හෙළිදරවු කරන්න යන්නෙ, මේ සසර ගමනේ පෙර අත්බවයක උන් වහන්සේ අතින් සිද්ධ වෙච්ච තවත් වරදක් නිසා විපාකයක් ආපු හැටි. කලින් හෙළිදරවු කළා වගේ සතර අපාගතවීම් හෝ කායික වේදනා විඳින්න තරම් ඒ කාරණය බරපතල නොවුනත්, ඒකත් යම් කිසි ආකාරයක විපාකයක්. ඒ තමයි මේ මාතෘකාවෙන් හෙළිදරවු කරල තියෙන කථා වස්තුව. ඒ කාරණය උන් වහන්සේ මේ විදිහට හෙළිදරවු කළා.

මේ කියන්නෙ මීට අවුරුදු 2300 කට විතර එහා වෙච්ච සිද්ධියක්. ඒ කියන්නෙ අර මී හරක් අත්බැව් 4 ක් ලැබුවටත් පස්සෙ. ඉතින් ඒ සිද්ධියෙන් පස්සෙ මම ලබපු මනුස්ස අත්බැව්වලින් මහණ දම් පුරපු අවස්ථාත් කිහිපයක් තිබුණා. මේ සිද්ධිය වුනේ මම උපසම්පදා භික්ෂූන් වහන්සේ නමක් විදිහට ඉන්න කාලයක. ඒ කාලයේ එක්තරා වෙසඟනක් හිටියා. ඇය වෘත්තියෙන්ම වෙසඟනක්. හැබැයි ඒ වෙසඟන බලාපොරොත්තු වුනේ, ඒ වෘත්තිය කරල නිකම්ම කීයක් හරි හොයාගෙන ජීවත් වීම නෙවෙයි. ස්වාමියෙක් එක්ක ඉන්න විදිහක චිත්ත ස්වභාවයක් තමයි ඇයට තිබුණෙ. ඒ කියන්නෙ නිකම්ම මනුස්සයෙක් කාමයට නැඹුරු කරන්නෙ නැතිව, තමන්ගෙ ආත්ම ලාභය තකා දයානුකම්පාවක්, උදව් උපකාරයක් ඒ මිනිස්සුන්ගෙන් ඇය බලාපොරොත්තු වුණා. නමුත් ඇය ඇසුරට ආපු මිනිස්සු අතර එහෙම දයානුකම්පාවක් තිබ්බෙච, උදව් උපකාර කරන අය හිටියෙ නෑ.

ඉතින් මගේ ස්වභාවය දැකල, මා කෙරෙහි ඇයට ඒ වගේ උදවු උපකාර කරයි කියල හැඟීමක් ඇති වුණා. එහෙම ඇති වුනාට පස්සෙ එක අවස්ථාවක තමන්ගෙ අදහස් මට හැඟෙව්වා. හැබැයි එක පාරටම නිකම්ම හැඟෙව්වෙත් නෑ. ඒකටත් එක්තරා උපක්‍රමයක් ඇය යෙදුවා. අන්තිමට කොහොම හරි මේ වෙසඟන දින 7 ක් පේ වෙලා ඉඳල ඒ සඳහා සූදානම් වුණා. ඒ කියන්නෙ කන්නෙ බොන්නෙ නැතිව නෙවෙයි, නාල පිරිසිදු වෙලා චිත්ත ප්‍රසාදයෙන් හරියට පෙහෙවත් සමාදනයකින් වගේ ඉඳල තමයි ඔය අදහස ඉදිරිපත් කළේ. මොකද එහෙම නැතිව නිකම්ම ඇහුවොත් මම අකමැති වෙයි කියල. ඒකටත් ඉතින් මොනව හරි සසර හේතු / පුරුදු තියෙන්නත් ඇති. එතකොට තමයි ඒ වගේ අදහස් එන්නෙ. මම එතකොට සම්මතයෙන් උපසම්පදා භික්ෂුවක්. ඉතින් සසර පුරුදුවල හැටි කියන්නෙ, ඒ අවස්ථාවෙදි මම උපසම්පදාවත් ප්‍රතික්ෂේප කරල ගිහි වතකට සම්බන්ධ වෙලා ඇයත් එක්ක විවාහ වුණා. හැබැයි නිකම්ම සිවුර පිටින් ගියා නෙවෙයි, ඒ කාලෙ තිබ්බෙච ධර්මානුකූල ක්‍රමයකට සිවුරු හැරල තමයි එහෙම ගියේ. මොකද ස්වභාවයෙන් එහෙම ඕන කෙනෙකුට සිවුරු හැරල යන්න පුළුවන්. හැබැයි උපසම්පදා භික්ෂුවක් නියම විදිහට සිවුරු හැරල යනව නම්, තවත් උපසම්පදා භික්ෂූන් වහන්සේ නමක් ඉදිරියේ උක්කුටිකයෙන් ඉඳල උපසම්පදාව බහා තබමි, සාමණේර හෝ ගිහි වතකට බහිමි කියල තුන් වතාවක් කියල දණ ගහල ඉවත් වෙන්න ඕන. ඒ වගේම නැවතත් උපසම්පදා වෙනව නම්, සංඝ මණ්ඩලයක් ඉදිරියේ විනය නීති අනුව සිද්ධ වෙන්න ඕන.

ඉතිං සාසන වරදක් කියල දෙයක් ඒ අවස්ථාවෙදි සිද්ධ වුනේ නෑ. මොකද පාරාජිකා වෙලා ගියා නෙවෙයි. එහෙම පාරාජිකා නොවෙන්නත් ක්‍රම තියෙනවා. මොකද මම ගියේ ත්‍රිවිධ දුෂ්චරිතයෙන් වෙන් වීමේ පිහිටල. ඒ කියන්නෙ හිතින්, කයින් යමක් වැරදි නම් ඒක වැරදියි කියල දැකල කල්පනා කරල බලල වරද අත හරිනවා. ඉතින් උපසම්පදා සීලයක පිහිටල ඒකෙන් අහක් වෙන කොට ඊළඟට පහලින් තියෙන එකක තමයි පිහිටන්නෙ. නමුත් සසර ස්වභාවය නිසා සිවුරු හැරල ☞

ගියා. ත්‍රිවිධ දුෂ්චරිතයෙන් වෙන් වෙලා යන ගමනක්ම තමයි මේ යන්නෙ. දැන් මම දස සික්ෂාව පොත්වලින් බැලුවට ඕව කට පාඩම් කර ගෙන රකින්න යන්නෙ නෑ. මේ අත්බවය ගත්තත් දස සිල් කියන එක ගත්තෙ එදා මම මහණ කරපු දවසෙ විතරයි. ඊට පස්සෙ අධිෂ්ඨාන කළේ ත්‍රිසික්ෂාව. නමුත් ඒක කිය කියා ගියේ නෑ. ඉතින් ඒ නිසා එදා සිවුරු හැරල ගියත් ඒකෙ වෙන වරදක් තිබුනෙ නෑ. නමුත් ඒ සිද්ධියෙන් පස්සෙ එදා ඉඳල පැවිදි වෙච්ච අත්බැව්වල උපසම්පදා වෙන්න බැරි වුණා. මේ අවුරුදු 2300 ක් ඇතුලත පැවිදි වෙච්ච හැම අවස්ථාවකම සාමණේර විතරයි. සම්මතයෙන් උපසම්පදා වෙන්න අවස්ථාවක් ලැබුනෙ නෑ. කොහොම හරි වළකිනවා. මේ අත්බැවෙත් ඒ වගෙයි. පොඩි කාලෙ ඉඳන් මහණ වෙන්න අදහස තිබුණත්, මැදි වයසත් පන්නල අවුරුදු 55 දි තමයි ඒ අවස්ථාව ලැබුණෙ. ඒ අතර විවාහයකුත් සිද්ධ වෙලා දරු මල්ලනුත් ලැබුණා. ඒකත් ඉතින් කර්ම වේගවල හැටි තමයි. ඒ ආපු විදිහෙ මොනව හරි ක්‍රම රටාවක් තියෙනවා. ඒ සම්බන්ධයෙන් අත්දැකීම් තියෙන්නෙ ඒ නිසා. අත්දැකීම් සහිතව යන ගමනක් මිසක් කවුරුවත් කියන එකක් අහල යන ගමනක් නෙවෙයි මට තියෙන්නෙ. ඒක සසරෙ එදා ඉඳන්ම එහෙමයි. ක්‍රමයෙන් අත්දැකීම් ලබ ලබා යන ගමනක්.

හැබැයි මීට අවුරුදු 700 - 800 ක විතර ඉඳල ඒ අත්දැකීම් කොච්චර ලැබුවත් ගති වෙනස් වෙන්නෙ නෑ. ඒ කියන්නෙ දේව මනුස්ස දෙගතියෙන් පහළට වැටෙන්නෙ නෑ. නමුත් උපසම්පදා නොවුනයි කියල මට ගැටළුවක් නෑ. මොකද ඒකායන අරමුණ නිවන් දැකල මේ සංසාර ගමන කෙළවර කිරීම නිසා. ඉතින් සම්මතයෙන් උපසම්පදා නොවීම නිවනට බාධාවක් නෙවෙයි. හැබැයි මෙතන යන්නෙ වෙනස් ක්‍රමයක්. අපි කොච්චර හිතුවත් මේ සසර ගමන අද අදම ඉවර කර ගන්න ඕන කියල, එහෙම ඉවර වෙන්නෙ නැති වෙන්න හේතුවන ක්‍රමයක් සසරින් එනවා. ඒ නිසා අපිට කරන්න දෙයක් නෑ. මේ ලෝක ස්වභාවය දැකල එපා වෙලා, මට නම් මේ වගේ සසරක් / මනුස්ස ලෝකයක් ඕනම නෑ කියල කිව්වත්, එතකල් පූර්ණ කරපු යම් කිසි ප්‍රාර්ථනාවක් පෙරදැරි කර ගත්තු පාරමිතා ශක්තියක් තියෙනව නම්, ඒකෙන් තමන් දන්නෙම නැතිව තමන් මෙහෙයවනවා.

ඉතින් මට වුනත් ඒ නියමිත කාලය එන කල් බුද්ධ ශ්‍රාවකයෙක් වගේ කොච්චර හිටියත්, සසර ගමන ඉවර කර ගන්න තැනට එන්න හැකියාව ලැබුනෙ නෑ. මොකද ඉදිරි අනාගතයේ (මේ අත්බැවේ) කරන්න විශේෂ කටයුත්තක් තියෙන නිසා. ඒ කාලය එනකල් ශ්‍රාවකත්වය පූර්ණ කරන්න බෑ. ඒක අතර මග කඩාකප්පල් වෙනවා. එතනදි සෘෂි පැවිද්ද කියල එකක් තියෙනවා. කොච්චර උත්සාහ කළත් ඒ නියමිත අවස්ථාව එනකල් බොහෝ කොටම එහෙම පැවිද්දකට තමයි කොටු වෙන්නෙ. ලෝක සම්මතයේ පැවිදි වතක හිටියත් ඒ වගේ වතකට තමයි අහු වෙන්නෙ. හැබැයි මේ කියන්නෙ මේ අත්බැවේ මහණකම ගැන නෙවෙයි, පෙර අත්බැව්වල තත්ත්වයන්.

ඉතින් මේ ලෝක සම්මතයේ පැවිදි වුනාට පාරාජිකා වෙච්ච කෙනෙකුට සම්මත උපසම්පදාව නෑ. ඒ වගේ භික්ෂූන් වහන්සේ නමක් විසින් තව කෙනෙක් මහණ කළොත් ඒක හරියට මුල සිඳිච්ච තල් ගහක් වගේ. උපසම්පදා වුනත් අවුරුදු 10 ක් යන්න ඕන සාමණේර භික්ෂූන් වහන්සේ නමක් හදා ගන්න. නමුත් ඒ කාරණය සාසනයේ පැවැත්ම යනකොට කාලානුරූපීව වෙනස් වෙනවා. මොකද කාසාව කණ්ඨක තත්ත්වයට එන කල් බුද්ධ ශ්‍රාවක භික්ෂු කියන හිමිකම තියෙනවා. හරියට හොඳට හදාගත්තු ආයුධය කාලයක් යද්දි මොට වෙනව වගේ, පරණ වෙන්න වෙන්න පන්නරය බහිනව වගේ. ඒ තමයි පැවැත්මේ හැටි. එතකොට බුදුන් වහන්සේ දකිනවා, කාලයෙන් කාලයට සාසනයේ ඇති වන වෙනස. නමුත් ඒක අනිත් අයට කියන එකක් නෙවෙයි. ඉතින් උන් වහන්සේ ඒක දැන ගෙනම තමයි එච්චර කාලයකට යන කල් කාසාව කණ්ඨකයටත් තියෙන සාමණේර, උපසම්පදා හිමිකම ගැන කියල තියෙන්නෙ. නමුත් ඒක අපිට නිගමනය කරන්න බෑ. එදා තිබ්ච්ච සාමණේර, උපසම්පදා තත්ත්වය ඒ වෙනකොට වෙනස්. මූලික ධර්මය අනුව එහෙම වෙනස් වෙන්න බැරි වුනත්, ඒ ඒ කාලයට පවතින තත්ත්වය අනුව පසු කාලීනව එහෙම වෙනස්වීම ස්වභාවයක්. නමුත් ඒ වෙනස්වීම කොහොම සිද්ධ වෙනවද කියල අපි දන්නෙ නෑ. අන්තිමට කහ නූලක් බැඳගෙන ඉඳල ඒකත් කඩා දැම්මට පස්සෙ තමයි ඒ හිමිකම නැති වෙන්නෙ. එතකල් භික්ෂු කියන හිමිකම තියෙනවා. ඉතින් අදත් ලෝක සම්මතයේ උපසම්පදා වෙච්ච භික්ෂූන් වහන්සේලා ඉන්නවා. හැබැයි ඒ අතර හොරකම, කාම මෛථුනය, නැති ගුණ ඇඟවීම සහ මිනීමැරීම කියන සතර පරාජිකාවෙන් එකකට හෝ අහු වෙච්ච අය නැත්ද ? මිනී මැරීම කිව්වම කළල රූපයේ පටන් තුන් කුඩු මහල්ලා දක්වාම අයිති වෙනවා. උත්තරීතර මග ඵල, ධ්‍යාන වගේ තමන්ට නැති ගුණයක් තියෙනව කියල වංචනිකව ඇඟෙව්වොත් ඒකත් පාරාජිකා වෙන්න හේතු වෙනවා. කාට හරි භික්ෂූන් වහන්සේ නමකට ලැබ්ච්ච අට පිරිකරක් උන් වහන්සේට නොදන්වා අරගෙන ගිහින් වික්කොත් ඒකත් පාරාජිකයි. සිවුරක් තරම් දෙයක් නොදන්වා සොර සිතින් ගත්තත් පාරාජිකයි. අද කාලයේ වෙන දේවල් එක්ක බලද්දි මේ සමහර ඒවා මහා ලොකු දේවල් නෙවෙයි. ඒත් ඉතින් ඔය වගේ දේවල්වලට අහුවෙච්ච භික්ෂූන් වහන්සේලා අද නැත්ද ? පාරාජිකා වෙන බවක් නොදන ඕන තරම් සිද්ධ වෙලා ඇති. නමුත් ඒ ගැන දන්නෙ නෑ.



දැන් ඔය අම්බපාලි කියන ගණිකාව ගැන කියන කොට, ඇය මහණ වෙලා අන්තිමට එළියට බහින්නවත් දුන්නෙ නැතිලු. මොකද පැවිදි වුනාට අර අනිත් සල්ලාලයො තරහයි, කරදර කරනවා. ඉතින් ඒ නිසා උපසම්පදා වෙන්න එන්න විදිහක් නැතිව හිටියෙ. ඊට පස්සෙ දූත පිරිසක් අතේ බුදුන් වහන්සේට පණිවිඩයක් යැව්වා. බුදුන් වහන්සේ ඒ අවස්ථාවෙම උපසම්පදා වේවා කියල අධිෂ්ඨාන කරල එතැන ඉඳන්ම උපසම්පදාවත් දුන්නා. අන්තිමට ඇය රහත් වුණා. ඒකට කියන්නෙ දූත මෙහෙවරෙන් දෙන උපසම්පදාව කියල. ඔය විදිහට උපසම්පදා ක්‍රම 8 ක් තියෙනවා. දූතයෙක් මගින් උපසම්පදා කරන්න පුළුවන් ලොව්තුරා බුදු කෙනෙකුට විතරයි. අනික් අය උපසම්පදා භික්ෂූන් වහන්සේලා ඉදිරියේ පෝය සීමාවක ඒක කරන්න ඕන. එතනදි බුදු කෙනෙක් බුදු වෙච්ච මධ්‍ය දේශයත් එක්ක තියෙන ප්‍රදේශයක නම් වීසතිවිද කියල භික්ෂූන් වහන්සේලා 20 නමක් ඉදිරියේ කරන්න ඕන. ප්‍රත්‍යන්ත ජනපදයක (ඈත දුෂ්කර ප්‍රදේශවල) ☞

නම් භික්ෂූන් වහන්සේලා පස් නමක් ඉන්න ඕන. එහෙම ක්‍රමයක් තියෙනවා. ඒවා විනය නීති, බුද්ධ ආඥා. ඒ නීති, ආඥාවන් අනුව ඒවා සිද්ධ කරන්න ඕන. ඒවා කාටවත් වෙනස් කරන්න බෑ.

එතකොට මේ කියන කාලෙ උපසම්පදාව සම්මත වුණා. ඒ සම්මතය තුළ තිබ්බ්ච එකක් මමත් රැක ගෙන හිටියා. නමුත් සසර හැඟීමක් කියල දෙයක් තියෙනවා. ඒකෙන් තමයි අර වෙසඟන කෙරෙහි ලෙන්ගතුකමක් ආවෙ. හැබැයි ඒකත් එක්තරා ආකාරයක කාමයක්ම තමයි. ඉතින් එහෙම දේවල් සිද්ධ වෙච්ච අවස්ථා ධර්මයෙත් සඳහන් වෙනවා. උදාහරණ විදිහට මාරුවෙන් මාරුවට හය වතාවක් සිවුරු හැරල තමන් පෙර හිටපු ගිහි වතට ගිහින් ඒ මුල් අවස්ථා හයේදිම දරුවන් හය දෙනෙක් වදල, නැවතත් ගිහි වත එපා වෙලා මහණකමට ගිහින් අරිහත්වයට පත් වෙච්ච භික්ෂූන් වහන්සේ නමක් ඒ කාලෙ හිටියා. ඒ යන කොටත් උන්වහන්සේ නියම ක්‍රමයකට තමයි යන්න ඇත්තෙ. එහෙම යන කොටත් ත්‍රිවිධ දුෂ්චරිතයෙන් වෙන් වෙලා යන ක්‍රමයක් තියෙනවා. කාලයක් දුෂ්චරිතයෙන් වෙන් වෙලා ඉඳල කාලයකට සීලය හරියට රකිනවා.

සිතින්, කයින්, වචනයෙන් යම් කිසි වරදක් වෙනව නම් මනා සිහියෙන් ඉඳල ඒ වරද, වරද හැටියට දකින්න ඕන. එතනදි කතාව ගත්තොත් වචන නෙවෙයි වරදින්නෙ, පදුට්ඨ මනසකින් කියනවද නැත්ද කියන එකයි වැදගත්. පදුට්ඨ මනසකින් එන වචනවල ස්වභාවය වෙනස්. ඒ වචනවලින් එන ශබ්දයත්, විහිදෙන ශක්තියත් විසයි. නමුත් ඒ වචනම ප්‍රසන්න මනසකින් කිව්වොත් ඒක අර වගේ විස නෑ. උදාහරණයක් විදිහට අම්ම තාත්ත තමන්ගෙ දරුවෙකුට කොච්චර දරුණු විදිහට බැන්නත් ඒක ගානක් නෑ. හැබැයි ඒ වචනම පාවිච්චි කරල පිට කෙනෙක් බැන්නොත් එහෙම ඒකෙන් ලොකු පහරක් වදිනවා. මනසේ තත්ත්වය අනුව ඒක වෙනස් වෙනවා. එක සමාන වචන වුනාට අදහස එන්නෙ වෙනස් විදිහකට. ගැහුවත් එහෙමයි. අම්ම තාත්ත ගැහුව වගේ නෙවෙයි, පිට මිනිහෙක් ගැහුවොත් හරි අමාරුයි, වේදනා වැඩියි. එතකොට මොනවද කියන්නෙ, අවවාදයක් අනුසාසනයක් දෙන්නද කියන්නෙ කියල බලන්න ඕන. එහෙම නැත්නම් තුච්ඡ, නින්දිත අදහසක් මුල් කර ගෙන ආපු වචනයක්ද කියල බලන්න ඕන. එතනදි දයානුකම්පාවක් ආවොත් ඒක තමයි ආදරයක් වෙන්නෙ. ඒ කියන්නෙ ආධාරයක් මිසක් තමන්ගෙ වැඩේ විතරක් කර ගන්න කාමුකත්වයක් නෙවෙයි. ඒ නිසා තමයි මටත් සිවුර දාල යන්න හිතුනෙ. හැබැයි එහෙම වෙලත් විපාකයක් ආවා. ඒකත් විශේෂ දෙයක්. මම හරියටම දන්නෙ නෑ ඒක මොන වගේ එකක්ද කියල. මොකද බුද්ධ සාසනයේ පැවැත්මට සම්මත උපසම්පදාව කියල පිළිගත්තු ක්‍රමයක් තියෙනවා. හැබැයි කුසලස්ස උපසම්පදා කියන පරමාර්ථ උපසම්පදාවෙන් තමයි නියම බුද්ධ ශ්‍රාවකත්වයක් හිමි වෙන්නෙ. ඒකට සම්මත උපසම්පදාව අවශ්‍ය නෑ. සිවුරෙ හිටියත් නැතත් ඒක තියෙනවා. ඉතින් මොනව හරි විශේෂත්වයක් කරා තමයි මේ යන්නෙ. එහෙම විශේෂත්වයක් මේ කාලෙ වෙන්න තියෙන නිසාම තමයි ඒ කාලෙ අර විදිහට දෙයක් සිද්ධ වුනේ. ඒ වගේ වෙලාවක ධර්මතාවයෙන්ම ඒ තත්ත්වය පිරිහෙන්න මොනව හරි ක්‍රමයක් යෙදෙනවා. කොහොම හරි ඒ කාලෙ සෘෂි පැවිද්ද ආව කියල තමයි දැනෙන්නෙ. ඒ කියන්නෙ තමන් විසින්ම වැරදි දැකල අධිෂ්ඨාන කරල නිදහස බලාගෙන පැවිදි වීම. වෙනත් විදිහකින් කියනව නම් සුචරිත අධිෂ්ඨානයෙන් ධ්‍යාන සමාපත්ති වගේ පහසු විහරණය තකා නික්මීම. මේ කියන්නෙ නෙක්ඛම්ම පාරමිතාව. හැබැයි මෙතනදි නිවන් දකින එකක් නෙවෙයි මුලින් එන්නෙ, කාම ලෝකයේ කාමයන්ගෙන් නික්මීම. ඊට පස්සෙ කාමයන්ගේ ආදීනව දැකල, ලෝකයේ වස්තු අල්ල ගත්තම ඒවායේ තියෙන ඇලීම් ගැටීම් දැකල, ඒකෙන් නිදහස් වීමෙන් ලබන ශක්තිය දකිනවා.

ඉතින් මම එදා සිවුරු හැරල ගියේ ධර්මානුකූල නියම ක්‍රමයකට මිසක් පාරාජිකාවට අහු වෙලා නෙවෙයි. ඒ ගිහිල්ලත් මට යම් කිසි විපාකයක් ආවා. එකක් සම්මත උපසම්පදාව අහිමි වීම. මොකද එහෙම සිවුරු හැරල යෑම සම්මත උපසම්පදාවට නිගරුවක්. භික්ෂූන් වහන්සේ නමක් නැවත ගිහි වතකට යනවයි කියන්නෙ අසූචි වලකට බහිනව වගේ වැඩක්. ඒක පස්සෙ තේරුම් යන්න පුළුවන්. අත්දැකීම් ලබන්න ලබන්න ඒකෙන් අහක් වෙන්න බලනවා. ඉතින් අද කාලෙ සිද්ධ වෙන දේවල්වල හැටියට දැන් ඉන්න සමහර භික්ෂූන් වහන්සේලාගෙ තත්ත්වය ගැන අපි දන්නෙ නෑ. අපි දැන් කතාවට කිව්වත් ලෝක සම්මතයේ මේ විදිහෙ තත්ත්වයක් තියෙන විශේෂ අය කියල, ඔය කියන සතර පාරාජිකාව ගැන අපිට කියන්න බෑ. එහෙම වුනොත් ඉතින් ඒ වගේ භික්ෂූන් වහන්සේලා විසින් තවත් අය මහණ කළාට වැඩක් නෑ. හැබැයි පැවිද්ද තියෙනවා. ඒක නැති වෙන්නෙ නෑ. ඒත් සෘෂි පැවිද්ද වගේ දෙයක්. ඒකෙ තියෙන්නෙ ආජීවක අෂ්ටමක සීලය. ඒක දැන ගත්තම අපිටත් ඕන නම් ඒ සීලයේ පිහිටන්න පුළුවන්.

ඉතින් එදා ඒ විදිහට සිවුරු හැරල පැනල ගිහින් විවාහ වෙච්ච ඒ වෙසඟන මේ අත්බවයෙත් මට මුණ ගැහුණා. ඒ කියන්නෙ මීට අවුරුදු 20 කට විතර උඩදි මම පූජා, සෙත් ශාන්ති ආදී සාසන කටයුතු කරන එක්තරා ස්ථානයකදි. නමුත් මම ඒ කාරණය දැන ගෙන හිටියට ඒ ස්ත්‍රිය ☞

**ආ එම තැනේ ගරු මහ බුදු රජිඳු ගුණේ**
**සමිඳුනි නගා ගෙන මතු බල මෙබඳු තැනේ**
**වසරින් දෙදහසක් තුන් සිය සමග කිනේ**
**පෙර කල උතුම් බුදු සව් පුත් කෙනෙකු වුනේ**

**එම දා උතුම් ගුණ සිහි කර ගෙන උන්නේ**
**මහ සව් වුවත් නැත මග එල ලැබ ගන්නේ**
**එම දා සසරමයි වෙනසක් මතු වන්නේ**
**හැරදා ගියා සිවුරත් අත හරි මින්නේ**

**ලැබුවේ හී පහර මල් සර ලෙස එදින**
**දැරුවේ එවන් තතුමයි හද මෙම ලෙසින**
**ඉන්නේ යුග දිවියෙ බැඳී හදවත් ලෙසින**
**එම තැන් මිනිස් ගතියට හිමිකම් ලැබින**

**සමිඳුනි එදා එම තැන් මා සිත පාප**
**නැත කිසි දෙයක් ගත්තේ කරමින් සාප**
**එම ලොව දෙදෙන සමගින් හැරදා පාප**
**එම තැන් සිවුරු හැර ගියෙ කාමෙට ආප**

**යහපත් තැනින් සමිඳුනි ගරු කර උන්නේ**
**එබැවින් සිටියෙ ලොව නැහැ වරදක් වන්නේ**
**වින්දත් කාම නැහැ මිස හසරක් ගන්නේ**
**මිනිසෙක් විලසමයි මෙම මග ගෙන දුන්නේ**

**සිවුරක් ලබනවා බඹසර සුවය දෙන**
**සමිඳුනි පාප සුළු මුත් එම අතැර යන**
**නැත මතු තැනක උප සපුවක් ලබන පින**
**මිනිසත් වුවත් පල දිය තතු මෙබඳු තැන**

ඒ පෙර අත්බැව් සම්බන්ධය දැන ගෙන ආව නෙවෙයි. සසර පුරුද්දට ආවා. ගැලපෙන්නෙ නැති නිසා ඒ අයගෙ නම් ගම් ආදී විස්තර කියන්න සුදුසු නෑ. හැබැයි මේ අත්බැවේ ඒ විදිහට මුණ ගැහුනට එහෙම සම්බන්ධ වීමක් වුනේ නෑ. එහෙම වෙන්න හේතුත් නෑ. එතනදි තරහක් නෙවෙයි තියෙන්නෙ, ධර්මාවබෝධයත් එක්ක ඒ අදහස ඉවත් වෙලා යනවා.

ඉතින් ඇය බුද්ධ සාසනයේ සිල් මෑණි කෙනෙක් විදියට පැවිදි වෙන්න හිටපු අනාගාමික කෙනෙක්. නිතර නිතර අපේ පූජා සෙත් ශාන්ති ආදී සාසනික කටයුතුවලටත් එනවා. බණ අහන්න තමයි එන්නෙ. හැබැයි එහෙම ඇවිල්ලත් මොකද කරන්නෙ, ඒ කාලෙ පිරිත් කියන්න ආදී කටයුතුවලට යන කොට ගිහිව හිටියත් ඇයට ලැබෙන සබන්, දත් බෙහෙත් ආදී දේවල් අපිට ගෙනත් පූජා කරනවා. ඉතින් අපිත් ඒ අයගෙ හැඟීම් දකිනවා. මේ එන හැම වාරයකදිම මේ ස්ත්‍රිය මගේ මූණ දිහා බලාගත්ත ගමන් මහා සුසුමක් හරිනවා. ආපු ගමන් එහෙම බැල්මක් දාල තමයි යන්නෙ. ව්‍යංගයෙන් හැඟවීමක් තමයි ඒ කරන්නෙ. එතකොට හොඳට තේරෙනවා ඇගේ අදහස මේකයි කියල. ඔහොම ඇවිත් දවසක් දා සුදු කොළයක කවි පන්තියක් ලියල මට දුන්න මේක කියවල බලන්න කියල. ඒ අවසාන කවිවල කියල තිබුනෙ, මේ අත්බැවේ බැරි නම් මතු අත්බවේ හරි හමුවෙමු කියන අදහස. මම කිව්ව ඉතින් කුණු ගොඩකට කුණු ගොඩක් හමුවුනාම වැඩක් නෑනෙ, ඕව ගැන අදහස අත් හරින්න, මතු අත්භවයේ හමු වෙන්න නෙවෙයි ආර්ය මාර්ගය වඩන්නෙ, අද අදම නිවන් අවබෝධ කර ගන්න අධිෂ්ඨාන කර ගන්න කියල. මූණටම එහෙම කියල මම ඒක පැත්තකට විසි කළා. ඊට පස්සෙ ඒ පැත්ත පලාතෙවත් ආවෙ නෑ. හැබැයි ඒ ස්ථානයේ හිටපු තවත් බල පුළුවන්කාර කෙනෙක් මේ කාන්තාව වසඟයට අරගෙන තිබුන කියල මට පස්සෙ ආරංචි වුණා. ඉතින් ඒ වගේ අදහස් තියෙන අයට ඒ වගේ අය ගැලපෙනවා. ඊට පස්සෙ කාලයක් ගිහින් ඒ කාන්තාවත් සිල් මෑණි කෙනෙක් වුණා.

ඉතින් මීට අවුරුදු 20 කට විතර උඩදි පොල්ගහවෙල උඩපනලිය, ගෝඨාභය රජමහ විහාරයෙදි පවත්වපු මංගල මහා බෝධි පූජාවෙදි සමාධිමය කවියෙන් මේ පෙර අත්භවයේ සිද්ධිය මට මේ විදිහට ගෙතිල ආවා.

මේ වගේ අවස්ථාවකදි සසර විවිධ පුරුදු පුහුණු කරපු, එකට ආපු අය ඕන තරම් ඉන්නවා. ඉතින් ඒ අය ඇසුරු කරන කොට ඒ හිටපු අයගෙ මොනව හරි අඩු පාඩුවක් දැක්කොත් ඒ පුද්ගලය ඒකෙන් අයින් වෙනවා. නැවතත් බැඳීම අත් හැරෙනවා. එහෙම තමයි ක්‍රමයෙන් පෙරි පෙරී පාරමිතාව පිරෙන්නෙ. ඔය විදිහට සසර ආපු අය ඕන තරම් ඉන්නවා. නමුත් ආසන්න සම්බන්ධය ආවට පස්සෙ ඒකෙ වැරදි දකින්න ගන්නවා. වැඩි හරියක් දකින්නෙ ඒකෙ තියෙන දූෂ්‍යතාවය. බලාපොරොත්තු වෙච්ච සුන්දරත්වය එතන නැති වුනාම ඒක අත් හැරිල යනවා. කොහොම හරි ඉතින් එදා සසර ස්වභාවය මුල් කර ගත්තු ලෙන්ගතුකමක් මුල් කර ගෙන තමයි මම ඒ වගේ දේකට පෙළඹුණේ. ඒක ස්වභාවයක්. නමුත් පස්සෙ ඒකෙ වැරැද්ද දකිනවා. ඒක දූෂ්‍යතාවයක් කියල දකිනවා. ඒකත් විවිධාකාරයෙන් එනවා. ඒ එන එන සැරේට ඒක දකිනවා. දැක්කට පස්සෙ ඒ ගැන කළකිරෙනවා. එතකොට ඒක මගදිම අත් හැරිල යනවා. සියල්ල අත් හැරෙනව නෙවෙයි. ඒ එල්ල කරපු කාරණය අත් හැරෙනවා. ඊට පස්සෙ මොන විදිහකින් හරි සසරෙ ආවත්, අර ගතිය, සම්බන්ධය ආවම ප්‍රතික්ෂේප වෙනවා.

ඉතින් කාමය ගත්තම විකෘති කාම, නීච කාම, ගැලපෙන්නෙ නැති අදහස් තියෙන ස්ත්‍රී පුරුෂ දෙගොල්ලොම සමාජයේ ඉන්නවා. ඒ වගේම ගුප්ත ලෝකයෙත් ඉන්නවා. ඒ වගේ අය ගුප්ත ලෝකයේ ඉඳන් හරි අන්තිමට සම්බන්ධ වෙන්න බලනවා. ඒවා අත්දැකීමෙන් දැක්කම තුච්ඡයි, නින්දිතයි කියන අදහස ඇවිත් සහමුලින්ම ගැලවිලා යනවා. ඉතින් ඒ වගේ සිද්ධිවලින් කාමුක පුද්ගලයන්ගෙ සම්බන්ධය එපා කරවන පැත්තටත් අත්දැකීම් ලැබුවා. ගුප්ත ලෝකයේ තිරිසන් ගති තියෙන අය අප්පිරිය කරන්නත් හේතුවක් ඕන වෙනවා. මොකද කෙස් ගහක හරි පොඩි හැඟීමක් තිබුන නම් උන් එක්ක සම්බන්ධයක් එනවා. දැන් මේ එන්නෙ උන්ගෙන් සම්පූර්ණයෙන්ම මිදිල ඉවත් වෙලා ලෝකෝත්තර පැත්තට යන කාලය. මොකද ඒවා තනිකරම සමාධියට විසයි. උන් කල් තියාම අයින් නොකළොත් ඉදිරි අනාගතයෙදි නිදහසේ පුද්ගලිකව ඉන්න බෑ. ඒ නිසා ඒකට ක්‍රමයක් යොදන්න ඕන.

මනුස්සයෙක් කසාය බොන කොට ලෙඩේ හොඳ නොවී දිගටම කසාය බොන්න වෙනව නම්, මැරිල ගියා නම් මීට හොඳයි කියල නිකං පැත්තකට දාල ඉන්නව වගේ, මේ වගේ අවස්ථාවලත් ඒකෙන් අත්දැකීමක් එනවා. ඒ විතරක් නෙවෙයි, තිරිසන් මනසත් දැනෙනවා. දැන් මේ මෑත කාලයේ අවුරුදු 5 ක විතර පුංචි ළමයෙක් දූෂණය කරල ඒ ළමයගෙ අවයව වනසල අන්තිමට කකුල්වලට ඇණ ගහපු සිද්ධියක් පුවත්පත්වල තිබුණා. ඉතින් එතකොට ඒ මිනිහගෙ අදහස වුනේ කාමය නෙවෙයි, අර ද්වේශයත් එක්ක මනසෙ තිබ්බච තුච්ඡ, නින්දිත ගතිය. ඒ නිසා තමයි ඒ දරුවට එහෙම කළේ. අන්න ඒ වගේ කුණු මනසකින් ඒ වගේ වැඩක් කළාම ඒකත් එක්ක බැඳෙන කුණු මනස නිසා ඒ පුද්ගලය ගැන කළකිරෙනවා. කොච්චර ආදරය පෙන්වන්න කියල හැදුවත් ඒකගෙ තුච්ඡ ගතිය ඒකෙන් පේනවා. ඒ පුද්ගලය එපා වෙනවා. අන්න ඒ වගේ එවුන් මේ ගුප්ත ලෝකයෙත් ඕනෑ තරම් ඉන්නවා. ඒ අයට කියන්නෙ මාර දූත මෙහෙයුම්-කරුවො කියල. උන් මහ කාලකන්නි තුච්ඡ නින්දිතම පිරිසක්. උන්ගෙ ගති මහ නීචයි. ගුප්ත ලෝකය සමාධියට පේන නිසා මම ඒ කාරණය අත්දැකීමෙන්ම දන්නවා. ඉතින් මේ ගුප්ත ලෝකය පේන්න ගත්තොත් උන්ගෙන් හරිම කරදරයි. මොකද උන් කරන, කියන දහ ජරා වැඩ ඔක්කොම පේනවා, ඇහෙනවා. ඒ මදිවට උන් හිරිහැරත් කරනවා. ඒ නිසා බොහොම ප්‍රවේසමෙන් තමයි කටයුතු කරන්න ඕන.

ඉතින් මේ වගේ කාමයට යොමු වෙන දේවල් සම්බන්ධයෙන් අපි අනිත් අයට කොච්චර කිව්වත් වැඩක් නෑ, තම තමන්ම අත්දැකීම් ලබන්න ඕන. නමුත් එහෙම කිව්වම ඒ ආසන්න හේතු වාසනා තියෙන සුදුසු අය විතරක් ඒක තේරුම් ගනීවි. අනිත් අයට ඒක නිකං විහිළුවක් කොලොප්පමක් වගේ. කාට වුනත් ඉතින් දැන ගන්න තියෙන්නෙ, මේ වගේ අවස්ථාවන්වලට පෙළඹුනොත් ඒ ගැන විශේෂයෙන් හොයල බලල සෝදිසියෙන් ඉන්න ඕන කියන කාරණය. එතකොට බුද්ධානුස්සතිය, මෙත්තානුස්සතිය, අසුභානුස්සතිය, මරණානුස්සතිය කියන මේ චතුර් ආරක්ෂාව නිතර වඩන්න ඕන. ඒක අවශ්‍ය දෙයක්. විශේෂයෙන් අසුභය වඩන්න ඕන තමන්ට හොඳට සත්කාර කරන කොට, සලකන කොට, ඒ වගේම කාමයට පොළඹ වන කොට. මොකද එතකොට ඇලෙන්නෙ නෑ. ඒ වගේම කෙනෙක් බනින කොට මෙත් සිත වඩන්න ඕන. එතකොට දූෂ්‍ය වෙන්නෙ නෑ. ඇලීමයි ගැටීමයි දෙක නැති කරන්න තමයි මේ අසුභානුස්සතියයි, මෙත්තානුස්සතියයි දුන්නෙ. ඊළඟට මරණානුස්සතිය අප්‍රමාද වෙන්නත්, බුද්ධානුස්සතිය බුදු ගුණ කෙරෙහි විශ්වාසය සහ ශ්‍රද්ධාව ඇති කරන්නත් හේතු වෙනවා. හැබැයි ඉතින් මේවා ගැඹුරු විග්‍රහයන් සහිතයි. ඒ නිසා හරියටම වඩනවනම් නිකං මතු පිටින් පෙනෙන අර්ථය නෙවෙයි ගන්න ඕන.

සටහන


**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ගන්ධබ්බයෙක් මව් කුසකට ඇතුල් වන ක්‍රම 5 ක්...

සත්වයෙක්ගෙ මරණයෙන් පසු තවත් අත්බැවකට යන කාලය අතරතුර, සමහර සත්වයින්ට ගන්ධබ්බ හෙවත් අන්තරාභවික අවස්ථාවක් තියෙන බවට ධර්මානුකූල විග්‍රහයක් හෙළ බොදු පියුම පසුගිය කලාප පෙළකින් ඉදිරිපත් කළා. විශේෂයෙන් මේ වෙන කොටත් මතභේදාත්මක වූ මේ අන්තරාභවික අවස්ථාව හේතුඵල සහිතව ඔප්පු කිරීම තමයි ඒ ලිපි පෙළෙන් ප්‍රධාන වශයෙන් සිද්ධ කළේ. දැන් එතකොට සත්වයෙක්ගෙ සූක්ෂම කය මේ මස් ලේ කයේ මරණයත් එක්කම පිට වෙනව වගේම, මස් ලේ කයක් සහිතව නව උප්පත්තියකට එන කොටත් ඒ ගන්ධබ්බ අවස්ථාව මව් කුසකට ඇතුල් වන ක්‍රමයක් තියෙනවා.

හැබැයි මේ විස්තර කරන කාරණය තවමත් වෛද්‍ය විද්‍යාවට හසු කර ගෙන නෑ. ඒ වගේම පොත් පත්වල සඳහන් වෙන්නෙත් නෑ. ඒක දිවැසක්, සමාධියක් වඩපු අයට විශේෂයෙන් ගෝචර වන ක්‍රමයක්. වහරක අභයරතනාලංකාර හිමියන් සමාධියෙන් හසු කර ගත්, ඒ වගේම ප්‍රායෝගිකව අත්දැකීම් සහිතව උන් වහන්සේ විසින් හෙළිදරව් කළ කරුණු ඇසුරින් තමයි මේ විග්‍රහය ඉදිරිපත් කරන්නෙ. හැබැයි පොත් පත්වලම එල්බ ගෙන ඉන්න, පොතේ දැනුමට විතරක් සීමා වෙච්ච, නැණ නුවණින් හිතල බලන්න හැකියාවක් නැති අය නම් මේ කාරණය පිළිගන්න එකක් නෑ. නමුත් දිවැසක් සමාධියක් නැතත්, යම් කිසි දහම් අවබෝධයක් තියෙන, නැණ නුවණින් යමක් කමක් තේරුම් ගන්න පුළුවන් අයට නම් මේ කාරණය පහසුවෙන් ගෝචර කර ගන්න පුළුවන්.

මෙතනදි අපි දන්නෙ නැති පැත්තක් තියෙනවා. අපි හිතාගෙන ඉන්නෙ මේ හුඟක් දේවල් ඉබේම සිද්ධ වෙනව කියල. නමුත් මේවා අපි මුලින්ම දැන ගෙන පසුව නොදැනුවත්වම කරන දේවල්. හැබැයි අපි කාලයක් තිස්සේ යමක් කර ගෙන ගියාම ඒක අපි දැනුවත්ව කරනව කියලත් අපිට තේරෙන්නෙ නෑ. නමුත් හිතලමයි හුස්ම ගන්නෙත්, හිතලමයි හුස්ම පිට කරන්නෙත්. හුස්ම ගන්නත්, පිට කරන්නත් හේතුවක් තියෙනවා. ඒ හුස්ම ගැනීම පිට කිරීම අඩු වැඩි වෙන්නත් හේතුවක් තියෙනවා. යම් කෙනෙක් රාගයෙන් රත් වෙලා, ද්වේශයෙන් දැවිල, මෝහයෙන් මුලා වෙලා ඉන්න මානසිකත්වයක් ඇත්නම්, ඒ මානසිකත්වයට අනුකූලව පුද්ගලයගෙ කායික පරිවර්තනයක් වෙනවා. ඒ පරිවර්තනය නිසා අපි නොදකින පැත්තක් මේ මස් ලේ කයේ සිද්ධ වෙනවා. මේ කය ඒකජ, ද්විජ, ත්‍රිජ, චතුර්තජ කියල පිහිටන ක්‍රමයක් තියෙනවා. හැබැයි ඒක අපි දකින්නෙ නැති පැත්තක්. ඒකජ කය කියන්නෙ කර්මජ කය. යම් කිසි ගතියක් කර්ම ශක්තියෙන් ඇති කර ගත්ත නම්, පෙර භවයෙදි ඇති කර ගත් ගතියෙන් උප්පත්තියක් ලැබුව නම්, ඒ ගතිය මුල් කර ගෙන චිත්ත වේගයෙන් මේ උපතේ පටන් පැවැත්ම දිගටම ගෙනියනවා. ඒකට



භවාංගය කියල කියනවා. ඒක පූර්ණ කර්මජයි. ඒ ගතියෙන් ගති රුවක් නිපදවනවා. ඒක සූක්ෂම කයක්. ඒක මස් ලේ ඇහැටවත්, කිසිම උපකරණයකටවත් පේන්නෙ නෑ. ඒක තමයි කර්මජ කය කියන්නෙ.

කර්මයෙන් මොහොතක් පාසා ගතියට අනුව ගති රුවක් නිපදවනවා. ඒක තමයි අපේ ශරීරයේ තියෙන ආකෘතිය. ඒ ආකෘතියේ යම් කිසි ගති ස්වභාවයක් ඇත්ද, ඒ ගති ස්වභාවයේ ප්‍රමාණයට තමයි මේ මස් ලේ කය පිම්බිලා සකස් වෙලා කවද හරි වැඩෙන්නෙ. ඒ ආකෘතිය වටා පිහිටන දේ තමයි මේ මස් ලේ ශරීරය කියන්නෙ. කර්මජ කයෙන් පස්සෙ හිත් පහළ වෙන්න පටන් ගන්නවා. චිත්තජ රූප නැගෙනවා. කර්මජ රූප හා චිත්තජ රූප නැගෙන කොට, කර්මජ රූප නැගෙන මොහොතේ පටන් ගෙනම පරිවර්තනය වෙවී නිෂ්පාදනය වෙන කොට උතුජ රූපයක් නැගෙනවා. උතුජ රූපයක් කියන්නෙ බාහිරට නිදහස් වෙච්ච රූපයක්. හැබැයි ගතියේ සමානත්වය නිසා ඒක මේ ශරීරයෙන් විසිරිලා ඈතට යන්නෙ නෑ. ඒව සියල්ලම අර ආකෘතිය වටා පිහිටනවා. ඒක තමයි ද්විජ කය කියන්නෙ. ඒ කියන්නෙ කර්මජ කයයි, උතුජ කයයි. ඒකත් වටේ පිහිටල ඒත් එක්ක එන ඊළඟ අවස්ථාව තමයි ත්‍රිජ කාය. ඒ කියන්නෙ කර්මජ, චිත්තජ, උතුජ කියන අවස්ථා තුනේ එකතුවක්. බ්‍රහ්මයො ඉන්නෙත් ත්‍රිජ කයෙන්. එතකොට කන බොන ආහාරය අවශ්‍ය නෑ. කන බොන ආහාර නැතිව ඒ අයට ප්‍රීතිය නිසා ඇතිවන චිත්තජ රූප ආහාර කරගෙන ජීවත් වෙන්න පුළුවන්. ඒකත් අති සියුම් අවස්ථාවක්.

මේ සියුම් කයෙන් හැදිච්ච කාම ලෝකයේ ඉන්න සත්වයාට, ඒ සියුම් කයෙන් කර්මජව ආහාර ගන්න පුළුවන් අවස්ථාවක් ලැබෙනවා. සියුම් ගඳ සුවඳ ආහාර විදිහට ගන්න පුළුවන්, සියුම් තැන්වලින් රිංගන්න පුළුවන් ශරීරයක් තමයි මේ කියන්නෙ. ඒ ගන්ධයෙන් එල්බ ගැනීම තමයි ලෝකයේ තියෙන කබලිංකාර ආහාරයේ මුල. ඒක තමයි ගන්ධබ්බයා කියන්නෙ. ඒක චතුර්තජ කයක්. හැබැයි තවමත් මස් ලේ කයකට ආවෙ නෑ. ඔතනදි ගන්ධබ්බයා කියන තත්ත්වයට පත් වෙනවා. ඒ ගන්ධබ්බයා තමයි කවද හරි දවසක මවු කුසකට ඔක්කන්ති වෙන්නෙ. මවු කුසේ පටිසන්ධි වෙන කතාවක් ධර්මයේ කොතැනකවත් නෑ. ඒක පස්සෙ හදා ගත්ත මතයක්. පිළිසිඳ ගන්නව කියන එකම තමයි පටිසන්ධිය කියන්නෙ. හැබැයි ඒක මවු කුසක් ඇතුලෙ සිද්ධ වෙන දෙයක් නෙවෙයි.

ඔක්කන්ති වීම තමයි උප්පත්ති වෙනව කියන්නෙ. හැබැයි උප්පත්ති කිව්වම අද හිතාගෙන ඉන්නෙ මවු කුසින් බිහි වන අවස්ථාව කියල. නමුත් ඒක නෙවෙයි උප්පත්තිය / ඔක්කන්තිය කියන්නෙ, මවු කුසකට ඇතුල් වීම. ගන්ධබ්බා අවක්කන්ති හොන්ති කියන්නෙ ඒකයි. ඒ ගන්ධබ්බය තමයි ගැබකට කර්ම ශක්තියෙන් ඇදල එන්නෙ. එහෙම ඇදල එන කොට ගඳ සුවඳ මට්ටමේ සියුම් එකක් මිසක් මේ කියන්නෙ ඊට වඩා ලොකු එකක් නෙවෙයි. වටේ තියෙන ශරීරය තමයි ආකෘතිය. ඒ ආකෘතිය උතුජ රූප කලාපවලින් හැදිල තියෙන්නෙ සතර මහා භූතවලින්. හැබැයි ඒක මිනිස් වුනාට සිතිවිලිවලින් සහ කර්ම ශක්තියෙන් ☞

ඕන වෙලාවක සියුම් කරන්න හෝ විශාල කරන්න හෝ ප්‍රසාරණය කරන්න හැකියාව තියෙන එකක්. ඒ තමයි සියුම් කයේ හැටි. ඒක තමයි කර්ම ශක්තියෙන් මවු ගැබකට යන්නෙ. කර්ම ශක්තියෙන් වුනත් මවු ගැබකට නිකං ඇතුල් වෙන්න බෑ. අඩු තරමෙ වායු මාත්‍රයක්වත් ඇතුල් වෙන්න පුළුවන් මට්ටමක් තියෙන්න ඕන. මොකද ගන්ධබ්බ අවස්ථාව කියන්නෙත් සතර මහා භූතයන්ගෙන් සකස් වෙච්ච සූක්ෂම කයක්. එතකොට ඒ සූක්ෂම කය ඇතුල් වෙන්නත් යම් කිසි අවකාශයක්, මාධ්‍යයක් තියෙන්න ඕන. ඉතින් එහෙම ඇතුල් වන විවිධ ක්‍රමවේද තියෙනවා. කොයි විදිහකින් හෝ ඒකට ගැලපෙන ක්‍රමයකින් ගැබට ඇතුල් වෙනවා.

ඒ කියන්නෙ ඇස, කන, නාසය .... කියන පංචේන්ද්‍රියන්ට ගෝචර වන රූප, ශබ්ධ, ගන්ධ .... කියන මේ අරමුණුවලින් මොනව හරි එකක් අර ගෙන තමයි එන්නෙ. අරමුණු පරම්පරාවක් පස්සෙ ගිහින් අන්තිමට ඕකෙන් එකක් තේරිලා චුත වෙන මොහොතක අහු වෙච්ච එක තමයි ඊළඟ චුතියට යන කල් ගති හිත විදිහට ගෙනියන්නෙ. එතකොට ඒ ගන්ධබ්බයා දර්ශනයක් මුල් කර ගෙන නම් ගන්ධබ්බ තත්ත්වයට පත් වුන ගතිය ආවෙ, මවුගේ ඇහැ ඇසුරු කර ගෙන ඇතුල් වන ක්‍රමයක් යෙදෙනවා. ශ්‍රවණය මුල් කර ගෙන නම් ඒ ගන්ධබ්බයාට අරමුණ ආවෙ, මවුගේ කනින් ඇතුල් වෙන්න ක්‍රමයක් එනවා. ඒ වගේම චුති-පටිසන්ධි වන වෙලාවෙදි ගන්ධයක් මුල් කර ගෙන අරමුණ ආව නම්, මවුගේ නාසය මුල් කරගෙන ඇතුල් වෙනවා. ගන්ධබ්බයගෙ මුල හට ගත්තෙ රසයක් මුල් කර ගෙන නම්, කටින් ඇතුල් වෙනවා. ඒ වගේම ස්පර්ශ කාමයක් මුල් කර ගෙන නම්, යෝනි මාර්ගය ඔස්සේ ගැබට ඇතුල් වෙනවා. ඒ කියන්නෙ ඒ අරමුණින් එනකොට ඒක තමයි ගන්ධබ්බයගෙ ගති හිත වෙන්නෙ. ගති හිත අනුව තමයි ඊළඟ චුතිය එනකල් ගමන යන්නෙ.

දැන් මේ විදිහට ගත්තම දකින්න තියෙන දෙයක් තමයි, මවුපියන් එකතු වන අවස්ථාවකදි හෝ එකතු වුනාට පසු අවස්ථාවකදි ඒ මවුට ඈනුමක් ගියොත් එහෙම ප්‍රධාන වශයෙන් ගන්ධබ්බයා කටින් ඇතුල් වන අවස්ථාවක්. ඒ වගේම ඒ එකතු වන අවස්ථාවෙදි මවුගේ කන් අඟුල් වැටෙන්න වගේ දැනුනොත් මවුගේ කනින් ගන්ධබ්බයා ඇතුල් වන අවස්ථාවක්. නාසය හිර වෙලා වගේ තිබිල ක්ෂණිකව බුරුල් වෙන ස්වභාවයක් ආවොත් ඒ ගන්ධබ්බයා නාසයෙන් ගැබට ඇතුල් වන අවස්ථාවක්. ඒ වගේම මවුගේ ඇස්වලින් කඳුළු පිට වෙලා නිකං සිලි සිලි ගාන වගේ අවස්ථාවක් ආවොත් ඒ ගන්ධබ්බයා ඇස්වලින් ඇතුල් වෙන අවස්ථාවක්. යම් කිසි විදිහකින් ගන්ධබ්බයා මවුගේ යෝනි මාර්ගය හරහා ඇතුල් වුනොත් යම් කිසි වායුවක් ඒ හරහා පිට වෙලා යනවා. හැබැයි මේ කියන භෞතික සිද්ධි ගන්ධබ්බයා ඇතුල් වන මොහොතෙ බොහොම සුළු වෙලාවකට විතරයි සිද්ධ වෙන්නෙ. ඉතින් මේ වගේ දේවල් නිකං සිද්ධ වෙන්නෙ නෑ. කවද හරි මවුගේ ඍතු විපර්යාසයක් සිද්ධ වෙලා, මවුපිය එකතු වීමක් තිබ්බ්ච අවස්ථාවකදි එහෙම දෙයක් වුනොත් ගන්ධබ්බයෙක් ඒ ස්ථානයෙන් මාධ්‍යයක් හදා ගෙන ගැබට ඇතුල් වීමක්. සියුම් කිරණමය කයක් තියෙන ගන්ධබ්බයට මේ ස්ථාන 5 න් ඕනෑම ස්ථානයකින් ඇතුල් වෙන්න පුළුවන්. සියුම් ගන්ධබ්බයට ශරීරයට ඇතුල් වෙන්න මහ ලොකු අවකාශයක් අවශ්‍ය නෑ. ඉතා කුඩා සිදුරකින් පවා ඇතුල් වෙන්න පුළුවන්. එහෙම ඇතුල් වෙච්ච ගන්ධබ්බයා මවු ගැබ කරා කර්ම ශක්තියෙන්ම ඇදිල යනවා. හැබැයි මේ ක්‍රම තවමත් වෛද්‍ය විද්‍යාවෙන් හොයා ගෙන නෑ.

ගන්ධබ්බයා ඇතුල් වෙන කොට අර කර්ම ශක්තියෙන් තමයි ඒ ස්ත්‍රී පුරුෂ බීජානු දෙක එකතු කරන්නෙ. වෛද්‍ය විද්‍යාවෙදි හැඳින්වෙන යුක්තානුව කියන දේ හැදෙන්නෙ ඒ අවස්ථාවෙදි. ගන්ධබ්බය ඇතුල් වෙලා කර්ම ශක්තියෙන් ඒක කරන කල් යුක්තානුව හැදෙන්නෙ නෑ. එහෙම නැතිව ස්ත්‍රී පුරුෂ බීජානු එකතු වෙච්ච පළියටම යුක්තානුවක් හැදෙන්නෙ නෑ. ඒවා එහෙම නිකං එකතු වෙන්නෙ නෑ, ගන්ධබ්බයගෙ කර්ම ශක්තියෙන්මයි එකතු කරල හදල දෙන්නෙ. ගන්ධබ්බය නිකං ඇතුල් වෙන්නෙත් නෑ. මවුපිය සංවාසයක් යෙදෙන කල් ස්ත්‍රී පුරුෂ බීජානු නිදහස්ව තියෙනව මිසක් යුක්තානුවක් හැදෙන්නෙ නෑ. පුරුෂ බීජානුවට ශක්තියක් තිබුනත් නිකං එකතු වෙලා යමක් නිර්මාණය කරන්න හේතුවක් නෑ. ඒක සිද්ධ වෙන්නෙ අර ඇතුල් වන ගන්ධබ්බයගෙ කර්ම ශක්තියෙන්. ගන්ධබ්බයගෙ ප්‍රමාණය කුඩා වෙලා / උන්ඩි වෙලා තමයි ගැබට යන්නෙ. ඒ කියන්නෙ චිත්තජ රූපය තමයි කුඩා වෙන්නෙ. මොකද කර්මජ රූපය කොහොමත් අති සියුම්. එහෙම ගිහින් අර කළල රූපයේ ජීව සෛලය ඉස්සෙල්ලම හදන්නෙ එතනින්. එතන හදන කොටම ඒ ගන්ධබ්බයගෙ ස්ත්‍රී පුරුෂ බව භෞතිකව හැදිල වෙන් වෙලා ඉවරයි, ඒ ඒ සෛලවලට බෙදිල ඉවරයි.

එතැන් පටන් ගෙන තමයි ඒ ගන්ධබ්බය අර මුලින් සඳහන් කරපු ආකෘතියට අනුව වැඩෙන්නෙ. ඊළඟට මවුගෙන් කන බොන ආහාරය ඇද ගන්නව මිසක් ඒ ජීව සෛලයට මවුගෙන් වෙනත් සම්බන්ධයක් එන්නෙ නෑ. පියාගෙනුත් වෙනත් භෞතික සම්බන්ධයක් නෑ. බොහෝ විට මවුපියන්ගෙ ලේ නෙවෙයි ඒ දරුවට තියෙන්නෙ වෙන ජාතියක ලේ වර්ගයක්. මවුගෙ ලේ $A^+$ නම් පියාගෙ $B^+$ නම්, උපදින දරුවට ඒ දෙකම නැතිව වෙන ලේ වර්ගයක් එන්න පුළුවන්. එතකොට මවුපියන්ගෙ ජානවලින් හෝ මොකෙන් හෝ හට ගත්ත කිව්වත් මේ ලේ වර්ග වෙනස් වෙනවා. මොකද මවුපියන්ගෙන් එන්නෙ එක්තරා ආධාරයක් විතරයි. ඊට අමතරව ශරීරයේ හැඩ රුව ආදී සියල්ලම සකස් වෙන්නෙ ඒ ගන්ධබ්බයගෙ කර්ම ශක්තියෙන්. ඊට අනුව තමයි ඒ ආකෘතිය සකස් වෙන්නෙ.

ඉතින් විද්‍යාවෙදි කතා වෙනවා මවුපියන්ගෙ ජානවල තිබ්බ්ච සම්බන්ධය නිසා තමයි ඒ ජාතියේම දරුවෙක් ඉපදුනේ, ඒ දරුවට මේ මේ රෝග ලක්ෂණ එන්නෙ කියල. ඒ අපි මතු පිටින් දකින පැත්ත විතරයි. යම් කිසි විදිහකින් ඒ පරපුරේ හිටපු ආතා මැරිල ගන්ධබ්බයෙක් වුනොත්, පුතාගෙ පුතාට දාව උපදින්න පුළුවන්. එතකොට ආතගෙ ගෙවිච්ච කර්ම ශක්තියේ ඉතිරි කොටස ගෙවන්න ඒ පරපුරට සම්බන්ධ වෙලා උපදිනවා.

උදාහරණ විදිහට ආතට කබර රෝගය තිබුණ නම් ඒ අකුසල කර්ම ශක්තියේ ඉතිරිය ගෙවන්න එහෙම සම්බන්ධ වෙනවා. හැබැයි ආතගෙ පුතාට කබර රෝගය නෑ. ඒත් ආත මැරිල ගිහින් පුතාගෙ පුතා වෙලා ඉපදෙන කොට ඒ උපදින පුතාට කබර රෝගය තියෙනවා. අන්න එතකොට පරම්පරාවෙන් ආව කියල කියනවා. නමුත් ඒ කබර ආවෙ ජානවලින් නෙවෙයි, ආතගෙ ඉතිරි කර්මය ගෙවන්න එහෙම ක්‍රමයක් යෙදෙනවා. නමුත් නවීන වෛද්‍ය විද්‍යාව තවමත් එහෙම දෙයක් හොයා ගෙන නෑ. ඒ අය කියන්නෙ පරම්පරාවෙන් එන ජානවලින් ඒ රෝගය ආව කියල. නමුත් ඒ රෝගය තිබ්බ්ච ඒ පරම්පරාවෙම කෙනෙක් තමයි දැන් මේ ඊළඟ උප්පත්තියට ඇවිත් ඉන්නෙ. ඒ කාරණය විද්‍යාවෙන් දන්නෙ නෑ. එහෙම එන කොට ඒ පුද්ගලයගෙ කර්ම ශක්තියේ ඉතිරිය තමයි දෙවන උපතින් ගෙවන්නෙ. ඒ වෙලාවට ඒ කර්ම රෝගයේ ඉතිරිය ඇදිල එනවා.

එතකොට කෙනෙක් තර්ක කරන්න පුළුවන්, දෙමව්පියන්ගෙ බාහිර හැඩහුරුකම් දරුවන්ට ලැබෙන්නෙ කොහොමද කියල. සාමාන්‍යයෙන් ගති හිත කියන්නෙ නිතරම පවතින එකක්. මොනව හරි දේකට අරමුණක් ☞

ආවොත්, ඒකට තවත් පොඩි දෙයක් එකතු වෙලා ගති හිත වෙනස් වෙන්න පුළුවන්. ඒ ගති හිතේ තියෙන ගති ගුණයට කිට්ටු ගන්ධබ්බයෙක් තමයි, ඒ මව්පියන් කරා ඇදිල එන්නෙ. එතකොට ගති ගුණ අනුව නැගෙන ගති රුව නිසා තමයි මව්පියන් හා සමාන හැඩ හුරුකම් දරුවන්ටත් එන්නෙ. එහෙම නැතිව විද්‍යාවෙ කියන විදියට මව්පියන්ගෙ ජානවලින් එනව නෙවෙයි. උදාහරණයක් විදියට යම් කිසි ගඟක රැල්ලක් ගත්තම සියුම් වැලි එක තැනකටත්, මධ්‍යම වැලි තව තැනකටත්, බොරළු තව තැනකටත්, රොන් මඩ තව තැනකටත් එකතු වෙලා තියෙනව වගෙයි. එක දෙයක් ගත්තම ඒ ජාතියේ ඒවමයි ළඟ තියෙන්නෙ. ගති ආකර්ශනය අනුව සමාන ඒවා සමාන ඒවාට ළං වෙනවා. ඒ නිසා තමයි සමහරවිට යහපත් ගුණගරුක දරුවන් බලාපොරොත්තු වන දෙමව්පියන්, ප්‍රයෝග සම්පත්තියක් වශයෙන් ඒ කාලයට වැඩිපුර පිං දහම් කරගෙන චිත්ත ප්‍රසාදයෙන් ඉන්නෙ. එතකොට පුළුවන් තරම් ඒ ගතියට ගැළපෙන යහපත් ගන්ධබ්බයෙක් ඇදිල එනවා. ඒ වගේම ඒ කාලයේ රාගයෙන්, ද්වේශයෙන් රත් වෙලා හිටිය නම් කොහේ හරි යන ඊට ගැළපෙන මදන ගන්ධබ්බයෙක් තමයි කුසට එන්නෙ.

ඉතින් වෛද්‍ය විද්‍යාවට සොයා ගන්න බැරි, දහමට අනුකූල එහෙම ක්‍රමවේදයක් තියෙනවා. සත්වයාගේ පැවැත්මත් එක්ක එහෙම දෙයක් සිද්ධ වෙනවා. ඒ තමයි සසර ගමන හැදෙන හැටි. ගන්ධබ්බයෙක් ගැබට එනව කියන්නෙ ඔය විදිහෙ ක්‍රමයක්.

දැන් මේ ගන්ධබ්බයෙක් මවු කුසකට එන කොටත් කෝටි ප්‍රකෝටි ගණනක ගන්ධබ්බයින්ගෙ මහ විසාල තරඟයකින් තමයි එකෙකුට දෙන්නෙකුට ඒ අවස්ථාව ලැබෙන්නෙ. හැබැයි මේ තරඟයක් කිව්වෙ, මනුස්ස ලෝකෙ වගේ ගහ මරාගෙන බැන ගෙන බලහත්කාරයෙන් ඇතුල් වෙන ක්‍රමයක් නෙවෙයි. හරියට අර පාර්ලිමේන්තු යන්න අපේක්ෂකයො ගහ මරා ගන්නව වගේ තරඟයකින් මවු කුසකට බලහත්කාරයෙන් ඇතුල් වෙන්න බෑ. ඒක කර්ම ශක්තියට යටත්. කර්ම වේගයෙන් මහ විසාල ගන්ධබ්බයො ප්‍රමාණයක් ඒ අසලට ඇදිල එනවා. එතනදි ගන්ධබ්බයෙක් ගත්තම යම් කිසි පසුතලයක් තියෙනවා. මවු ගැබක් තුළ ධාතු හතරින් සකස් වෙච්ච යම් කිසි පසුතලයක් තියෙනවා. ඒ වගේම මවුපිය ගති ලක්ෂණ කියල දෙයක් තියෙනවා. විශේෂයෙන් මවුගෙ හදවතේ තියෙන මොනව හරි ගති ගුණ අනුව තමයි ගන්ධබ්බයට පිහිටන්න පරිසරය හැදිල එන්නෙ. මවුපිය එකතුවීමකින් පසු පැය, දවස් ගණනක් ඇතුළතත් දරුවෙක් බඩට එන්නෙ මවු ළඟ ඒ ගති ලක්ෂණය තියෙන නිසා. එතකොට ඒකට ආසන්නම ගති ලක්ෂණ තියෙන ගන්ධබ්බයට ඒ තැන හිමි වෙනවා. ආසන්න අය වුනත් කර්ම ශක්තියෙන් තමයි එතැනට ගෙනත් දාන්නෙ. එතකොට ආසන්න අය ගත්තමත් බොහොමයක් ඉන්නවා. ඒ අතරිනුත් ඇසුරට කිට්ටුම කෙනා තමයි ඇදල ගන්නෙ. සමහර විට ඒ වගේ දෙන්නෙක් ඉන්න පුළුවන්. එතකොට එකම සෛලය දෙකට බෙදිල නිඹුල්ලු හට ගන්නවා. ඒ කියන්නෙ ගතිය පිරිමි නම් දෙන්නම පිරිමි, ගතිය ගැහැණු නම් දෙන්නම ගැහැණු. දෙන්නගෙම ලේ වර්ගයත් සමානයි. ඒ වගේම සමාන ගන්ධබ්බයො දෙන්නෙක් ආවොත් දෙන්නම එතැනට එකතු වෙනවා. දෙන්නම එක වගේ බලවත් නම්, ගැලපීම් තියේ නම් ඒ දෙන්නම ඇවිත් බැඳිල ඊට පස්සෙ එකම සෛලය දෙකට බෙදිල මිදි පොකුරු වගේ වෙලා නිඹුල් දරුවො විදිහට උපදිනවා. ඒ අයගෙ ගති ලක්ෂණත් බොහෝ දුරට එකාකාරයි.



නිවුන්නු කියන්නෙ වෙනම අවස්ථාවක්. එතනදි බීජ දෙකක් ගැබ තුළ හට ගන්නවා. සමහර මවු ගැබ්වල ස්වභාවයක් තියෙනවා, එක ඩිම්බයක් නෙවෙයි, ඩිම්බ කිහිපයක් බිහි කරනවා. පුරුෂ බීජානු ඕන තරම් තියෙන නිසා එතකොට දරුවන් කිහිප දෙනෙක් බිහි කරන්න පුළුවන් විදිහෙ ඩිම්බානු එකතු වෙනවා. ඒ අනුව ළමයි දෙතුන් දෙනෙක් හට ගන්නවා. හැබැයි ඒ අය පිරිමි ගැහැණු දෙගොල්ලන්ගෙන්ම වෙන්න පුළුවන්. ගති ලක්ෂණත් අසමාන වෙන්න පුළුවන්. ඒක කරන්නෙත් කර්ම ශක්තියෙන්ම තමයි.

සමහර විට ඒ අය කරපු යම් කිසි අකුසල කර්ම ශක්තියක් නිසා, සියලු අවශ්‍ය පරිසර තත්ත්වයන් මවු ගැබ තුළ තිබුණත් ඇතුල් වෙන්න දෙන්නෙ නැතිව විකර්ශනය කරන්න පුළුවන්. වෛද්‍ය විද්‍යාවටත් හොයා ගන්න බැරි එහෙම අවස්ථා තියෙනවා. ඒකත් කර්ම වේගයෙන්මයි සිද්ධ වෙන්නෙ. ස්වභාවිකව ගබ්සා වෙන්නෙත් ඒ වගේ කර්ම වේග නිසා. ඒකට දරුවන්ගෙ වගේම දෙමව්පියන්ගෙ කර්ම වේගයත් බලපානවා. සමහර විට ඒ කර්ම වේගයට ප්‍රතිකර්ම කළාම ඒ විකර්ශන ගෙවිල ඇත් වෙලා නැවතත් ගැබට ඇතුල් වෙන්න අවස්ථාව ලැබෙනවා. දාන මාන ආදිය දීල, විශේෂ පූජාවක් තියල ආශිර්වාද කළාම දරුවන් නැති බොහොමයක් උදව්යට දරුවන් ලැබෙන්නෙත් ඒ ක්‍රමයට. එතකොට අර තියෙන විකර්ශන ශක්තිය නැති වෙලා යනවා. අවුරුදු ගණනාවක් තිස්සේ දරුවන් නැතිව හිටපු අයට දරුවන් ලැබෙන්නෙ ඒ විදිහට ඒ අකුසල කර්ම වේගය දුරස් වීමෙන්.

ඉතින් මේ ගන්ධබ්බයෙක් කියන්නෙත් සියුම් ආත්ම භාවයක්ම තමයි. මස් ලේ කයට විතරක් නෙවෙයි ආත්ම කතාව කියන්නෙ.ගන්ධබ්බය තහනම් කරල තියෙන කතාවක් බුදු දහමෙ නෑ. (මේ පිළිබඳ පූර්ණ විග්‍රහක් මීට පෙරත් ඉදිරිපත් කරල තියෙනවා.) දැන් මේ අපේ ථේරවාදී පරපුර මේ කියන අන්තරාභව කතාවට විරුද්ධව කතා කරනවා, මහායාන අදහසක් කියල ඒක පිළිගන්නෙ නෑ. හැබැයි ඒ පිළිගන්නෙ නැතිව ප්‍රතික්ෂේප කළා කියන්නෙ ඔය දැන් කියන ආකාරයේ අන්තරාභවයක් ගැන නෙවෙයි. එදා ඒ විදිහට ප්‍රතික්ෂේප කළේ තනිකරම මුලා කතාවක්. ඒ කතාව ප්‍රතික්ෂේප කරන්න හොඳටම හේතු තියෙනවා. මොකද එදා ඒ අන්තරාභව කතාව ඉදිරිපත් කරපු අයට අනුව රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ඒ අය කියන අන්තරාභවිකයාට නෑ. ඒ අයගෙ මතයට අනුව සත්වයෙක් පනවන්න බෑ. ඒකයි එදා තිබ්බිච්ච අන්තරාභව කතාව ඒ අය හදාගත්තු මතයක් කියල ප්‍රතික්ෂේප කළේ. නමුත් අද ගන්ධබ්බයා කිව්වත්, අන්තරා භවිකයා කිව්වත්, ඔය කිව්ව ජාතියේ එකක් නෙවෙයි කියන්නෙ. ඒ අවස්ථාවට රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ තියෙනවා. නාම රූප සම්බන්ධ වෙච්ච සළායතන තියෙනවා. හිතන්න පුළුවන් අවස්ථාවක්. ඒ නිසා කාමාස්වාදයක් තියෙනවා. ඒ කියන්නෙ කාම භවයේ ඉන්නෙ. ඒ අත්බැව සූක්ෂමයි. ජාති, සංජාති, ඔක්කන්ති .... ආදී වශයෙන් බුදුන් වහන්සේ මේ කාරණය පැහැදිලිවම විග්‍රහ කරල තියෙනවා. මහණෙනි, ජාතිය කියන්නෙ මොකක්ද කියල, ජාතියක් සකස් වෙන හැටි, ජාතියට අවශ්‍ය කොටස් ගණනාවකින් පෙන්වා තියෙනවා.

එතකොට ජාති කිව්වෙ චුති-පටිසන්ධියෙන් පසු ඉස්සෙල්ලම බිහි

☞

වන අවස්ථාව. සංජාති කිව්වෙ ජාති සමග එකතුවීම. ඒ කියන්නෙ ජාතියේ දෙවන අවස්ථාව. ඒ තමයි ගන්ධබ්බයා. ගන්ධබ්බා අවක්කන්ති හොන්ති කියන්නෙ මවු ගැබකට ඇතුල්වීම කියන තුන් වන අවස්ථාව. ඊළඟට අභිනිබ්බත්ති කියන්නෙ අභ්‍යන්තර නිර්මාණය. කුමරෙකුගේ හෝ කුමරියකගේ විඤ්ඤාණයක් මවු කුසකට ඔක්කන්ති වුනේ නැත්නම්, ඒ මවු කුස තුල අභිනිබ්බත්තියක් සිද්ධ වෙනවද කියල බුදුන් වහන්සේ අහනවා. ඒ කියන්නෙ ඔක්කන්තියෙන් පස්සෙ මවු කුස තුල සිද්ධ වන අභිනිබ්බත්තියක් පැහැදිලිවම තියෙනවා. මවු කුස තුල දරුවා වැඩෙනවා කියන එකයි මේ කියන්නෙ.

ඊළඟට ඛන්දානං පාතු භාවෝ කියන්නෙ ස්කන්ධයන්ගේ පහළ වීම. මේ මස් ලේ කය ඝනීභවනය කරල පහළ වීම, ඝනීභවන රූපස්කන්ධයේ පහළ වීම. ඊළඟට ආයතනානං පටිලාභෝ කිව්වම නව ආයතන ප්‍රතිලාභය හදනවා. ඒ කියන්නෙ ඇස, කන, නාසය ... ආදී සියලු ඉන්ද්‍රියන් ලබල, අවිද්‍යාවෙන් ආපු සසර ගමන නිසා නැවතත් ඇහැට රූප, කනට ශබ්ද, නාසයට ගන්ධ .... ආදී වශයෙන් ලබා ගන්නා ආයතන බවට පත් කර ගන්නවා. අයං වුච්චති භික්ඛවේ ජාති, මහණෙනි මේකට ජාතියයි කියනව කියල බුදුන් වහන්සේ ජාතිය ගැන විග්‍රහ කරල තියෙනවා. නමුත් පටන් ගත්තු තැන ඉඳන් බැලුවොත් සාමාන්‍යයෙන් මතු පිටින් දකින්න තියෙන්නෙ එක ජාතියයි. ඒ කියන්නෙ ආයතන ප්‍රතිලාභය ලබා ගෙන මවු කුසින් බිහි වන වෙලාව විතරයි දැන් ජාතිය කියල දකින්නෙ. වෛද්‍ය විද්‍යාව ගත්තොත්, මවු කුසකට ඇවිත් අභිනිබ්බත්තියේ පටන් ඉදිරියට දකිනවා. ඊට පෙර සිද්ධ වන ඔක්කන්ති වීම පේන්නෙ නෑ. ඊටත් පෙර ගන්ධබ්බයා සහ පටිසන්ධිය පේන්නෙත් නෑ. ඒ කියන්නෙ ජාති, සංජාති, ඔක්කන්ති කියන්නෙ නොපෙනෙන පැත්ත. ඔක්කන්තියෙන් පස්සෙ සිද්ධ වෙන කොටස තමයි විද්‍යාවට අහු වෙන්නෙ.

සුළඟට අහු වෙච්ච පරඬැලා පතට සුළඟට ඕන විදිහට යමක් කරනව මිසක් පරඬැල් පතට ඕන විදිහට යමක් කරන්න බෑ. සුළඟ සුළියක් නම් ඒක කැරකි කැරකී සුළඟින් එහෙ මෙහෙ ගෙනියනවා. ඒ වගේම කර්ම ශක්තිය නමැති සුළියට, බලවේගයට අහු වුනාම ඒ ගන්ධබ්බයට කර්ම ශක්තිය අභිබවා යන්න බෑ. මස් ලේ කයක් සහිත මනුස්ස අවස්ථාවට විතරයි මස් ලේ කයේ ඉන්න කල් ඕන දෙයක් කරන්න පුළුවන් හැකියාවක් ලැබෙන්නෙ. මස් ලේ කයෙන් අහක් වෙච්ච කෙනාට (ගන්ධබ්බයට) කර්ම ශක්තිය ප්‍රධාන වෙනවා. මස් ලේ කයින් ඉන්න මනුස්සයට වගේ ඕන දෙයක් ක්‍රියාත්මක කරන්න බෑ. කර්ම ශක්තියේ ක්‍රියාදාමය එතැනදි ප්‍රධාන තැන ගන්නවා. ඒකයි වෙනස. ඊට අනුවයි සිතිවිලි එන්නෙ. හරියට අපි හීනයක් දකින කොට අපිට ඕන දේවල් කරන්න කියන්න බෑ වගේ. එතැනදි එන දේට අනුව අපි හැසිරෙනව මිසක් අපිට ඕන දෙයක් හිතල කරන්න බෑ. මේ භෞතික ලෝකයේ ජීවත් වෙලා ඉන්න කොට නම් අපිට හිතල මතල ඕන දෙයක් කරන්න පුළුවන්. අලියෙක් පන්න ගෙන එනව නම් දුවන්න පුළුවන්, හැංගෙන්න පුළුවන්, ගහකට නගින්න පුළුවන්. හීන ලෝකෙදි එහෙම බෑ. එතකොට අලියෙක් පන්න ගෙන එන දර්ශනයක් දැක්කොත්, ඒ අවස්ථාවෙදි අපි අහු වෙන දේකට මුහුණ දෙනව මිසක් අපිට ඕන දෙයක් කරන්න බෑ.

ඒ වගේ අවස්ථාවක් තමයි මේ ගන්ධබ්බ කියන්නෙ. කර්ම ශක්තියේ ස්වභාවය එහෙම එකක්. ඒක හරි අනාථ අවස්ථාවක්. ඒ අවස්ථාවෙදි එන දෙයක් අල්ලනව මිසක් ඒ අල්ලන දේ හොඳද නරකද කියල බල බලා ඉන්න වෙලාවක් නෑ. ඒක හොඳ වෙන්නත් පුළුවන්, නරක වෙන්නත් පුළුවන්. කර්ම ශක්තියෙන් තමයි ඒක තීරණය වෙන්නෙ. මොකක් හරි අල්ල ගත්තු එකෙන් අපිට ඕන විදිහට අහක් වෙන්න බෑ, ඉක්ම යන්න බෑ. මොකද අපි හැම වෙලේම පැවැත්මට බැඳිල ඉන්නෙ. තියෙන මානසිකත්වය අනුව ඒ පැවැත්ම ඉක්මවා යන්න බෑ. පැවැත්මේ කර්ම ශක්තියට ඕන දෙයක් කරන්න පුළුවන්. ඒ කර්ම ශක්තියේ වේගයෙන් අපිට අහක් වෙන්න බෑ. ඒ පැවැත්ම අමතක කරන්න, නිරෝධ කරන්න බෑ. රහතන් වහන්සේට විතරයි එහෙම නිරෝධ කරල ඒ පැවැත්මෙන් අහක් වෙන්න පුළුවන් වෙන්නෙ. මොකද උන්වහන්සේට බැඳීම් නෑ. ඒ නිසා රහතන් වහන්සේගෙ මානසිකත්වය කර්ම ශක්තියට වහල් කරන්න බෑ. නමුත් ඊට මෙහා ඉන්න කෙනෙකුට එහෙම නෑ.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# මෙත් වඩමු ...

**මෙත් සිත යනු සැමට නිවනම පැතීමය**
**සැමටම සුව සෙතම නිරතුරු සිතීමය**
**මානව දයා සෙනෙහස යන හැඟීමය**
**දත යුතු බුදු සමිඳු දෙසු මෙම නියාමය**

**"සුවපත් බව ලැබේවා" යයි පතන විට**
**කළ යුතු වෙයි එලෙස මිතු දම අවදි කොට**
**කිව හැකි වුවද එපරිදි හැම කෙනෙකු හට**
**පිවිතුරු බව රැඳිය යුතු හද මඬල යට**

**අනු පිළිවෙලක් ඇත මෙත් සිත වඩන විට**
**තම හට මෙත් වැඩුම කළ යුතු පළමු කොට**
**හිතවත් - අහිතවත් සෙසු හැම කෙනෙකු හට**
**දෙවනුව මෙත් වඩනු නිවනට යහපතට**

**සුවසේ නිදන්නට එලෙසම පිබිදෙන්ට**
**නපුරු සිහින කිසි විටෙකදී නොපෙනෙන්ට**
**සිත අලවනු පිණිස සෙසු හැම කෙනෙකුන්ට**
**මෙත් සිත පිහිට වෙයි යහපති දැනගන්ට**

**ගින්නෙන් විසෙන් විපතක් නැත කිසිම කලේ**
**සන්සුන් වෙලා සිත මුහුණෙහි සිරිය දිලේ**
**දෙවියන් රකිනු ඇත එය මෙත් සිතෙහි බලේ**
**සිහියෙන් මරණයද සිදු වෙයි මැරෙන වෙලේ**

**සිව් බඹ විහරණාදී යහ ගුණ වඩවා**
**තරහව - වෛර සිතිවිලි පසෙකට එළවා**
**අරි අට මග දෙසට පුහුදුන් සිත හරවා**
**ගත යුතු අමා නිවනෙහි දොරටුව අරවා**

පබැඳුම : පානදුරේ එස්.ඒ.එස්. පෙරේරා

# කේන්ද්‍රයෙන් පෙන්වන හේතු ඵල දහම...

8 වන කොටස

# නවග්‍රහ අපලවලට හේතු ඵල අනුව ධර්මානුකූල විසඳුම්

නවග්‍රහයින් බිහි වීමේ හේතු ඵල සම්බන්ධය පසුගිය කලාපයෙන් පැහැදිලි කළා. මනුස්සයා මූලික කරගෙන බිහිවෙච්ච ඒ නවග්‍රහයො ආශ්‍රයෙන් තමයි සපල / අපල කියල අවස්ථා දෙකක් උරුම කරල දෙන්නෙ. ඒක අහේතුකව සිද්ධ වෙන දෙයක් නෙවෙයි. මනුස්සයා විසින්ම ග්‍රහණය කරගත්තු හොඳ නරක දෙක අනුවම සිද්ධ වෙන දෙයක්. ලෝකයෙන් ග්‍රහණය කරල අල්ල ගත්තු දේවල් අනුව තමයි, ඒ සපල / අපල කියල අවස්ථා දෙකක් යෙදෙන්නෙ.

එතකොට සපල නම් ඉතින් ඒක කොහොමත් හොඳ නිසා ඒ ගැන විශේෂයෙන් කතා කරන්න අවශ්‍යතාවයක් නෑ. නමුත් අපල එන කොට ඒකෙන් වළකින උපක්‍රම ගැන හොයන්න වෙනවා. අන්න ඒ උපක්‍රම විදිහට අද ලෝකයා පාවිච්චි කරන්නෙ විවිධ මැණික් ගල්වලින් හදපු ආභරණ පැළඳීම, යන්ත්‍ර පැළඳීම, බෝධි පූජා තැබීම, සෙත් කවි කීම වගේ ප්‍රයෝග සම්පත්ති. ඒක නරක නෑ, හොඳයි. නමුත් මේ ග්‍රහ අපල එන හේතු ඵල ගැන මනුස්සයො දැනුවත් වෙලා නෑ. ඒ අපල වළක්ව ගන්න නැති කළ යුතු හේතුව ගැන දන්නෙ නෑ. ඒ නිසාම ප්‍රයෝග සම්පත්තිය මතම යැපෙන්න අද මනුස්සයින් පෙළඹිලා තියෙනවා. නමුත් මේ විදිහට ඒ ඒ ග්‍රහයින්ගෙන් අපල එන්න හේතුව දැන ගෙන, ඒ හේතුවට ප්‍රතිකර්ම කළා නම් ඒ ඒ ග්‍රහයින්ගෙන් එන අපල නැතිවීමට ප්‍රයෝග සම්පත්ති යොදනවට වඩා බොහොම සාර්ථකයි. ඒ වගේම ඒකෙන් අපල නැති වෙලා මතු සපල තත්ත්වයක් එන්නත්, මෙතෙක් ආපු දිගු සංසාර ගමනේ ඉදිරිය පුණ්‍ය ශක්තීන්ගෙන් බබළන්නත් හේතු වෙනවා. අන්න ඒ හේතු ඵල අනුව ආපු ග්‍රහ අපලවලින් මිදෙන ධර්මානුකූල ක්‍රමය තමයි මේ ලිපියෙන් ප්‍රධාන වශයෙන් හෙළිදරව් කරන්නෙ.

දැන් මේ නවග්‍රහයින් ගත්තම ඉස්සෙල්ලම එන්නෙ රවි. ඒ කියන්නෙ මනුස්සයින්ට ඉස්සෙල්ලම ස්වයං ප්‍රභා ආලෝකයෙන් එන ක්‍රියාකාරීත්වයක් / කාර්ය ශූරත්වයක් තියෙනවා. ඊට පස්සෙ ඒ ක්‍රියාකාරීත්වයෙන් ලෝකය අල්ල ගන්න යනවා. එතකොට ඒ ක්‍රියාකාරීත්වය ක්‍රමයෙන් පිරිහිලා කාලයක් යද්දි නරකට පාවිච්චි කළාම, අන්‍යයන්ට අවැඩ අසාධාරණ කරන්න යොදා ගත්තම, අනුන්ට නැගිට ගන්න බැරි වෙන්න පැත්ත දාන්න යොදා ගත්තම රවි අපල එනවා.

ඊළඟට සඳු ශක්තිය යොදා ගෙන හිතට වහල් වෙලා වැඩ කරන්න ගිහින් තමන්ගෙ වාසිය තකා අනුන්ගෙ හිත පාරවනවා, හිත් රිදවනවා, මනස දූෂ්‍ය කරනවා. එතකොට සඳුගෙන් අපල එනවා.



ඊට පස්සෙ යහපත් දේට සටන් කරල ජය ගන්න තිබ්ච්ච කුජ ශක්තිය නරකට පාවිච්චි කරල අනුන්ගෙ විනාසයට, අයහපතට සටන් කළාම කුජගෙන් අපල එනවා.

ඒ වගේම යහපත් දේ දැන ඉගෙන ගන්න තිබ්ච්ච බුධ ශක්තිය නරකට යොදවනවා. ඒ කියන්නෙ දරුවෙක් වගේ රඟපාල විනාසකාරී දේවල් ඉගෙන ගන්නවා. උදාහරණ විදිහට අනුන් මරන්න අවි ආයුධ හදන හැටි, වස විස හදන හැටි ඉගෙන ගන්නවා. ඒ වගේම දරුවන් විනාසකාරී දේවල්වලට පොළඹවනවා. එතකොට බුධගෙන් අපල එනවා.

ඊළඟට යහපත් දේට ගුරුහරුකම් නොදී ඒ වගේ විනාසකාරී දේවල්වලටම අනුන්ට ගුරුහරුකම් දුන්නම, යහපත් දේට ගුරුහරුකම් දෙන ගුණවතුන්ට නිග්‍රහ කළාම ගුරුගෙන් අපල එනවා.

සිකුරු කියන්නෙ සශ්‍රීකත්වය. යහපත් පැත්තෙන් සශ්‍රීක වීම එක පැත්තක්. ඒ කියන්නෙ ගොවිතැන් බත්, ධන ධාන්‍ය ආදියෙන් පිරිල, ගේ දොරවල් මං මාවත්, ආහාර පාන, ඇඳුම් පැළඳුම් ආදිය අඩුවක් නැතිව ලැබිල, යහපත් විදිහට කාම සම්භෝගයන් විඳල, උසස් රසාස්වාදයන් ගෙනෙන දහම මුසු කර ගත් නාට්‍ය සංගීත වගේ පැත්තෙන් සශ්‍රීක වෙලා සුගතිගාමී පැත්තට යොමු කරන සශ්‍රීකත්වයක් තියෙනවා. ඒ වගේම ඒ ලැබෙන සශ්‍රීකත්වයෙන් අයුතු ප්‍රයෝජන අරගෙන මනුස්සයින් කාමයට සම්බන්ධ කරල දූෂණය කරන්න කටයුතු කරන කොට ඒකෙ නරක පැත්ත එනවා. උදාහරණ විදිහට ඒ ලැබිච්ච සශ්‍රීකත්වය උපයෝගී කර ගෙන මනුස්සයින් සුරා සූදු දුරාචාරවලට ඇද දමන නොයෙක් විකෘති තරඟ ඔට්ටු ආදියත්, විවිධ කාමුක දර්ශන රැගත් චිත්‍රපට ආදියත්, කාමුකත්වයට ඇද දමන නොයෙක් විලාසිතා ආදියත් ව්‍යාප්ත කරල මනුස්සයා තිරිසන් තත්ත්වයට පත් කරන්න කටයුතු කරන කොට සිකුරුගෙන් අපල එනවා.

ඊළඟට මනුස්සයින්ට හෙණ ගස්සවන වැඩ කරනවයි කියන්නෙ සෙනසුරු අපල. නරක දේවල් හෙණ ගස්සවල විනාස කරන්නෙ නැතිව හොඳ දේට හෙණ ගස්සවනවා. උදාහරණ විදිහට දුගී, මගී, යාචක, මහලු අයට දුක් කරදර දීම, අනුන්ගෙ දේ කඩා වඩා ගන්න අනුන්ට කරන සාප කිරීම්, අනුන්ගෙ ගේ දොර වතු පිටි විනාස කිරීම්, අත පය කඩල ජීවිත හානි කිරීම් වගේ දේවල් කරනවයි කියන්නෙ හෙණ ගහන වැඩ. ☞

එතකොට සෙනසුරු අපල එන්න වැඩ පිළිවෙලක් හදා ගත්ත වෙනවා.

ඊට පස්සෙ රාහු ගතිය කියන්නෙ හැම පැත්තම උපරිමයෙන්ම වහන්න බලනවා, හංගන්න හදනවා. විශේෂයෙන් යථාර්ථය වහනවා. අයහපත් පැත්ත වහල යහපත් පැත්ත විවෘත කිරීම තමයි මූලික හොඳ ලක්ෂණය. ඒකෙ නරක පැත්ත තමයි යහපත් පැත්ත හංගන එක. ඒ කියන්නෙ ලෝකයාට යහපතක් වෙන්නෙ තියෙන්නෙ යමකින්ද ඒ පැත්ත වහනවා. උදාහරණ විදිහට ගත්තොත් යහපත් ධර්මය මතු වෙන්න ඉඩ නොදී වහනවා, ඒකට බාධා කරනවා. එහෙම නැත්නම් පොදුවේ මනුස්සයින්ට ලෞකික වශයෙන් හෝ යහපතක් වෙන වැඩ පිළිවෙලක් ඇත්නම් ඒක වහන්න උත්සාහ කරනවා. ඒ විදිහට යහපත වහන්න ගියාම රාහුගෙන් අපල එනවා. අන්තිමට තමන්ටත් වැහෙනවා. මොනව හරි වැඩක් කරන්න ගියාමත් ඒකට අවශ්‍ය ඥාන ශක්තිය නොලැබී අමතක වීම්, අඩු පාඩුකම් ඇති කරනවා. ඒ කටයුත්ත වැහෙන විදිහට බාහිර බලපෑම් එන්න ගන්නවා.

දැන් මෙහෙම ගිහින් ඊළඟට කේතු ගති ලක්ෂණය තමයි යටපත් වෙච්ච / ක්ෂය වෙච්ච දේ නැවත වරක් මතු කරල සෘතු කරල දීම. ක්ෂය වෙච්ච නරක දෙයක් නැවත සෘතු කිරීම තමයි කේතු අපලවලට හේතු වෙන්නෙ. එහෙම නැත්නම් ක්ෂය වෙච්ච යහපත් දෙයක් මතු කරනකොට ඒකට බාධා කිරීම. උදාහරණ විදිහට සමාජයෙන් තුරන් කරල තිබිච්ච මොනව හරි දුරාචාරයක්, විස බීජයක් නැවතත් මනුස්සයින් අතරට ගෙනත් සෘතු කරල දුන්නොත්, එහෙම නැත්නම් විස රසායනයක්, භව භෝග විනාස කරන පැළෑටියක් නැවතත් පැතිරෙව්වොත් ඒක කේතු අපලයට හේතු වෙනවා. ඒ වගේම ක්ෂය වෙලා ගිය යහපත් දෙයක් නැවත ඉගෙන ගන්න අයට බාධා කළොත් ඒකත් කේතු අපලයට හේතු වෙනවා. මොළේ කල්පනා ශක්තිය අඩු වෙනවා. එතකොට සපල කියන්නෙ ඒකෙ අනික් පැත්ත. නරක ක්ෂය කරල, ක්ෂය වෙලා තිබිච්ච හොඳ පැත්ත මතු කළොත්, සෘතු කළොත් සපල වෙනවා. මේ හැම එකකම ඒ වගේ සපල අපල කියල දෙපැත්තක් තියෙනවා.

දැන් එහෙනම් මේ විදිහට ග්‍රහ අපලවලට හේතුඵල සම්බන්ධය ධර්මානුකූලව දැන ගත්තම, ඒ ඒ ග්‍රහයින්ගෙන් එන අපලවලට නියම ධර්මානුකූල විසඳුම මොකක්ද කියල තේරුම් ගන්න පුළුවන්. අපලයක් නම් ඒකට අදාල සපල පැත්ත මතු කරන්න තමන්ගෙ දායකත්වය ලබා දුන්නම ඒ ඒ ග්‍රහයින්ගෙන් එන්න තියෙන අපල නැති වෙන්න හේතු වෙනවා. හේතු ඵල සම්බන්ධය දැන ගෙන ඥාන ගෝචරව තමන්ටම ඒ ප්‍රතිකර්ම කර ගන්න පුළුවන්.

එහෙනම් රවිගෙන් එන අපල දුරු කර ගන්න, ගිලිහිලා ගියපු යහපත් ක්‍රියාකාරීත්වය නැවත නගා සිටුවන්න ඕන. ක්‍රියාකාරීත්වය එන්න නම් ප්‍රඥාව වඩන්න ඕන. ප්‍රඥාව සූර්යාට තමයි උපමා





කරන්නෙ. ප්‍රඥාව නැගුවොත් රවිගෙන් විතරක් නෙවෙයි, අනික් ග්‍රහයින් 8 දෙනාගෙන් එන අපලත් දුරු වෙන්න මූලික අඩිතාලම වැටෙනවා. මොකද සූර්යා / ප්‍රඥාව නැගෙනවා කියන්නෙ අනික් ග්‍රහයින් 8 දෙනා මුල් කර ගෙන දියත් කරපු නරක පැත්තත් නැණ නුවණින් තේරුම් අරගෙන, ඒවායින් වැළකිලා යහපත් පැත්ත කරන්න පෙළඹීමක්. එතකොට තමන්ගෙන් ගිලිහිච්ච සූර්ය ශක්තිය නැවත ඇදල ගන්නවා. ඒ ශක්තිය ඇදුනම භෞතිකවත් ශරීර ගත වෙනවා. ප්‍රඥාව වඩන කොට මනෝමය කයත් ක්‍රමයෙන් දීප්තිමත් වෙන්න පටන් ගන්නවා. එතකොට අපලවලට අදාල කළු කිරණ ඇදෙන්න විදිහක් නැතිව යනවා.

එහෙනම් ප්‍රඥාවට හේතු කාරක වන දේවල් ක්‍රියාත්මක කරන්න ඕන. එතනදි ප්‍රධාන කාරණය තමයි ලෝකෝත්තර පැත්තට නැඹුරු වන බණක් අහල ඒ අනුව පිළිපැදීම. ඒ කියන්නෙ ප්‍රණීත දහම, කෙලෙස් දුරු වෙන්න හේතු වන දහම. ඒ වගේම අනික් අයත් ඒ සඳහා යොමු කිරීම, ඒ අයටත් ප්‍රඥාව වඩා ගන්න උදව් උපකාර කිරීම. ලෞකික වශයෙන් ඒ සඳහා යොමු වුනත් ඒකත් දෙවෙනියට හොඳයි. නමුත් ඉතින් බුද්ධ සාසනයක් පවතින කාලයක, ඒ ලෝකෝත්තර දහම පවතින කාලයක ලේසිම සහ බලවත්ම ක්‍රමය තමයි ලෝකෝත්තර දහම දැන ගෙන ඊට අනුකූලව ප්‍රඥාව නැගීම. රවි අපලයට මැණික් ගල් පළඳිනව කියන්නෙ එක්තරා ප්‍රයෝග සම්පත්තියක්. එතකොට නව ග්‍රහයින්ගෙන් එන අපලවලට ප්‍රයෝග සම්පත්තීන් 9 ක් යොදන්න වෙනවා. නමුත් හරියට ප්‍රඥාව වැඩුවොත් ඒ එකක්වත් අවශ්‍ය වෙන්නෙ නෑ.

ඊළඟට සඳු අපල දුරු කර ගන්න තියෙන ප්‍රධානම ප්‍රතිකර්මය තමයි චිත්ත ප්‍රසාදය ඇති කිරීම. ඒ කියන්නෙ යහපත් පැත්තෙන්. මනුස්සයින්ගෙ හිත් රිදෙව්ව නම්, හිත් දූෂ්‍ය කළා නම් ඒකෙ විපාකය තම තමන්ටත් එනවා. ඒකෙන් තමන්ගෙ හිතත් දූෂ්‍ය වෙනවා, නිතර නිතර හිත් අමනාපකම්වලට, ශෝකී අවස්ථාවන්ට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. දැන් එහෙනම් චිත්ත ප්‍රසාදය නැගෙන්න හේතු වන වැඩ පිළිවෙලක් දියත් කළාම සඳු සපල වෙනවා. ඉතින් චිත්ත ප්‍රසාදය නගා ගන්නත් තියෙන හොඳම ක්‍රමය තමයි බුද්ධ, ධම්ම, සංඝ කියන ගුණ සිහි කිරීම. වෙනත් විදිහකින් කියනව නම් සූ විසි ගුණවලට ඇතුල්වීම. ඒ ගුණ තමනුත් අහල දැන ගෙන, අනුන්ටත් අහන්න සලස්වල ඊට අනුව කටයුතු කිරීම. එතනදිත් අර කලින් කියපු විදිහට ප්‍රඥාව වැඩීමක් තමයි වෙන්නෙ. එතකොට ඒ කෙරෙහි චිත්ත ප්‍රසාදයත් නිකම්ම මතු වෙනවා. ඒ වගේ චිත්ත ප්‍රසාදයන්ට හේතු වන විවිධ පිංකම්, පූජා කටයුතුත් ඒකටම අයිති වෙනවා. ලෞකික වශයෙන් යහපත් පැත්තකින් කෙනෙක්ගෙ හිත සතුටු වෙන විදිහට කටයුතු කළත් ඒකත් හොඳයි.

ඒ විදිහට යහපත මතු කරල දෙන්න, යහපත් ජයග්‍රහණයක් අත් කරල දෙන්න තරඟකාරීත්වයක්, සටනක් ලබා දුන්නම කුජ සපල වෙනවා. එතනදිත් ලෝකෝත්තර පැත්ත විශේෂයි.

උදාහරණ විදිහට යටපත් වෙලා තියෙන දහම නැවත මතු කරල මනුස්සයින් අතරට ගෙනියන්න ගියාම ලේසි නෑ. ඒ සඳහා විවිධ බාධක කරදර එනවා. ඒ සඳහා යහපත් විදිහට හොඳ තරඟකාරීත්වයක් දීල, සටනක් දීල ජයග්‍රහණයක් අත් කරල දුන්නයි කියන්නෙ කුජගෙ හොඳ පැත්ත. ඒ සඳහා උපනිශ්‍රය වන අනිත් කටයුතුත් ඒකටම අයිති වෙනවා. ඒ වගේම ලෞකික පැත්තෙන් මනුස්සයින්ට යහපත් විදිහට ජීවත් වෙන්න අවශ්‍ය පරිසරය සකස් කරල දෙන්න සටන් කරනවයි කියන්නෙත් යම් කිසි විදිහකින් කුජ සපල වීමක්. උදාහරණයක් විදිහට යහපත් සමාජයකට වින කරන සොර සතුරන් එක්ක සටන් කරල ඒ අය පරාජයට පත් කිරීම ඒ වගේ දෙයක්. නමුත් ඒ කාරණය අරකට දෙවෙනි වෙනවා.

ඊළඟට දරුවන්ට යහපත් දේවල් ඉගැන්නුවොත්, තමනුත් යහපත් දේවල් ඉගෙන ගත්ත නම් බුධ සපල වෙනවා. ඒ කියන්නෙ කලින් නරක දේවල් ඉගෙන ගත්ත නම්, උගන්වන්න සහයක් ලබා දුන්න නම්, දැන් අර කියපු යහපත් ලෝකෝත්තර පැත්තට හේතු වෙන දේවල් ඉගෙන ගන්නවා, උගන්වනවා. එහෙම නැත්නම් ඒ සඳහා තමන්ට පුළුවන් විදිහට පහසුකම් සලස්වනවා. ඉතින් ඉගෙනීමට අවශ්‍ය පොත් පත් ආදිය ලබා දෙනවයි කියන්නෙත් යම් කිසි විදිහක පහසුකම් සැලසීමක් තමයි. එතනදිත් අර කලින් වගේම ලෝකෝත්තර පැත්ත ප්‍රධානයි, ලෞකික පැත්ත දෙවෙනියි. ඒ කියන්නෙ ලෝකයේ ජීවත් වෙන්න අවශ්‍ය සමාජ, ආර්ථික, විද්‍යා ආදී ලෞකික දැනුම් ඉගෙනුම්වලට වඩා ලෝකයෙන් එතෙර වෙන්න උපකාරී වන සද්ධර්මය දැන ඉගෙන ගත්තම, ඒ සඳහා පහසුකම් ලබා දුන්නම බුධ සපල වෙන්න ප්‍රධාන වශයෙන්ම හේතු වෙනවා.

ඒ සඳහා අවශ්‍ය කරන ගුරුහරුකම් හරියට දුන්නොත් ගුරු සපල වෙනවා. ඒකත් අර වගේම ලෝකෝත්තර, ලෞකික කියල කොටස් 2 ක් තියෙනවා. ලෝකෝත්තර ගුරුහරුකම් අග්‍රයි, ශ්‍රේෂ්ටයි. ලෞකික වශයෙන් යහපත් ගුරුහරුකම් වුනත් බොහොම හොඳයි, නමුත් ඒක දෙවෙනියි. එතකොට තමන්ට ඒ සඳහා ගුරුහරුකම් දෙන්න හැකියාවක් නැත්නම්, ගුරුහරුකම් දෙන අයට අවශ්‍ය පහසුකම් සලස්වල ඒ සඳහා මොන පැත්තකින් හරි සහයෝගයක් ලබා දෙන්න පුළුවන් නම්, ඒකත් ගුරු සපල වෙන්න හේතු වෙනවා. අඩු ගානෙ තමන්ට පුළුවන් විදිහට වචනයෙන් හරි සහයෝගයක් ලබා දෙන්න පුළුවන් නම් ඒකත් වැදගත්.

ඊළඟට ලෝකයාට යහපත් විදිහට සශ්‍රීකත්වයෙන්, සතුටින් ඉන්න පුළුවන් වාතාවරණයක් සලස්වල දුන්නොත් සිකුරු සපල වෙනවා. එතනදිත් ලෝකෝත්තර මාර්ගය වඩා ගන්න පිරිසට අවශ්‍ය වන චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන ප්‍රත්‍ය ආදී කටයුතුවලින් සශ්‍රීකත්වය සලස්වල දුන්නොත් ඒක විශේෂයි. ඒ වගේම ඒකට උපනිශ්‍රය වන ගොවිතැන් බත්, වැව් අමුණු, ළිං පොකුණු, මං මාවත් ආදිය හදා දීල, ගස් වැල් වවා හදා දීල ඒ කටයුතුවලින් සශ්‍රීකත්වයක් ලබා දෙන්න කටයුතු කළොත් ඒකත් සිකුරු සපල වෙන්න හේතුවක් වෙනවා.

ඊළඟට මනුස්සයින්ට හෙණ ගැහුව වගේ එන දුක් කරදර නැති කරල



දුන්නොත් සෙනසුරුගෙන් එන අපල දුරු වෙන්න හේතු වෙනවා. එතනදිත් අර කලින් කියපු වගේ ලෝකෝත්තර මාර්ගය වඩන අයට තියෙන බාහිර දුක් කරදර බාධක මග හරව ගන්න උදව් උපකාර කරනව නම් ඒක විශේෂයි. උදාහරණ විදිහට බණ භාවනා කරන භික්ෂූන් වහන්සේ නමක් හෝ බණ භාවනා කරමින් තමන්ගෙ අඹු දරුවන් පෝෂණය කරමින් යන ගිහියෙක් හෝ හෙණ ගැහුව වගේ, ඉන්න තැනක් නැතිව කන්න බොන්න අඳින්න නැතිව එක තැන් වෙලා ඉන්න පුළුවන්. ඒ වගේ අයට කරන උදව් උපකාර, සාමාන්‍ය විදිහට කාල බීල මුකුත් නොකර ඉන්න අයට කරන උදව් උපකාරවලට වඩා අග්‍රයි. ඊට අමතරව දුගී, මගී, යාචකාදීන්ට කරන උදවු උපකාරත් සෙනසුරු අපල දුරු වෙන්න හේතු වෙනවා. ඒ වගේම මේ සෙනසුරු අපල එන්න හේතුව, තමනුත් මේ වගේ කවද හරි දවසක අනුන් හෙණයට හුරු කරල අනුන්ට හෙණ සලස්වපු හේතුවක විපාකයක් කියල දැන ගෙන, මින් මතු ඒ විදිහෙ හෙණ හුරු කරන වැඩ කරන්නෙ නෑ කියල ආයති සංවරයේ පිහිටල, දැනුත් හෙණයට හුරුවෙච්ච අය ඒකෙන් මුදව ගන්න කටයුතු කරනව නම්, සමාජයේ තියෙන හෙණ හුරු ලක්‍ෂණය තුරන් කරන්න කටයුතු කරනව නම්, ඒකත් විශේෂයෙන් හෙණ හුරු අපලවලට කරන ප්‍රඥා ගෝචර ප්‍රතිකර්මයක් වෙනවා.

ඊළඟට මනුස්සයින්ට / සමාජයට තියෙන වැහුම් ඇරල දෙන්න කටයුතු කළොත් රාහු සපල වෙන්න හේතු වෙනවා. වැහිල තියෙන යථාර්ථයක් ඇරල දුන්නම රාහුගෙන් සපල වෙනවා. එතනදිත් මහා යථාර්ථයක් වන වැහිල ගිය ලෝකෝත්තර පැත්ත මතු කරල දෙන්න පුළුවන් නම් ඒක අග්‍රයි. ඊට අමතරව ලෞකික වශයෙන් වැහිල ගිය, මනුස්සයින්ට ප්‍රයෝජනවත් වන පැරණි වෙද හෙදකම්, ගොවිතැන් ක්‍රම, විවිධ ප්‍රයෝජනවත් සිල්ප සාස්ත්‍ර ආදිය මතු කරල දුන්නොත් ඒකත් රාහු සපල වෙන්න හේතුවක් වෙනවා. ඒ වගේම භෞතික වශයෙන් වැසී ගිය යම් කිසි ප්‍රයෝජනවත් ස්ථානයක් නැවත එළි පෙහෙළි කරල මනුස්සයින්ට ප්‍රයෝජන ගන්න පුළුවන් විදිහට මතු කරල දීමත් මේකට අයිති වෙනවා.

උදාහරණ විදිහට විවිධ හේතු නිසා වල් බිහි වෙලා වැහිල ගිය පූජනීය ස්ථානයක් නැවත මතු කරල දීල සැදැහැවතුන්ට වන්දනා මාන කරන්න, බණ භාවනා කටයුතු කරන්න සලස්වල දුන්නොත් ඒකත් විශේෂයි. ඒ වගේම වැහිල ගිය පාරක් තොටක් නැවත එළි පෙහෙළි කරල මනුස්සයින්ට නිදහසේ යන්න එන්න මං සලස්වල දුන්නම ඒකත් රාහු සපල වෙන්න හේතුවක් වෙනවා. රාහුට තියෙන්නෙ මිනිස් ඇඟක් සහ නයි පෙණයක් සහිත ඔළුවක්. ඒ කියන්නෙ රාහුගෙ ස්වභාවය හැම වෙලේම හිත දූෂ්‍ය කිරීම. පොඩ්ඩක් ඇත්නම් තරහ යනවා. ඒ වගේම ඔළුව හැරිච්ච අතේ ඇවිද්දවනවා. සර්පයා යන්නෙත් එහෙමයි. ඌට ගානක් නෑ. ඌ හැරුනෙ කොහාටද ඒ පැත්තට යනවා. රාහු අපල එන කොටත් මනුස්සයො වැඩ කරන්නෙ ඒ වගේ තමයි. ඔළුව හැරිච්ච හැරිච්ච අතේ යනවා. රාහුගෙ සපල පැත්ත ගත්තොත්, දන්නෙම නැතිව පින් දහම් කරන හොඳ පැත්තට හැරිල යනවා.

කේතු කියන්නෙ ක්‍ෂය වන දේවල් නැවත සෘතු කිරීම, ප්‍රතිසංස්කරණය. ඒකෙත් හොඳ නරක දෙපැත්තක් තියෙනවා. ක්‍ෂය වෙච්ච යහපත්

දේවල් නැවත ගොඩ නගල දුන්නොත් කේතු සපල වෙනවා. ඒක ඥානවන්ත ස්වභාවයක්. කේතු කියන්නෙ කකුල් නැති, මිනිස් ඔළුව තියෙන සර්ප ඇඟක් වගේ ස්වභාවයක්. මිනිස් ඔළුව නුවණට විශේෂ නිසා ඉගෙනීමට දැනීමට විශේෂයි. හැබැයි මිනිස් ඔළුව උස්ස ගෙන සර්පයට යන්න බෑ. උදාහරණ විදිහට දක්ෂ විද්‍යාඥයෙක් කරන්නෙ නිකං ඇවිදින එක නෙවෙයි, එක තැන ඉඳගෙන ඔළුව පාවිච්චි කරල නුවණ මෙහෙයවල යමක් කරන එක. ඒ නිසා ඔත්පල වෙලා වගේ එක තැන තමයි ඉන්නෙ. ඒ තමයි කේතුගෙ ස්වභාවය. නමුත් පොත්පත් බලල මොනව හරි දැන ඉගෙන ගන්න තීක්ෂණ නුවණට හේතු කාරක වන ග්‍රහයෙක්. එතකොට හේතු ඵල බැලුවොත්, ක්ෂය කරල නැවත සෘතු කරපු ගති ලක්ෂණය තමයි තියෙන්නෙ. ඒ කියන්නෙ හොඳ හෝ නරක පැත්තට ක්ෂය කරල නැවත පරිවර්තනය කරනවා. උදාහරණ විදිහට මනුස්සයින්ට මහ ප්‍රයෝජනවත් ස්ථානයක් විනාස කරල ඒ ස්ථානය නරක දේකට යෙදෙව්වොත් අපල වෙනවා. ඒ වගේම මහ වටින ගහක් කපල විනාස කරල, ප්‍රයෝජනයකට නැති වල් ගහක් හිටෙව්වොත් ඒකත් අපලයක්. මේ වගේ විවිධ පැතිවලින් කේතු ගති ලක්ෂණය එනවා. සපල පැත්ත ගත්තොත්, නරක පැත්ත ක්ෂය කරල හොඳ පැත්තට පරිවර්තනය කරනවා, සෘතු කරනවා. උදාහරණ විදිහට මනුස්සයින්ට වින කරන මත් පැන් තිප්පොළක් ක්ෂය කරල විනාස කරල, ඒ ස්ථානයේ ප්‍රයෝජනවත් ඖෂධ නිෂ්පාදනාගාරයක් සෘතු කළොත් ඒක කේතු සපල වෙන්න හේතු වෙනවා. එහෙම නැත්නම් ළමයින්ට නරක දේවල් උගන්වන ස්ථානයක් විනාස කරල සමාජයට යහපත් දේවල් උගන්වන ස්ථානයක් බිහි කළොත් ඒකත් කේතු සපල වෙන්න හේතු වෙනවා.

එතකොට මේ ග්‍රහයො ගත්තොත් සංසාර පැවැත්ම නිසා ලෝකෝත්තර පැත්තට සාපේක්ෂව එකක්වත් හොඳයි කියන්න බෑ. කැපුනම දැලි පිහිය හොඳයි කියන්න බෑ වගේ. ඒක දාමරිකයන්ට ලැබුනොත් මාරාන්තික අවියක්. භික්ෂූන් වහන්සේට නම් ඒක ප්‍රයෝජනවත් යහපත් උපකරණයක්. ඒ වගේ ග්‍රහයින්ගෙනුත් ඥාන කාරක වැඩ / ඥාන අකාරක වැඩ දෙකම කරන්න පුළුවන්. ඒ නිසා කේතු හිටිය පලියට ඥානය වැඩෙන්නෙ නෑ. කේතු හොඳට හිටියොත් පොත්පත් දැන ඉගෙනීම්වලින් ඥානය ලබා ගන්න පුළුවන්. හැබැයි නරකට හිටියොත්, වැඩකට නැති අසභ්‍ය, විනාසකාරී පොත්පත්වලට තමයි හිත යන්නෙ. ඒවායින් වැඩකට නැති දේවල් තමයි සෘතු කරන්නෙ. මිසයිල බෝම්බ වගේ විනාසකාරී දේවල් හදන්න පුරුදු වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් මනුස්සයො කාමය පැත්තෙන් පහත් බවට ඇදල දාන නිෂ්පාදන, හඳුන්වාදීම් ආදිය කරන්න පුළුවන්. කේතු නරක පැත්තට හිටියම ඒ වගේ විනාසකාරී අදහස්ම තමයි එන්නෙ. තමන්ගෙ ජයග්‍රහණය තමන්ම වනස ගන්නවා. අනිත් ග්‍රහයින් ගත්තමත් එහෙමයි.

එතකොට මේ සියල්ල හේතු ඵල අනුව හිතන්න පුරුදු වෙන්න ඕන. පටිච්ච සමුප්පන්නව ඒ හේතුවෙන් බිහිවෙන ආකාරයයි, ඒක නිරෝධ කරන ආකාරයයි





ප්‍රඥාවෙන් දකින්න ඕන. යෝ පටිච්ච සමුප්පාදං පස්සති සෝ ධම්මං පස්සති කිව්වෙ ඒකයි. යමෙක් පටිච්ච සමුප්පාදය දකීද, ඔහු ධර්මය දකී. යෝ ධම්මං පස්සති, සෝ මං පස්සති, යමෙක් ධර්මය දකීද, හේ මා (බුදුන් වහන්සේ) දකී. මේ විදිහට තමයි අද අර්ථ දක්වන්නෙ. නමුත් මේ මං පස්සති කියන්නෙ, නියම අර්ථයෙන් ගත්තොත් මාර්ගය දකිනවයි කියන එක. යන එන මං, යන එන මාර්ග. ඒකයි නිවැරදි විදිහට නම් මං පස්සති කියන්නෙ. මං කියල බුදුන් වහන්සේ තමන් වහන්සේව පුද්ගලත්වයෙන් හඳුන්වල නෑ. ඒවා ඉතින් පසුව හදා ගත්තු මත. පටිච්ච සමුප්පාදය තුළින් තමයි ආර්ය අෂ්ඨාංගික මග දකින්නෙ. ඒ තමයි ධර්මතාවය දැකීම. යෝ ධම්මං පස්සති සෝ මං පස්සති, යමෙක් ධර්මය දකීද ඔහු මාර්ගය දකී. ඉතින් ඒ මාර්ගය මුළින්ම පෙන්වා දුන්නෙ බුදුන් වහන්සේ. මාර්ගය හරියට දැක්කයි කියන්නෙ, ඒ මාර්ගය පෙන්වා දීපු බුදුන් වහන්සේ දැක්ක වගේ තමයි. ඒ කියන්නෙ බුදු ගුණ. ඒ වගේම මාර්ගය තුළින් අවසානයට යන්නෙ ශ්‍රාවක බුද්ධත්වය කරා. බුද්ධ කියන්නෙ භවය උදුරා දැමීම. ඒ නිසා ඒ කාරණය ඒ විදිහට තේරුම් ගන්න ඕන.

දැන් ඉතින් මේ කියපු කාරණා හේතු ඵල අනුව නැණ නුවණින් තේරුම් ගන්නව මිසක් ඒවායින් රාමුවකට කොටු වෙන්න අවශ්‍ය නෑ. මේ ග්‍රහයින්ගෙන් එන අපල නැති කරල සපල කර ගන්න, මේ පෙන්වා දුන්නෙ යම් යම් හෝඩුවාවල් ටිකක් විතරයි. එහෙම නැතිව අහවල් අපලෙට අහවල් දේම කරන්න ඕන කියල කොටුවෙන්න අවශ්‍ය නෑ. තමන්ගෙ නැණ නුවණ මෙහෙයවල මේ පෙන්වා දුන්න මූල ධර්මය අනුව ඒ වගේ අපලවලට කරන්න ඕන කටයුතු තේරුම් ගන්න ඕන. ඒක අහවල් දේමයි කියල සීමා කරන්න බෑ. ඊට ගැලපෙන කටයුතු ඕනෑ තරම් කරන්න පුළුවන්. මේ ග්‍රහයො නව දෙනාගෙන්ම එන සපල / අපල ගැන ඒ විදිහට හේතු ඵල ඇතිව තේරුම් ගන්න ඕන.

දැන් මේ පෙන්වා දුන්න ධර්මානුකූල හේතුවලින් කරන්නෙ යහපත් සංඛාරයන් ගොඩ නැගීම. එතකොට අර කලින් කිව්ව විදිහට මැණික් ගල් පැළඳීම, යන්ත්‍ර පැළඳීම ආදී ප්‍රයෝග සම්පත්තිවලින් සිද්ධ වෙන්නෙ විපාකයට උපක්‍රමයක්. පෙර අත්බැව්වල කරපු අකුසල් කර්මවලින් එන විපාකයට උපක්‍රමයක් වශයෙන් ඒවා ප්‍රයෝග සම්පත්තියක් විදිහට පාවිච්චි කරන්න පුළුවන්. අර විදිහට හේතු ඵල දැන ගෙන ප්‍රතිකර්ම කළොත් අලුතින් යහපත් සමනන්තරයක් හැදෙනවා. එතකොට පෙර කරපු යහපත් අනන්තරයක් ඇදිල එන්න හේතු වෙනවා. ඒකෙන් කලින් තිබ්බච අපලයට විරුද්ධ දෙයක් නැගිල ඒක ගෙවා හරිනවා, ඒ ශක්තිය බිඳිල යනවා. ඒක තමයි නියම ප්‍රතිකර්මය. නරක විපාකයට අදාල අනන්තරයට උපක්‍රම තමයි මැණික්, යන්ත්‍ර පැළඳීම් ආදියෙන් කරන්නෙ. ඉතින් මේ ක්‍රම දෙකම අනුගමනය කරන කොට ලැබෙන ප්‍රතිඵල වඩාත් සාර්ථකයි. හැබැයි හේතු ඵල සම්බන්ධය දැන ගෙන කරන ප්‍රතිකර්ම ප්‍රධානයි.

**සටහන**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# වාස්තු විද්‍යාවේ හේතු ඵල සම්බන්ධය දහම් ඇසින් ....


**8 වන කොටස**

ළිංවලින් එන දෝස මග හරවා ගන්න ''ලකී බැම්බු'' කියන එක්තරා තෘණ පඳුරු විශේෂයක් ගැන පසුගිය කලාපයෙන් විග්‍රහ කළා. මේ තෘණ පඳුරු විශේෂය විවිධ වර්ගවලින් තියෙනවා. සමහර ඒවායේ සුදු පාට තීරු සහිත කොළ නෑ. නිකම්ම ලා කොළ පාටට හුරු දිගටි පත්‍ර තියෙන්නෙ. ඒ වගේම ඒවායේ පත්‍ර අර තරම් හීන් නෑ. තරමක් මහතයි. ඒත් මේ දෙවර්ගයම මේ දෝසය මග හරවා ගන්න පාවිච්චි කරන්න පුළුවන්. හැබැයි සුදු පාට ඉරි තියෙන වර්ගය නම් වඩා හොඳයි. ඒ වගේම දුටු සතුටු කියල තවත් පඳුරු විශේෂයක් තියෙනවා. හැබැයි මේ කියන්නෙ අර කොළ කැඳ හදන්න ගන්න, කොළ පාට පුංචි කොළ සහ දඬු සහිත පුංචි මල් පිපෙන දුටු සතුටු විශේෂය ගැන නෙවෙයි. අර කලින් කියපු ලකී බැම්බු වගේම දිගටි කොළ තියෙන සුදු පාට මලක් පිපෙන පඳුරු වර්ගයක්. අන්න ඒ වර්ගයත් මේ සඳහා පාවිච්චි කරන්න පුළුවන්. ඊට  අමතරව සුදු පාට මල් පිපෙන වද මල් ගහත් යොදා ගන්න පුළුවන්. හඳුනා ගැනීමේ පහසුව සඳහා ඒ සමහර ඒවායේ පින්තූර කිහිපයක් පහතින් පළ වෙනවා.

ඊළඟට විශේෂයෙන්ම නිවසේ ඊසාන දිගින් අත්තිවාරමේ පටන් වඩු රියන් 60 ක් ඇතුලත වැසිකිලි වළ තිබීමත් බරපතල දෝසයක් බව පැහැදිලි කළා. මෙතනදි වැසිකිලිය සහ වැසිකිලි වළ කියන්නෙ දෙකක්. ඊසාන දිසාවට වැසිකිලි වළත්, වැසිකිලියත් දෙකම හොඳ නෑ. විශේෂයෙන් වැසිකිලි වළ හොඳම නෑ. ඒකට තියෙන හොඳම සහ සුදුසුම විසඳුම තමයි ඒ වැසිකිලි වළ කඩා ඉවත් කිරීම. උපක්‍රමවලින්, බලපෑම යම් පමණකට අඩු කරන්න පුළුවන් වුනත් නැති කරන්න බෑ. ඒ වගේ උපක්‍රම වුනත් කරල බලලම හරියනවද කියල හරියටම තහවුරු කර ගන්න ඕන. ඒ නිසා වැසිකිලි වළ කඩල සුදුසු දිසාවකින් ඉදි කිරීම තමයි වඩාත් හොඳ. මොකද මේ වගේ බරපතල දෝසවලට පැලැස්තර දානවට වඩා ඒ දෝසය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම තමයි සුදුසු වෙන්නෙ.

හැබැයි ඒ ඉඩමේ තියෙන තත්ත්වය අනුව වැසිකිලි වළ කඩල ඉවත් කරන්න විදිහක් ඇත්තෙම නැත්නම්, යම් පමණකට හරි දෝසය කැපෙන්න ඒ වැසිකිලි වළ සහ නිවස අතර හරහට වැහෙන්න අර කලින් සඳහන් කරපු පඳුරු හිටවීම තමයි කරන්න තියෙන්නෙ. එහෙම නැත්නම් වළ වටේ රවුමට හිටවන්නත් පුළුවන්. මොකද ඒ ගස් වර්ගයෙන් එන සුද්ධ කිරණ නිසා වැසිකිලි වළෙන් එන කළු කිරණ යම් පමණකට හරි කැපිල යනවා. හැබැයි හරහට හිටවන කොට ගේ පැත්තෙන් ඒ ස්ථානයට යන්න පාරක් පාවිච්චි කරනව නම්, ඒක නිකම්ම විවෘත වෙච්ච කඩුල්ලක් වගේ තියන්නෙ නැතිව සමාන්තර පේළි 2 ක් විදිහට හිටවල ඒ අතරින් ඉඩක් තියන්න ඕන. මොකද කිරණ






කියන ඒවා කෙළින් අතට ගමන් කරන නිසා, කෙළින්ම කඩුල්ල වගේ ඉඩ තිච්චොත් දෝස සහිත කිරණ ඒ හරහා ගේ පැත්තට එනවා. අර විදිහට දම්මම ඒ කිරණවලට එන්න විදිහක් නෑ. ඒ කාරණයත් රූප සටහනකින් පෙන්වා තියෙනවා. ඒ වගේම මේ කියපු පඳුරු වර්ගයට අමතරව කොළ පාට පාම් ගස්වලිනුත් එක්තරා ප්‍රමාණයකට ඒ දෝසය කැපෙන බව හොයාගෙන තියෙනවා.

ඊළඟට වැසිකිලි වළක් කඩල ඉවත් කරන කොටත් සුදුසු ක්‍රම වේදයක් අනුගමනය කරන්න ඕන. සාමාන්‍යයෙන් අඩි 15 ක් හෝ ඊට වඩා ගැඹුරු වැසිකිලි වළක් නම් නිකං පස් දාල පිරෙව්වත් ගැටළුවක් නෑ. මොකද එච්චර යට තියෙන අපද්‍රව්‍ය, කිරණ එක්ක උඩට ඇදීමක් ඒ තරම් සිද්ධ වෙන්නෙ නෑ. නමුත් සමහර වළවල් අඩි 3 - 5 ක් වගේ උඩින් තියෙන්නෙ. එතකොට ඉතින් ඉස්සෙල්ලම ගලි බවුසරයක් ගෙනත් ඒ වළේ අපද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම ඉවත් කරල මුළු වළ පිටින්ම ඉවත් කරන්න ඕන. වළ ඇතුලට කොන්ක්‍රීට් සිලින්ඩරයක් බස්සල තියෙනව නම් ඒකත් සම්පූර්ණයෙන් කඩල ඉවත් කරන්න ඕන. ඊට පස්සෙ පිරිසිදු පස් දාල හොඳට වහන්න ඕන. ඒ වගේම මේ විදියට වැසිකිළි වළක් වහනකොට සුදු හඳුන් කුඩු සහ කපුරු පෙති කුඩු මිශ්‍ර කරල අඩියෙන් අඩිය විසුරුවන්න පුළුවන් නම් වඩා හොඳයි. ඒ කියන්නෙ අඩියක් විතර පස් දාල වහල, සුදු හඳුන් කුඩු කපුරු කුඩු මිශ්‍රණයෙන් ටිකක් ඒ මත විසුරුවල, නැවතත් අඩියක් විතර පස් දාල වහල, නැවතත් ඒ මත අර මිශ්‍රණය විසුරුවනවා. ඒ විදියට වැහුවම තවත් සුද්ධ වෙනවා.

ඒ වගේම වැසිකිලි වළක් හාරන කොට ගෙදර ඊසාන දිසාවට අමතරව උතුරු දිසාවත්, නිරිත කෙළවරත්, නැගෙනහිරත් හොඳ නෑ. හැබැයි නැගෙනහිර වැසිකිලිය තිබුණට ගැටළුවක් නෑ. නිරිත කෙළවර තමයි ඊසාන දිසාවෙන් එන සුද්ධ ශක්තිය එකතු වන තැන. මේ නිරිත කෙළවර විතරක් නෙවෙයි නිරිත දිසාවෙත් වැසිකිලි වළක් තිබීම සුදුසු නෑ.  විශේෂයෙන් නිරිත කෙළවර කියන්නෙ ගෙදර ඊසානෙ හරි මැද ඉඳන් සරල රේඛාවක් ගැහුවම අනික් පැත්තෙ නිරිත දිග හරි මැද. ඒ කියන්නෙ දකුණයි බස්නාහිරයි හරි මැද. එතැනට කොහෙත්ම ගැලපෙන්නෙ නෑ. අන්න ඒ රේඛාව කැපෙන්න හොඳම නෑ. මොකද ඊසාන දිගින් එන සුද්ධ ශක්තිය අන්තිමට ගබඩා වෙන්නෙ නිරිත දිසාවෙ. එතකොට එතැන වැසිකිලි වළක් තිබුණොත් ඒක අර ශක්ති ගබඩාවට මහ බාධකයක්. කරන්නම දෙයක් නැත්නම් ඒ රේඛාව පන්නල ☞

දෙපැත්තෙ කොහේ හරි තැනකට දානව මිසක්, මේ ශක්ති ගලනය වන ස්ථාන අවහිර වුනොත් ඒක බරපතල දෝසයක් වෙනවා.

යම් කිසි විදිහකින් ඒ ශක්ති ගමන් කරන මාර්ග අවහිර වුනොත් ඒ ගෙදර අයට උපදින ළමයි සමහර විට ගබ්සා වෙන්නත් පුළුවන්. එහෙම වෙච්ච අවස්ථාත් තියෙනවා. ඒ වගේම වැසිකිලි වළක් හෝ ළිඳක් ගේ අත්තිවාරම ඇතුලට ආවොත් ඒ ගෙදර ස්වාමි පුරුෂයටයි, භාර්යාවටයි හරියට නිකං පිළිකාවක් වගේ ඇඟට හරි අමාරුයි. ඒක ඒ තරම් ලොකු දෝසයක්. හැබැයි ඇයි එහෙම වෙන්නෙ කියල තේරෙන්නෙ නෑ. මොකද ඒක වෛද්‍ය විද්‍යාවට ගෝචර වෙන කොටසක් නෙවෙයි. **සමහර විට බරපතල ගණයේ වාස්තු දෝස නිසා එන ලෙඩ රෝගවලට කොච්චර වෙද හෙදකම් කළත් අහන්නෙ නෑ. මොකද එතැනදි දෝසය තියෙන්නෙ ගෙදර නිසා, වාස්තු දෝසය ඉවත් කරනව හැර ශරීරයට වෙදකම් කරල වැඩක් නෑ. ඒ වගේ අවස්ථාවල ඒ වාස්තු දෝසය ඉවත් කළාම ලෙඩේ ඉබේම හොඳ වෙනවා. එහෙම නැත්නම් ඊට පස්සෙ කරන බේත් හේත් අහනවා.**

එතකොට නිවසක ඊසාන දිසාව විශේෂයෙන් වැසිකිලි වළකින් හෝ වෙනත් විසාල ඉදිකිරීමකින් අවහිර වීම සුදුසු නෑ. මොකද නිවසට අවශ්‍ය කරන සුද්ධ / අධ්‍යාත්මික ශක්තිය ඇදෙන්නෙ ඊසාන දිගින්. දැන් කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන් එතකොට ඊසාන දිසාව මහ ගස් වැල් ආදියෙන් වැහිල ස්වභාවිකව තිබීමත් ඒ කාරණයට බලපානවද කියල. ඇත්ත වශයෙන්ම ඊසාන කියන්නෙ පුළුවන් තරම් නිදහස්ව, බාධක අඩුවෙන් තියෙන්න ඕන පැත්තක්. මොකද අර සුද්ධ ශක්තිය බාධාවකින් තොරව ගලා එන්න ඕන නිසා. නමුත් ස්වභාවිකව හැදිච්ච ගස් කොළංවලින් එහෙම ගැටළුවක් නෑ. ඒ කියන්නෙ ගහක් වුනත් හුගක් උස ගිහින් උඩු වියනකින් වැහිල තිබීම ගැටළුවක් නෙවෙයි. හැබැයි වැඩකට නැති විදිහට, පාළු ගස් වැල්වලින් කැලේ වගේ බිම් මට්ටමේ පටන්ම අවහිර වෙලා ජරාවාස වෙලා තිබුනොත් ඒක සුදුසු නෑ. මල් ගස් වගේ දෙයක් වවල තිබුනට ගැටළුවක් නෑ. ඒ වගේම කුණු වළවල් තිබීමත් ඊසාන දිසාවට සුදුසු නෑ. ගෙදර අතු ගාන කුණු බැහැර කරන්න ඊසාන දිසාව පාවිච්චි කිරීමත් සුදුසු නෑ. එතකොට වැසිකිළිය විතරක් නෙවෙයි, ඊසාන දිසාව සම්පූර්ණයෙන් අවහිර වෙන විදිහට බාධක තිබීමත් ඒ ශක්ති ගලනයට බාධාවක්. ඒ නිසා ඒ පැත්ත පුළුවන් තරම් පිරිසිදුව නිදහස්ව තිබ්බොච්ච තරමට සුද්ධ ශක්තිය හොඳින් ගලා එනවා. මොකද ඒ කිරණ ගලනයට යම් කිසි අවකාශයක් තියෙන්නත් ඕන.

ඒ වගේම ළිඳ හෝ වැසිකිලි වළ (වැසිකිළිය හෝ නාන කාමරය අත්තිවාරමට සම්බන්ධ වීම හෝ ගේ ඇතුලෙ තිබීම ගැටළුවක් නෑ) නිවසේ අත්තිවාරමට අහු වුනාමත් ලොකු දෝසයක් එන බව පසුගිය කලාපයෙන් පැහැදිලි කළා. මොකද එක පැත්තකින් අත්තිවාරමට යා වුනාම වර්ග ඵලය වෙනස් වෙනවා. අනිත් පැත්තෙන් අසුද්ධ කිරණ ඇදිල සුද්ධ කිරණවලට බාධා වෙනවා. ඒ වගේ වෙලාවකට උපක්‍රමශීලීව ඒ දෝසය යම් ප්‍රමාණයකට මග හැර ගන්නත් ක්‍රමයක් තියෙනවා. එතනදි ඒ දෙක යා වෙන තැන අත්තිවාරම සම්පූර්ණයෙන් වෙන් වෙන්න පොඩ්ඩක් කඩල, ඒ හිඩැස අතරට සෘජුෆෝම් වගේ දෙයක් දාල ඒ සම්බන්ධය වෙන් කරල සිමෙන්ති දාල බැන්දම ඒ දෝසය යම් ප්‍රමාණයකට අඩු වෙනවා.

ඊළඟට ඉඩමක නිවසක් ඉදි කරන කොට වඩාත් සපල වෙන්න නම් ඒ ඉඩමේ හැඩයත් බලපානවා. එතනදි ත්‍රිකෝණාකාර, L හැඩැති (පොරෝ හැඩැති), අක්‍රමවත් හැඩ තල තියෙන ඉඩම් ඒ තරම් සුදුසු නෑ. වඩාත්ම සුදුසු වෙන්නෙ හතරැස් ඉඩම්. මොකද හතරැස් හැඩයට තියෙන කොට ඉඩමෙ වැඩිපුර ශක්තියක් ගැබ් වෙනවා. මා කරපු ඉම තමයි මාඉම කියන්නෙ. මා කරනවයි කියන්නෙ ඉවත් කරනවා කියන එක. ඉමෙන් එහා මා කරල තියෙන්නෙ. අන්න ඒ ඉම වටා ඇතුලෙ තියෙන වට ප්‍රමාණයට තමයි තමන්ට හිමි ශක්තිය අදින්නෙ. ඒ වට ප්‍රමාණයෙන් එහාට මා කරල තියෙන නිසා බලපෑමක් නෑ. එතකොට මේ විශ්වයෙන් එන කිරණ කියන්නෙ අපට ඇහැට පේන ඒවා නෙවෙයි. නාම ලෝකයේ තියෙන සියුම් කිරණ කොටස්. අර වගේ ත්‍රිකෝණාකාර උල් හැඩයට, අක්‍රමවත් හැඩයට ඉඩම පිහිටියොත් ඒ එන කිරණ ශක්ති ඉවතට විසි කරනවා. ඒකෙන් අවශ්‍ය ශක්තිය හරියට නොලැබී යනවා. නමුත් හතරැස් හැඩයෙදි එහෙම වෙන්නෙ නෑ.

දැන් මේ වගේ කාරණා ඔප්පු කරන්න පුළුවන් අවස්ථා ප්‍රායෝගිකවත් අත් දකින්න තියෙනවා. ත්‍රිකෝණාකාරව හදපු සමහර ගෙවල්වල ඒ ගෘහ මූලිකයා මැරෙනවා. ඊට පස්සෙ කුලියට හෝ මොන විදිහකින් හෝ ඒ නිවසේ පදිංචියට එන අයටත් ඉන්න බැරිව යනවා. නැත්නම් මොනව හරි හිතාගන්නත් බැරි කරදර බාධක එනවා. තනිකරම තුන් හුලස් හැඩැති ඉඩමේ ඒ හැඩයටම ගෙයක් හදල තියෙන අවස්ථාවල බොහෝ කොටම එහෙම වෙනවා. ඉතින් ත්‍රිකෝණාකාර ගෙවල්වල හොඳින් ඉන්න මනුස්සයො හොයා ගන්න අමාරුයි. අක්‍රමවත් හැඩ ගත්තමත් ඒ වගෙයි. ත්‍රිකෝණාකාර තුඩුවලින් පිට වන ශක්තිය හරියට ස්ථිති විද්‍යුතය වගෙයි. ඒ කියන්නෙ යම් කිසි තුඩක් තිබුනොත් ඒ තුඩට අනිත් තැන්වල තියෙන ආරෝපන සියල්ලම එකතු වෙලා ඇවිත් එතැනින් පිට වෙනවා. ඒ වගේ ත්‍රිකෝණාකාර උල් හැඩවලින් ශක්තිය ඉවතට විසි වෙනවා.

දැන් කෙනෙක් කියන්න පුළුවන්, එතකොට හතරැස් හැඩයෙත් වටේට තුඩු 4 ක් තියෙනව නේද කියල. කාරණය ඇත්ත. නමුත් එහෙම නැතිව ඉඩමක් ගන්න වෙනත් ක්‍රමයක් නෑ. ඉඩමක් ඵල දෙන විදිහට කඩන්න තියෙන හොඳම ක්‍රමය තමයි හතරැස් සෘජුකෝණාස්‍රාකාර හැඩය. ඒ කියන්නෙ අංශක 90 ක කෝණය තමයි හොඳම එක විදිහට ගන්න තියෙන්නෙ. අංශක 90 ට වඩා උල් හැඩයක් ගත්තම ඒක තුඩක් බවට පත් වෙලා ඔක්කොම ශක්තිය ඒ වටා ගොනු වෙලා ඉවතට විසි වෙනවා. ඉතින් ස්ථිති විද්‍යුතය නම් ප්‍රායෝගිකව පරීක්ෂණයකින් කරල පෙන්වන්න පුළුවන්. නමුත් වාස්තු විද්‍යාවෙදි එන සුද්ධ ශක්තිය, කාන්දම් ශක්තිය, කොස්මික් ශක්තිය වගේ ඒවා බොහොම සියුම් නිසා ඒවා අර විදිහට පෙන්වන්න පුළුවන් කමක් නෑ. ඒ ශක්ති තමයි කර්ම ශක්තියත් එක්ක සම්බන්ධ වෙලා මනුස්සයින්ගෙ ඕරා වළල්ල හරහා ඇද ගන්නෙ. හැබැයි නිවසකටත් වඩා හොඳම තැන තමයි ගල් ගෙයක් / ගල් ලෙනක් කියන්නෙ. ඒ වගේ තැනක තමයි හොඳම ශක්තිය තියෙන්නෙ. විශේෂයෙන් භාවනා වගේ කටයුතුවලට ඉතාමත් යෝග්‍යයි. ඒවායේ තියෙන්නෙ තනිකරම ස්වභාවික ශක්තිය.


දැන් කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්, එතකොට ගල් ගෙයක තියෙන අක්‍රමවත් හැඩය බලපාන්නෙ නැත්ද කියල. මනුස්සයා හතරැස් ආකාරයක ගෘහ නිර්මාණ කළත්, ඒ වගේ කෘතීම ආකෘතිවල හැම තිස්සෙම තියෙන්නෙ ස්වභාවික පිහිටීමක් නෙවෙයි. අස්වාභාවිකව වැලි, ගල්, ගඩොල්, ලී ආදිය ගෙනත් හදා ගත්තු ආකෘතියක්. නමුත් ගල් ගෙයක් කියන්නෙ ස්වභාව ධර්මයට එකඟව මනුස්සයාගේ කෘතීම ක්‍රියාකාරීත්වයේ බලපෑම අඩුවෙන් හැදිච්ච දෙයක්. උදාහරණයකින් පැහැදිලි කළොත්, පුංචි කාන්දම් කැල්ලක් නූලකින් එල්ලුවොත් ඒක අනිවාර්යෙන්ම උතුරු - දකුණු පැත්තට ස්වභාවිකවම දිසා ගත වෙලා පිහිටනවා. අන්න ඒක ස්වභාව ධර්මයට අනුකූලව සිද්ධ වෙන්නෙ. විශ්වයේ තියෙන කාන්දම් ක්ෂේත්‍රයට ඒක එකඟයි. හැබැයි අපි ඒ කාන්දම්

කැල්ල බිම තියල කරකැව්වොත් බොහොම අමාරුවෙන් තමයි ඒ පිහිටීමේ තියෙන්නෙ. එතකොට ස්වභාවික නෑ, අවුල් වෙලා. ගල් ගෙයක් මූලික වශයෙන් හැදිල තියෙන්නෙ ස්වභාවික විදිහට අවු, වැසි, ගිනි, පස්, සුළං ආදිය ඇවිත් මේ ස්වභාවික කාන්දම් ක්ෂේත්‍රයට අනුකූල වෙන විදිහට මනුස්සයින්ගෙ බලපෑමකින් තොරව. ඒ කියන්නෙ මනුස්සයා වාසය කරන්න සුදුසු විදිහට ඒකට යම් යම් අඩු වැඩි කිරීම් කළත් මූලික ආකෘතිය ස්වභාවිකයි.

හැබැයි අපිට ඒ ස්වභාවික විදිහටම ගෙයක් හදන්න පුළුවන්කමක් නෑ. අමුද්‍රව්‍ය සියල්ලම පිටින් ගෙනත් බලෙන් කපල කොටල ස්වභාවිකත්වය උඩු යටිකුරු කරල තමයි අපි ගෙයක් හදන්නෙ. එතකොට ඒ සියල්ලේම ස්වභාවික ආකෘතිය වෙනස් වෙලා තමයි ගේ හැදෙන්නෙ. ඒ නිසා ගෙයක් කියන්නෙ ගල් ගේකට සාපේක්ෂව ගත්තම ස්වභාවික චුම්භක, කොස්මික් ... ආදී කිරණ ශක්තිවලට විරුද්ධව කෘතීමව ගොඩ නගපු දෙයක්. ඒ නිසා ගල් ගෙයක් මොන හැඩයෙන් තිබුනත් ස්වභාවික ශක්තියට අනුකූල නිසා අර වගේ ගැටළුවක් නෑ. හැබැයි ඒ විදිහට ත්‍රිකෝණාකාරව හෝ අක්‍රමවත්ව අපි ගෙයක් හැදුවොත් ඒකෙන් දෝස එනවා. මොකද ඒ ස්වභාවික මූල ද්‍රව්‍යවල ආකෘතිය අපට ඒ විදිහට හදන්න බෑ. එහෙම කලාවක් ලෝකයේ නෑ. ඒක දිගු කාලීනව ස්වභාවිකව සිද්ධ වෙන ක්‍රියාවලියක ප්‍රතිඵලයක්. (මේ සම්බන්ධව ගහක උදාහරණයෙන් කරපු පැහැදිලි කිරීමක් 46 වන කලාපයෙන් ඉදිරිපත් කළා.) ඒ නිසා පුළුවන් තරම් ස්වභාව ධර්මයත් එක්ක පිහිටන විදිහට ඉන්න තරමට තමයි සපල වෙන්නෙ. රහතන් වහන්සේ ඒ විදිහට ඉන්න නිසාත්, මම මගේ කියල කිසිවක් අල්ල ගෙන නැති නිසාත් උන් වහන්සේට ඒ වගේ දෝස බලපාන්නෙ නෑ. ඒ ස්වභාවිකත්වයෙන් ඈත් වෙන තරමට ආබාධත් වැඩියි. මේ ස්වභාවිකත්වයට තවත් ආසන්න අවස්ථාවක් තමයි කටු මැටි ගෙයක් කියන්නෙ. මොකද පස්වල තියෙන ස්වභාවයට ආසන්නයෙන්ම පවතින නිසා.

එතකොට මේ හතරැස් හැඩය කියන්නෙ හොඳම නිසා නෙවෙයි, අඩුම ආබාධ සහිත අවස්ථාවක් නිසා. එතැනදිත් හතරැස් හැඩය කිව්වම සාමාන්‍යයෙන් දිග පළල සමානව ගන්නෙ නෑ. පොඩ්ඩක් අනුපාතය වෙනස් කරල සෘජුකෝණාස්‍රාකාර හැඩයට ගන්න ඕන. දැනට ලෝකයේ තියෙන වඩාත් සපලම අනුපාතය තමයි 1 : 1.62 කියන්නෙ. ඒක බටහිර විද්‍යාවෙදි Golden Ratio හෙවත් ස්වර්ණමය අනුපාතය කියල හඳුන්වනවා. අන්තර් ජාලයේ Golden Ratio කියල සෝදිසි කළා නම් ඒ කාරණය උදාහරණ සහිතව හොඳින් දැක බලා ගන්න පුළුවන්. ඒ අනුපාතය එන විදිහට තියෙන ස්වභාවික ස්ථාන, මනුස්ස මුහුණු, කලාත්මක දේවල්, ගෘහ නිර්මාණ, විවිධ වෙළඳ සංකේත ආදිය දැක බලා ගන්න පුළුවන්. එතනදි විශේෂත්වය තමයි, ඒ අනුපාතයම හෝ ඒ ආසන්න විදිහට අරන් තියෙන ඒ හැඩතල මනුස්සයො අතර ඉතාමත් ජනප්‍රියයි, සිත් ගන්නා සුළුයි, ලස්සනයි. බොහොම ආකර්ශනයක් තියෙනවා. ඒ වගේම පල දෙනවා. ඒ වෙළඳ සංකේත පවා ඒ අනුපාතයට අරගෙන යොදපු ව්‍යාපාර, සමාගම් ආදිය ලෝකයේ ප්‍රමුඛස්ථානයක් ගන්නවා.

එතනදි වඩාත් සපල අනුපාතය තමයි 1 : 1.62 කියන්නෙ. නමුත් ඒ මිම්ම ප්‍රායෝගිකව ඒ විදිහටම ගන්න බැරි නම් දළ වශයෙන් 1 : 1.4 - 1.8 දක්වා පරාසයක් ගත්තම ඒ අතරත් හොඳයි. කොහොම හරි 2 ට වඩා අඩු වෙන්න ඕන. ඒ අනුපාතයට විශ්වයේ යමක් හොඳට ස්වභාවිකව



නිර්මාණය වුනා නම් ඒවා බොහොම ලස්සනයි, මනස් කාන්තයි. ඒ අනුපාතය තියෙන මනුස්සයො ඉන්නව නම් ඒ අයත් බොහොම ලස්සනයි, ප්‍රිය මනාපයි. ඒ කියන්නෙ මුහුණ ගත්තොත් උස පළල අනුපාතය, ඒ වගේම අත් සහ උරහිස්වල අනුපාතය ... ආදී හැම අනුපාතයක්ම අර කියන ස්වර්ණමය අනුපාතයට තියේ නම් බොහොම ප්‍රිය මනාපයි, ප්‍රමුඛ-ස්ථානයක් ගන්නවා. මොනාලිසා පින්තූරය ගත්තමත් මුහුණෙ උස පළල ඔය අනුපාතයට තමයි තියෙන්නෙ. ඒ නිසා තමයි ඒ චිත්‍රය ලෝකයේ ජනප්‍රියම චිත්‍රයක් බවට පත් වුණේ. මෙතන තියෙන්නෙ ගණිතමය ආකෘතියක්. ඒක ඇතුලෙ ගැඹුරු විද්‍යාත්මක සංකල්පයක් තියෙනවා. ඒක තමයි විශ්වයේ තියෙන වඩාත් සපල ශක්ති තලය. ඒ කාරණය මේ වෙන කොට විද්‍යානුකූලවත් ඔප්පු කරල තියෙනවා. ඕනෑම කෙනෙකුට ප්‍රායෝගිකව අත් හදා බලන්න, පරීක්ෂා කරල බලන්න පුළුවන්. හොඳට තියෙන ලස්සන හැම ගෙයක්ම 1 : 1.62 හෝ ඒ ආසන්න අනුපාතයට තමයි අරගෙන තියෙන්නෙ. ඉඩමක් ගත්තමත් එහෙමයි. ඕනෑම දෙයක වඩාත් සපල අනුපාතය තමයි මේ.

ඒ නිසා 1 : 1 අනුපාතයට එන ගෙවල්, ඉඩම් කොහොමත් ඒ තරම් හොඳ නෑ. එතනදිත් ඉඩමට වඩා ගෙදර ප්‍රධානයි. ඒකටත් අර කියපු අනුපාතය තමයි ගැලපෙන්නෙ. 1 : 2 හෝ ඉන් එහාට යන අනුපාතයන් ගැලපෙන්නෙත් නෑ. ඒ කියන්නෙ පළල වගේ දෙගුණයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දිග එන විදිහට ගන්න හොඳ නෑ. උදාහරණ විදිහට 10 : 25 හොඳ නෑ. මොකද හේතුව එතකොට නිකං ලැයින් කාමර වගේ හැඩයක් ගන්නවා. ඒවා තනි දිග අතට තියෙන්නෙ. නිකං දණ්ඩක් වගේ. කම්පනය හරියට සිද්ධ වෙන්නෙ නෑ. එතකොට හරියට ශක්තිය වැඩ කරන්නෙ නෑ. ඒ නිසා ඒවායේ ඉන්න අයට සම්පත් ලැබීම් ඉතා අඩුයි. නිකං ඔහේ යන්තමට කාල බීල යැපෙනව විතරයි. දැනට ලැයිං කාමරවල ජීවත් වෙන අයට තියෙන්නෙත් ඒ වගේ තත්ත්වයක්. ඒ අයට කර්ම විපාක අනුව හැදෙන්නෙම ඔය වගේ ආකාර. මොකද කර්ම විපාක අනුව මිසක් ඒවත් නිකම්ම එනව නෙවෙයි. ඒ නිසා ඒ කාරණය ප්‍රායෝගිකවත් දකින්න තියෙන දෙයක්. ඉතින් තමන්ගෙ පදිංචි ස්ථානයක්, ව්‍යාපාරික ස්ථානයක් දිග පළල මේ අනුපාතයට එන විදිහට ගන්න පුළුවන් නම් වඩාත් සපලයි.

දැන් කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්, එතකොට හුඟක් දිගට තියෙන ශාලා, විශේෂයෙන් පන්සල්, පාසල් වගේ ගොඩනැගිලිවලටත් මේ කාරණය බලපානවද කියල. ඒවටත් ඒ කාරණය එක්තරා ආකාරයකට බලපානව තමයි. නමුත් බොහෝ වෙලාවට මේ කාරණය බලපාන්නෙ මමත්වයෙන්, ඡන්ද රාගයෙන් අල්ල ගෙන ඉන්න නිවාස, ව්‍යාපාරික ස්ථානවලට. පන්සලක, පාසලක තියෙන ශාලාවක්, රජයේ දිග ගොඩනැගිල්ලක් වගේ දෙයක් පොදු ස්ථාන මිසක් කවුරුවත් පෞද්ගලිකව අල්ල ගත්තු තැන් නෙවෙයි. ඡන්ද රාගයෙන් බැඳිල මගේ කියල අල්ල ගත්තු කෙනෙක් ඒවාට නෑ. හැබැයි ඒ වගේ තැනක් වුනත් ලාභ ලබන ව්‍යාපාරයක් පවත්වන්න යොදා ගත්තොත් ඒ දෝසය බලපානවා. මොකද ඡන්ද රාගයෙන් බැඳිල උපයන ඒවා ඒ ආකෘතියට අනුකූලව පවත්වන්න අමාරුයි. ඒ නිසා මේ කාරණය විශේෂයෙන් ලෝකය අල්ල ගෙන බැඳෙන අයට තමයි බලපාන්නෙ.

**සටහන**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 48 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය** -

♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ චතුර හිඳුරංගලගේ මහතා - නුගේගොඩ ♦ එස්.එම්. ජයසේකර මහතා - මාලබේ ♦ ඩබ්.ඒ. තිලිණවතී මහත්මිය - කඩවත ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ සාලින්ද ශ්‍රී ජයවර්ධන මහතා - මාලබේ ♦ පර්ෆෙක්ට් කම්පියුටර් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායක වූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය** -

♦ ආසිරි වනිගරත්න මහතා සහ දීපිකා සන්දනායක මහත්මිය ඇතුළු පවුලේ සැම - මහරගම - රු. 25,000/- ♦ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු. 10,000/- ♦ සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ♦ තුසිත නාකන්දල මහතා, සරූපා නාකන්දල මහත්මිය, දෙවින්යා දුව - ගල්කිස්ස- රු. 10,000/- ♦ අමිත් හඳුගොඩ මහතා ඇතුළු පවුලේ සැම - අත්තිඩිය - රු. 5,000/- ♦ සොනාලි සමරදිවාකර මෙනවිය - මහරගම - රු.5,000/- ♦ සුභාෂ් රණසිංහ මහතා - මගලෙගොඩ - රු. 5,000/- ♦ අමිල සල්ගාදු මහතා - බෝමිරිය - රු. 5,000/- ♦ සකුන්තලා ඒකනායක මහත්මිය, උදාර කරුණාතිලක මහතා, විදූෂිනී කරුණාතිලක දුව - බත්තරමුල්ල - රු. 5,000/- ♦ අමිල සුගතපාල මහතා - කඩවත - රු.5,000/- ♦ ජනක රුවන් මහතා - ගරාඬුව, මාතර - රු.5,000/- ♦ වසන්ත කොළඹආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - කොට්ටාව - රු.5,000/- ♦ ඩබ්. උපුල් පරාක්‍රම සිල්වා මහතා - මාරවිල - රු.4,000/- ♦ යසා අමරසිංහ මහත්මිය - එංගලන්තය - රු. 3,240/- ♦ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 3,000/- ♦ කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනට සහභාගි වන පින්වතුන් - රු. 3,000/- ♦ කේ.එම්. සමන්ත ප්‍රදීප් මහතා - කඹුරුගමුව, මාතර - රු. 3,000/- ♦ නදීරා සංජීවනී කුමාරි ගලගෙදරගේ මෙනවිය ඇතුළු පවුලේ සැම - කොට්ටාව - රු.3,000/- ♦ ටී.ටී.පී. සිල්වා මහත්මිය - නාගොඩ කළුතර - රු.2,500/- ♦ ඩබ්. ප්‍රේමවතී මහත්මිය සහ ඩබ්. නලිනසේකර මහතා - වලල්ලාවිට - රු. 2,500/- ♦ විපුල සංජීව මහතා ඇතුළු පවුලේ සැම- හෝමාගම - රු. 2,000/- ♦ ඔස්ටින් ප්‍රනාන්දු මහතා ඇතුළු පවුලේ සැම - පොල්ගහවෙල - රු. 2,000/- ♦ දේශිකා වික්‍රමසිංහ මහත්මිය ඇතුළු පවුලේ සැම - කොළඹ - රු.2,000/- ♦ කේ.ඒ. උදිත පෙරේරා මහතා - කොළොන්නාව - රු.2,000/- ♦ ජයනාත් සුභසිංහ මහතා - හෝමාගම - රු.2,000/- ♦ ඉන්ද්‍රා නිශ්ශංක මහත්මිය - කොස්වත්ත - රු.2,000/- ♦ මානෙල් කටුගම්පොළ මහත්මිය - මහරගම - රු. 2,000/- ♦ එස්. වික්‍රමආරච්චි මහතා - කැප්පිටිවලාන -රු.2,000/- ♦ කැස්බෑව මාකන්දන සඟසස සදහම් වැඩසටහනට සහභාගි වන පින්වතුන් - රු.2,000/- ♦ එම්.ඩී. ලලිත් චම්මික මහතා සහ එම්.ඩී. කුමාරි අනෝජා මහත්මිය - රු.2,000/- ♦ ජනිඳු බිම්සර පුතා - හඟවත්ත ක.වි. බාඳුරාගොඩ - රු.2,000/- ♦ ඉරේෂා ඇන්ඩෘ මහත්මිය, සරත් චන්ද්‍රසිරි ඇන්ඩෘ මහතා සහ ප්‍රනීෂා නයෝමි දියණිය - හෝමාගම - රු.2,000/- ♦ මනරම් හර්ෂ කුමාර මහතා - නාගොඩ, කළුතර - රු.2,000/- ♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ ඩී.ඩී. විතාරණගේ මහතා ඇතුළු පවුලේ සැම - නුගේගොඩ - රු.1,500/- ♦ තිලානි ද සිල්වා මහත්මිය සහ හේමාල් ද සිල්වා මහතා - මොරටුව - රු.1,500/- ♦ පී. මයිකල් ප්‍රනාන්දු මහතා සහ මේරි කැත්රින් පෙරේරා මහත්මිය - වෙන්නප්පුව - රු.1,500/- ♦ නෙරුන් කල්පජිත් මහතා - තලම්මහර - රු.1,500/- ♦ රේණුකා ගුණරත්න මහත්මිය ඇතුළු පවුලේ සැම - ගොතටුව - රු. 1,000/- ♦ ඉන්ද්‍රානි විසාකා ජයසිංහ මහත්මිය - බොරලැස්ගමුව - රු. 1,000/- ♦ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල - රු. 1,000/- ♦ එරංග ලියනගේ මහතා සහ බිසන්තිකා ගුණසේකර මහත්මිය - කළුබෝවිල - රු.1,000/- ♦ ක්‍රිෂාන්ත ප්‍රියමධු මහතා - කළුබෝවිල - රු.1,000/- ♦ නිහාල් ලියනගේ මහතා සහ චිත්‍රා ශ්‍රේරු මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ ගාමිණී ලියනගේ මහතා සහ නයෝමි තරංගා ලියනගේ මෙනවිය - නැදිමාල - රු.1,000/- ♦ එස්. ප්‍රසන්න ප්‍රියදර්ශන සිල්වා මහතා - ගල්කිස්ස - රු. 1,000/- ♦ සී.එම්.පී.සී. ලක්රුවන් මහතා - කළුතර - රු. 1,000/- ♦ රත්න පෙරේරා මහතා ඇතුළු පවුලේ සැම - කැස්බෑව - රු. 1,000/- ♦ සිරිමල් වේරගම මහතා - යොවුන්ගම - රු.1,000/- ♦ වයලට් වික්‍රමාරච්චි මහත්මිය - කටුබැද්ද - රු. 1,000/- ♦ අමිත් සමරනායක මහතා - බෙල්ලන්තර - රු. 1,000/- ♦ නුවන් යාපා අමරසේකර මහතා - රදාවාන - රු. 1,000/- ♦ අසංග සෙනරත් අඹගල මහතා - රදාවාන - රු. 1,000/- ♦ අමිල බාලසූරිය මහතා - ඉහළ උඩුගම්පල - රු.1,000/- ♦ ඒ.ඒ. ගීතානි මහත්මිය - මාලිම්බඩ - රු.1,000/- ♦ කසුන් තාරක වික්‍රමසූරිය මහතා, සිතුමිනි ප්‍රබෝධා මහත්මිය - පානදුර - රු.1,000/- ♦ චන්ද්‍රා පෙරේරා මහත්මිය, ඉසුරු උදාන වික්‍රමසූරිය මහතා - පානදුර - රු.1,000/- ♦ ඒ. විල්සන් පෙරේරා සහ එන්. කල්‍යානි පෙරේරා දෙපළට පිං පිණිස - ජයරානි නිරංජලා අමරතුංග මහත්මිය - තලපත්පිටිය - රු.1,000/- ♦ ඩී.එන්. විජේවන්ත මහතා - තවලම - රු.1,000/- ♦ ගුණදාස හේරත් මහතා - රු.1,000/- ♦ කේ.ඩී. ගීතා ගුණවතී මහත්මිය - පාදුක්ක - රු.1,000/- ♦ එම්.එල්.එම්. සුමනසූරිය මහතා ඇතුළු පවුලේ සැම - වේවැල්දෙනිය - රු.1,000/- ♦ කේ.කේ. ජයමනී චන්ද්‍රිකා මහත්මිය - කරාපිටිය - රු.1,000/- ♦ එස්.ඒ. කමලසීලි මහත්මිය - දොරණාගොඩ - රු.1,000/- ♦ අසංගා විජේවර්ධන මහත්මිය - ඉසිපතනාරාම මාවත, කොළඹ 05 - රු.1,000/- ♦ සමරා හේමා ගජනායක මහත්මිය - කහතුඩුව - රු.1,000/- ♦ චතුරිකා චමරි ගුණවර්ධන මෙනවිය - මීගොඩ - රු.1,000/- ♦ මාලිනි සිරිමාන්න මහත්මිය - රදාවාන - රු.1,000/- ♦ අනුරා ජයකොඩි මහත්මිය - වේබඩගල්ල - රු.1,000/- ♦ හේවා කැකුළාවල මහත්මිය - වැබඩ - රු.1,000/- ♦ සෝමා තිලකරත්න මහත්මිය - කිරිල්ලවිල - රු.1,000/- ♦ හිමාලිකා සඳරුවන් මහත්මිය - ගංගොඩවිල - රු.1,000/- ♦ අසෝකා බණ්ඩාර මහත්මිය - මොණරාගල - රු.1,000/- ♦ කේ.ඒ. ජයසිංහ මහතා - වලස්මුල්ල - රු.1,000/- ♦ නිසංසලා මෛත්‍රීපාල මහත්මිය - හෝමාගම - රු.1,000/- ♦ ඩිලානි ඩයස් මහත්මිය - නාවින්න - රු.1,000/- ♦ අශේන් මඩුගස්ගේ මහතා - අත්තිඩිය - රු.1,000/- ♦ සමන් දසනායක මහතා ඇතුළු පවුලේ සැම - පිළියන්දල - රු.1,000/- ♦ පී. රුවිනා දීපානි මහත්මිය ඇතුළු පවුලේ සැම - පිටකෝට්ටේ - රු.1,000/- ♦ ලතා ලියනගේ මහත්මිය සහ තිලකරත්න මහතා - රු.1,000/- ♦ ජිනපාලි ද සිල්වා සහ නාලින්දි උපේක්ෂා ද සිල්වා ☞

මහත්මීන් - නාවල - රු.1,000/- ♦ ලාල් වික්‍රමතන්ත්‍රී මහතා සහ චමිලා සුරංජිකා මහත්මිය මතුගම - රු.1,000/- ♦ චරිතා කුමාරි හෙට්ටිආරච්චි මහත්මිය - දොරණාගොඩ - රු.1,000/- ♦ මාතර නන්දසේන ගුණවර්ධන සහ ධර්මා ගුණවර්ධන මාපියන්ට පිං පිණිස - රු.1,000/- ♦ NSBM වැඩබිමේ සේවක පිරිස - හෝමගම - රු.1,000/- ♦ සෝමාවතී ජයකොඩි මහත්මිය - කිරිවත්තුඩුව - රු.1,000/- ♦ ෂවීන් ශ්‍රී ජයවර්ධන පුතා ඇතුළු පවුලේ සැම - මාලබේ - රු.1,000/- ♦ සිසිර කුමාර සමරදිවාකර මහතා - එල්ලක්කල - රු. 975/- ♦ රංජිත් වික්‍රමසිංහ මහතා, පද්මාවතී වික්‍රමසිංහ මහත්මිය, සුභාෂිනි දිසානායක මහත්මිය, පී.එම්. ගමගේ මහත්මිය - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා, උදාන ආරියවංශ මහතා - මහරගම, ඉසුරු සම්පත් මහතා - කළුතර, චන්දිම ගුණදාස මහතා - මොරටුව, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, කුමාරි ගොඩවිට මහත්මිය, - කුරුණෑගල, යමුනා උඩුමලගල මහත්මිය - පිළියන්දල, රසික තුශාන්ත මහතා - හෝමාගම, චතුර මල්වාන මහතා - කෑගල්ල, ශ්‍රී රංජිත්සිංහ මහතා - කැලණිය, තිස්ස අතාවුද මහතා - ජා ඇල, එම්.ඩී. තිලකරත්න මහතා - වැලිපැන්න, පී.ඩී. නයනි නිරෝශිකා මහත්මිය - මීගොඩ, යසස්වී වත්සලා සිරිවර්ධන දියණිය - රත්මලාන, සක්විති ජයවර්ධන මහතා - කොච්චිකඩේ, ඩී.කේ. විජේසූරිය මහතා - අළුබෝමුල්ල, මහේෂ් සුරංග සිරිමාන්න මහතා - රදාවාන, ඩබ්.එම්. චන්ද්‍රසිරි විජේරාජ මහතා - කරඳවැටිය, කොල්ලුපිටිය හේමාස් ආයතනයේ මැණික් කුරුප්පු, ගයාන් අගලවත්ත, මනෝජ් පෙරේරා යන මහත්වරුන්, එන්.ජී. ශ්‍යාමා සංජීවනී ගම්ලත් සහ එන්.ජී. සුරංජි තරංගා ගම්ලත් මහත්මීන් - රු. 7,920/- එකතු වූ සියලු මුදල් පරිත්‍යාග- රු. 210,635/- ♦ පළමු පිටපත් 10000 සඳහා මුද්‍රණ වියදම රු. 232,500/- ♦ අනෙකුත් වියදම් - 20,080/- ♦ සම්පූර්ණ වියදම - රු. 252,580/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

# සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,

**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ, අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව, දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net
www.aaryadharma.org විද්‍යුත් ලිපිනයඃ webmaster@helabodhupiyuma.net දු.අංඃ- 071 3046895

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්ඃ**

සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව. සැම මසකම 1 වන සහ 3 වන සෙනසුරාදා ආශිර්වාද පූජාව. 2 වන සහ 4 වන සෙනසුරාදා භාවනා වැඩසටහන්

ගමන් මාර්ගයඃ නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ පසුගිය කලාපයන් ඇතුලු සියලු කලාපයන් දැනට ලබාගත හැකි ස්ථානඃ

1. ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ
2. නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ.
3. නිව් පියුම් කොමිනිකේෂන් - පීරිස් මාවත, කළුබෝවිල - 0773742023
4. තුෂාරා ෆැෂන් - හයිලෙවල් පාර, හෝමාගම.
5. පිනැකල් නෙට් - ශානි ඉන්ස්ටිටියුට් - හයිලෙවල් පාර, ගොඩගම
6. තුෂාරි සාරි සෙන්ටර් - කොළඹ පාර, පාදුක්ක.
7. සුජය ෆාමසි - කටුබැද්ද හංදිය, මොරටුව.
8. ගේට්වේ අධ්‍යාපන ආයතනය - කලේගාන, ගාල්ල.
9. පෝලර් රීජන්ස් 402 සී, ගාලු පාර, පානදුර 038-2235369
10. නිව් මෙට්‍රෝ කම්පියුටර්ස් - කාලිදාස මාවත, මාතර
11. සරසවි පොත්හල - 330/ඒ, ගාලුපාර, අළුත්ගම - 0773474081
12. සහන ෆාමසි - මුණගම, හොරණ - 0712608776
13. ලසන් ට්‍රේඩ්සෙන්ටර් - 8, අලුත්ගොඩ පාර, තිස්සමහාරාමය - 0718523556
14. මෝලෙ කඩේ - මුදුන, වලස්මුල්ල.
15. නුගේගොඩ නාලන්දාරාම විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (ඉරිදා උදේ 9.00 සිට සවස 2.00 දක්වා පමණි.) (0773742023)
16. දෙහිවල කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (සෙනසුරාදා උදේ 8.30 සිට සවස 2.00 දක්වා පමණි) (දෙහිවල පොලිස් ස්ථානය අසල) - 0718059784, 0772055098

**තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා විමසන්න - ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - අංක 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ - 0777794676**

***ඉහත ආයතන හිමි පින්වතුන් මෙම සද් කාර්ය ඉටු කරනු ලබන්නේ කිසිදු වෙළඳ ලාභයකින් තොරව සාසනික කටයුත්තක් වශයෙන් පමණි.***

# කොතරම් තිබුණද වස්තුව කැමැත්ත නම් ඉටු නොකරත්...



කෑ ඇම ඇති කියන අරුතය දෙන කැමතී
නෑ ඉටු කරන්නේ වදනින් කළ පෙමැතී
බෑ ඇම නම් එසේ වන්නට එය විමතී
දෑ හැම එලෙසමයි මේ තුන් ලොව නමැතී

මහ ධන සිටුවරුන් හට නොඅඩුව තියෙන
ඉහටත් උඩින් ධන කඳ වුව ඇත බියෙන
පහසක් ලැබුව නම් ඉඳුරන් ගෙනි කයෙන
නහ ගත්තෙද එයින්මය මං යළි නොයෙන





රැක ගන්නට ධනය හදනා විට මනස
දුක බිය වෙහෙස මිස ඉන් වන්නද සනස
එකකින් යැපෙන අය හා දැන් වෙද වෙනස
මොකකින් වුව දුකය වැඩෙනා තුරු නැණස





තිබුණත් ගොඩක් වරකට එකකිය වින්දේ
එනමුත් කැමති දේ ඉටු කර නැත රැන්දේ
දුගියත් ඔය ටිකය මුළු දිවියෙම බැන්දේ
මැරුණත් මුලාවකටය දෙපිරිස ඇන්දේ





අදත් කෙල ධනය උරුමව ලොවෙහි ඇතී
නොදත් අය දහම හිටියත් දමති හතී
එදත් එලෙසමය හිටි උන් නොදුටු පැතී
හදත් හෙට දිනත් නෙක රීසි ලෙසට නැතී



ඉටු වී නම් කැමති ලෙස එකිනෙක පරයා
හිටු කිය කියා දුවනට වෙද ඇති නරයා
තුටු නැති හිතට සම්පත් ගෙන එද හරයා
සිටුවර වුනත් දුක සේ යයි වෙත ජරයා

මායාවක් නිසා අස්වාදය තැනෙන
නෑදෑයෙක් නෙවෙයි වස්තුව සැප ගෙනෙන
බාධාවක්ම වෙයි සිත බැඳි විට දැනෙන
සේයාවක් විලස එයි පසු පස යනෙන

සම්පත් වුවද දිවියට පමණට සෑහේ
නිම් නැති ලෙසට තිබුණොත් දෙයි දුක දාහේ
පෙම් කෙරුවොත් බැඳී දුගතියටම පෑහේ
දම් ඇස පහළ වන තෙක් කිව්වද නෑහේ

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන



# තුන් කල් මෙහෙමයි...

තුන් කල් කිව්වත් සම්මතයේ ඇති
දැන් මොහොතකදිම දුක් සැප දේ නිති
උන් හිතමය පසු වෙනසක් වී ගති
ඉන් කාලය නම් අනිකක් වී නැති

ආලය කරනට ගොඩ නැගි මිනුමකි
කාලය නම් නොම පවතින වැනුමකි
බාලය තුන් කල බැඳ නොම දිනුමකි
පෑ ළයකට නම් කාලය පෙනුමකි

හැම කලදිම විඳවීමක ඇති සොබ
පමණයි දුක් සැප මැද යන තැන ලැබ
අම ලෙස ගතහොත් සැපයට කර ලොබ
කැමතිව නොවුනත් අසුබය නැත සුබ

හවය වෙනස් වී ගියමුත් වින්දේ
සහය ගෙනයි හය ඉඳුරන් බැන්දේ
නොවිය ඒත් කිසි වෙනසක් රැන්දේ
එකය තුන් කලේ වෙහෙසක් ඇන්දේ

ඉපදුන අත්බැව දැන් ගෙවෙනා ලෙස
අපමණ අත්බැව් මුත් ගෙවුනා මිස
කොපමණ තව ලැබුවත් සොයනා රස
එපමණමයි තවෙකක් නොදෙනා තොස

නපුරක් වී නැත කාලය සත හට
විතරක් සිත බැහැගෙන ඇත නපුරට
අතරක් නැතිවම ගෙවෙනා සසරට
නොකරත් බිය පුහු දන නැණ නැති විට



පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී